# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# இலங்கை வயம்ப பல்கலைக்கழகம்

# WAYAMBA UNIVERSITY OF SRI LANKA

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

## ஆண்டறிக்கையும் கணக்கும்

## ANNUAL REPORT & ACCOUNTS

**2017**

# පටුන


| | පිටු අංකය |
|---|---|
| දැක්ම | 01 |
| මෙහෙවර | 01 |
| උපකුලපතිවරයාගේ සමාලෝචනය | 02 |
| 1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ඉලක්කයන් | 05 |
| 2 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය | 06 |
| 3 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් | 07 |
| 4 පාලක සභාවේ සාමාජිකයින් | 08 |
| 5 2017 වර්ෂයේ මානව සම්පත් හා ශිෂ්‍ය තොරතුරු | 09 |
| 6 2017 ශිෂ්‍ය තොරතුරු | 10 |
| 7 විදේශීය සිසුන් පිළිබඳ තොරතුරු | 11 |
| 8 2017 වර්ෂය තුළ දී අලුතින් ආරම්භ කකරන අද උපාදි පාඨමාලා පිළිබඳ තොරතුරු | 11 |
| 9 2017 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර | 12 |
| 10 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය | 13 |
| 11 2017.12.31 දිනට පීඨ සහ ඒකකයන්හි අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තොරතුරු | 16 |
| 12 2017.12.31 දිනට අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ තොරතුරු | 17 |
| 13 2017.12.31 දිනට විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු | 19 |
| 14 පුස්තකාලය | 21 |
| 15 2017 වර්ෂයේ උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම | 27 |
| 16 මහපොළ / ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍ය පිරිස 2017 | 29 |
| 17 පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු | 30 |
| 18 2017 වර්ෂය තුළ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | 32 |
| 19 ත්‍යාග ලැබීම් පිළිබඳ තොරතුරු | 35 |
| 20 ශාරීරික අධ්‍යාපන අංශය | 36 |
| 21 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | 46 |

22 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය  කුලියාපිටිය පරිශ්‍රය 57

23 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය 59

24 ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය 63

25 ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය 67

26 වෛද්‍ය මධ්‍යස්ථානය **68**

27 පුනරාවර්තන වියදම් විස්තර 69

28 ප්‍රාග්ධන වියදම් තොරතුරු 69

29 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්) 69

30 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්) 70

31 2017 - මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය 70

32 2014 - 2017 තුළ ඒක ශිෂ්‍ය පිරිවැය පීඨ මට්ටමින් -(මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ද ඇතුළුව) 70

33 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්) 71

34 2017 වර්ෂයේ යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ තොරතුරු 71

35 ව්‍යාපෘති වියදම් තොරතුරු (දේශීය අරමුදල්) 73

2017 ගිණුම් ප්‍රකාශය 74

# දැක්ම

*"ශ්‍රී ලංකා උසස් අධ්‍යාපනයේ*
*විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට*
*පත්කිරීම "*

# මෙහෙවර

"නව්‍යකරණ අධ්‍යාපන පාඨමාලා,
පර්යේෂණ සහ බාහිර ක්‍රියාකාරකම්
මඟින් ජාතික සංවර්ධනයට
ගැලපෙන පරිදි මානව සම්පත්
වැඩිදියුණු කිරීම"

# උපකුලපතිවරයාගේ සමාලෝචනය



## කෙටි හැඳින්වීම

2017 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පහත සඳහන් සුවිශේෂී සංවර්ධන කාර්යයන් හඳුනා ගත හැකි විය.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය දැනට පවත්නා ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍යපීඨය යටතේ ස්ථාපනය කෙරිණ. සියලු අධ්‍යයන වැඩසටහන් සැලසුම් කරන ලද පරිදි සමප්තියට පත්විය.

### <u>තාක්ෂණ පීඨය</u>




2017 වර්ෂයේ දී නිකුත් කරන ලද ගැසට් නිවේදනයට අනුව යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ, විද්‍යුත් තාක්ෂණ, ඉදිකිරීම් තාක්ෂණ හා නැනෝ විද්‍යා තාක්ෂණ යන අධ්‍යයනාංශ හතරෙන් සමන්විත නව තාක්ෂණ පීඨය ස්ථාපනය කෙරිණි.

2017 පෙබරවාරි මස දී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කුලපති තුමාගේ ප්‍රධානත්වයෙන් මුල්ගල තැබීමේ උත්සවය සමගම මෙම පීඨ ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඇරඹිණි.

කර්මාන්ත ක්ෂේත්‍රයේ උපදේශකයන් සමග පැවති රැස්වීම් මගින් ඉංජිනේරු තාක්ෂණ, විද්‍යුත් තාක්ෂණ හා යාන්ත්‍රික හා නිෂ්පාදන තක්ෂණ උපාධි පාඨමාලාවන්ගේ විෂය මාලාව සමාලෝචනය කරන ලදී.

ආරාධිත දේශන මගින් ක්ෂේත්‍ර චාරිකා සහ සංදර්ශන ආදිය මගින් සිසුන්ට විශ්වවිද්‍යාල පර්යේෂණ, දේශීය කර්මාන්ත සංවර්ධන ව්‍යවසායකත්ව ආදී අංශයන් හඳුන්වාදීමට පියවරගන්නා ලදී.

තව ද ශ්‍රී ලංකා ඉංජිනේරු සංගමය මගින් සංවිධානය කරන ලද “ජාතික ඉංජිනේරු සහ තාක්ෂණ ප්‍රදර්ශනය Techno Sri Lanka 2017” සඳහා ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනාංශයේ ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම සහභාගි විය. අධ්‍යයනාංශයේ අධ්‍යයන හා තාක්ෂණ කාර්යමණ්ඩලයේ මඟපෙන්වීම සහ සහයෝගය යටතේ උත්පාදන බලශක්ති ආදර්ශක ළමුන් විසින් නිර්මාණය කෙරිණි.

## වෛද්‍ය පීඨය




2017 අගෝස්තු මස දී ලබුයාය පරිශ්‍රයේ වෛද්‍ය පීඨ සංකීර්ණය ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරු අධීක්ෂණය යටතේ ඉදිකිරීම් සමාගම ඉදිකිරීම් කටයුතු ආරම්භ කළේය.

2018 වර්ෂය අවසානයේ දී සමාරම්භක ශිෂ්‍ය කණ්ඩායම පීඨයට ඇතුළත් කර ගැනීමට නියමිත බැවින් සහ ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායමට අදාළ අධ්‍යයන කටයුතු ආරම්භ කළ යුතු හෙයින් පීඨයට අවශ්‍ය දේශන ශාලා විද්‍යාගාර සහා කාර්යාල පරිශ්‍රයන් සඳහා අවශ්‍ය තාවකාලික ගොඩනැගිලි කුලියාපිටිය පරිශ්‍රය ආසන්නයෙන් කුලී පදනම මත සපයා ගැනීමට නියමිතය. එසේම කාය ව්‍යවච්ඡේද (Anatomy) ප්‍රායෝගික පරීක්ෂණ සඳහා විද්‍යාගාර පහසුකම් සඳහා විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් ගොඩනැගිල්ලක් තෝරාගනු ලැබ ඇත.

පළමු අවස්ථාවේදී Anatomy, Biochemistry, Physiology යන අධ්‍යයනාංශ තුන ස්ථාපනය කෙරේ.පුවත්පත් දැන්වීම් මගින් මෙම අධ්‍යයනාංශ තුන සඳහා අවශ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ බඳවාගැනීම් සඳහා කටයුතු ආරම්භ කරන ලදී.

තව ද අධ්‍යයන පාඨමාලා ආරම්භ කිරීමට ප්‍රථම අධ්‍යයනාංශ තුන සඳහා අවශ්‍ය ගෘහ උපකරණ, භාණ්ඩ, රසායන ද්‍රව්‍ය, වීදුරු භාණ්ඩ, සහ විවිධ උපකරණ හා උපාංග මිලදී ගැනීමට අවශ්‍ය ලේඛන සැකසීම් සහ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලදී.

**ජයග්‍රහණයන්**



- 2017 අගෝස්තු මස 30 වන දින විශ්වවිද්‍යාලයීය 13 වන උපාධි ප්‍රදානෝත්සවය පැවැත්විණි. මෙහි දී පශ්චාද් උපාධි 75ක් සහ ප්‍රථම උපාධි 785ක් ප්‍රදානය කරන ලදී.
- 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 1229ක් විශ්වවිද්‍යාලයට ඇතුලත් කරගන්නා ලදී. 2017 වර්ෂයේ දී අධ්‍යයන කාර්යමණ්ඩලයේ 14 දෙනෙක් ඔවුන්ගේ පශ්චාද් උපාධි අධ්‍යයනයන් සම්පූර්ණ කොට ඇත.



- විද්‍යාත්මක පර්යේෂණ සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලයේ දෙදෙනෙක් ජනාධිපති සම්මාන ලැබූහ. තාක්ෂණ, පීඨය වෛද්‍යපීඨය සහ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ III වන අදියර සඳහා ගොඩනැගිලි ව්‍යාපෘති තුනක් ආරම්භ කෙරිණි.අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් තබන ලද අතර ඒවා ජපානයේ Shibaura Institute of Technology සහ ශ්‍රී

ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය අතර අත්සන් කෙරිණි.

- IESL ආයතනයේ වයඹ අංශය Best Financial Chapter of IESL සඳහා වන "රජතමය ත්‍යාගය (Silver Award )" හිමිකරගන්නා ලදී.
- විශ්වවිද්‍යාලයේ පළමු උපකුලපතිව සිට අභාවප්‍රාප්ත මහාචාර්ය විජිත කුරුවිට මහතා නමින් නම් කරන ලද නව නේවාසිකාගාරය 2017 ජනවාරි මස 02 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.
- 2017 පෙබරවාරි මස 09 වෙනි දින ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අවසන් අදියර ගොඩනැගිල්ල වැඩ අවසන් කොට කුලපති තුමා අතින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.
- කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය මඟින් සංවිධානය කරන ලද Advance in AI Tea 2017 ජාත්‍යන්තර සමුළුව 2017 වර්ෂයේ අගෝස්තු මස 12 සහ 13 දිනයන්හි දී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පැවැත්විණ




- ව්‍යවහාරිකවිද්‍යා පීඨය සහ තාක්ෂණ පීඨය මඟින් සංවිධානය කරන ලද අ. පො. ස. උසස් පෙළ සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය "APPEX 2017" 2017 ඔක්තෝබර් මස 11 වන දින පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය ගුරුවරුන්ගේ සහ පාසැල් සිසුන්ගේ මහත් ප්‍රසාදයට පත් වූ අතර මෙය වාර්ෂිකව සංවිධානය කරන ලෙස ඉල්ලීමක් ද කරන ලදී.
- විශ්වවිද්‍යාල ගම්මාන (Township) වැඩසටහන සඳහා වන ණය යෝජනා ක්‍රමයේ ගිවිසුම මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ ලේකම් සහ සංවර්ධනය සඳහා වන සෞදි අරමුදලේ මෙහෙයුම් සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් අතර 2017 ඔක්තෝබර් මස 24 දින අත්සන් තබන ලදී.
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සහ ජල කළමනාකරණ ආයතනය සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සහයෝගයෙන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සංවිධානය කරන ලද ජෛව පොහොර (Bio Fertilizer) සහ ජෛව පළිබෝධනාශක (Bio Pesticides) පිළිබඳ ජාතික සමුළුව 2017 නොවැම්බර් මස 29 වන දින පවත්වන ලදී.

**අනාගත සැලසුම්**

1. පශ්චාද් උපාධි අධ්‍යයන හා ඉංජිනේරු පීඨ දෙක ඉදිකිරීම සඳහා යෝජනා සකස් කිරීමේ ක්‍රියාවලියේ විශ්වවිද්‍යාලය නිරත වී සිටී.

2. අනාගත පුළුල් කිරීම් සඳහා විශ්වවිද්‍යාලය ආසන්නයේ ඇති ඉඩම් අත්පත් කර ගැනිම පිළිබඳව සලකා බැලේ.

3. ව්‍යාපාර ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් (Business Incubation Center) කුලියාපිටිය පරිශ්‍රයේ ස්ථාපනය කිරීමට නියමිත අතර එමගින්, ව්‍යවහාරිකවිද්‍යා, ව්‍යාපාර අධ්‍යයන හා තාක්ෂණ පීඨයන්ගෙන් බිහිවන උපාධිධාරී ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර ප්‍රවේශයන් ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

4. තාක්ෂණ පීඨයේ දෙවන අදියර සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය (procument process ) ආරම්භ කෙරේ.

5. වැඩ අවසන් වීමට නියමිත වෛද්‍ය පීඨ සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් වනතෙක් ඒ වෙනුවට යොදාගනු ලබන තාවකාලික පරිශ්‍රයක දී 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා වෛද්‍ය පීඨයේ ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගනු ලැබේ.

6. ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුබසාධන පහසුකම් වර්ධනය කරලීම සඳහා නව කාර්යමණ්ඩල/ ශිෂ්‍ය නේවාසිකාගාරයන්හි සහ ආපනශාලාවන්හි ගෘහ උපකරණ හා අනෙකුත් පහසුකම් සම්පූර්ණ කෙරේ.

7. පීඨ සහ ඒකකයන් මගින් මෙහෙය වනු ලබන ස්වයං මූල්‍ය බාහිර පාඨමාලා (Free levying courses ) සම්බන්ධීකරණය සඳහා වෙනම ඒකකයක් ස්ථාපනය කෙරේ.

## 1. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ඉලක්කයන්

1.) උපාධි අපේක්ෂක පශ්චාද් උපාධිලාභී සහ වෘත්තික තලයන්හි ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව උපාධි පාඨමාලාවන්හි තත්වය වර්ධනය කිරීම.


2.) ලංකාවේ වර්ධනය වන උසස් අධ්‍යාපන ඉල්ලුම සපුරාලීම සඳහා ශිෂ්‍ය ප්‍රවේශය නැංවීම.

3.) සේවාදායකයන්ගේ නෛතිකමය අපේක්ෂාවන් ඉටුකරන සේවා නියුක්ති අගයෙන් උසස් වූ ව්‍යවසායකමය උපාධිධාරීන් බිහිකිරීම.

4.) පර්යේෂණ නව සොයාගැනීම් ශිෂ්‍යත්ව සහ බාහිර සමාජයට නැඹුරු වූ වානිජමය කටයුතු වලට උපකාරී වන පරිසරයක් ඇතිකිරීම.

5.) මානව වර්ගයාට සේවය කරමින් විශ්වවිද්‍යාල ප්‍රාජාවට කැපවීම.

# 02. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය



## 3. විශ්වවිද්‍යාලයේ නිලධාරීන් - 2017

**කුලපති**

මහාචාර්ය ටියුලි ද සිල්වා මහතා විද්‍යාපති, දර්ශනසූරි (මැන්චෙස්ටර් ) බී ෆාම් (එංගලන්තය ) විද්‍යාවේදී ( ලංකා ) එෆ්. අයි ( රසායන විද්‍යා ) ලංකා

**උපකුලපති**

මහාචාර්ය එස්. ජේ. බී.ඒ. ජයසේකර මහතා, - විද්‍යාවේදී *(කෘෂිවිද්‍යා) (පකිස්ථානය), දර්ශනසූරි (එක්සත් රාජධානිය) - 2017 මැයි මස 22 වන දින දක්වා*

*මහාචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා – විද්‍යාවේදී (කැලණිය), විද්‍යාපති, ඩී . එස්. සී. (ජපානය), 2017 මැයි මස 25 වන දින සිට*

**පීඨාධිපතිවරු**

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

ආචාර්ය ඩී සී අබේසිංහ මහතා — විද්‍යාවේදී, දර්ශනපති ( කෘෂි විද්‍යා ) පේරාදෙණිය, දර්ශනසූරි (චීනය )

**ව්‍යවහාරිකවිද්‍යා පීඨය**

මහාචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා, විද්‍යාවේදී *(කැලණිය), විද්‍යාපති, ඩී.එස්.සී. (ජපානය)*

*2017 මැයි මස 24 වන දින දක්වා*

*ආචාර්ය එල්. ඩී. ආර්. ඩී. පෙරේරා මහතා, 2017 මැයි මස 25 වන දින සිට*

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

ආචාර්ය ආර්. ඒ. රත්නසිරි මහතා — වානිජවේදී (*ශ්‍රී ජයවර්ධනපුර*) ශාස්ත්‍රපති, දර්ශනපති (*කොළඹ*) දර්ශනසූරි (*චීනය*)

**පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

ආචාර්ය එම්. එස්. ඩබ්ලිව්. ද සිල්වා මහතා, විද්‍යාවේදී *(රසායන විද්‍යාව) (පේරාදෙණිය), දර්ශනසූරි (ඇ.එ.ජ)*

**ලේඛකාධිකාරී**

ජී පියරත්න මහතා, — *ශාස්ත්‍රවේදී (පේරාදෙණිය), මානව සම්පත් කළමනාකරණ පශ්චාද් උපාධි ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය), මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)*

2017 නොවැම්බර් මස 01 දක්වා

*ඩබ්. ඒ. දොන් චිත්‍රානන්ද මහතා — ශස්ත්‍රවේදී (ගෞරව) පේරාදෙණිය, ශාස්ත්‍රපති (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය )*

2017 නොවැම්බර් මස 02 සිට

**මූල්‍යාධිකාරී**

ඩී. ඒ. යූ. ධර්මදාස මහතා, — විද්‍යාවේදී *(කැලණිය), වරලත් ගණකාධිකාරි, ඒ එස් සී එම් ඒ, එම්. බී. ඒ. (වයඹ විශ්වවිද්‍යාලය)*

**පුස්තකාලයාධිපති**

ඩබ්ලිව්. ජී. පී. ගම්ලත් මහතා, *ශාස්ත්‍රවේදී (පේරාදෙණිය), පුස්තකාල හා තොරතුරු විද්‍යාවේදී (ඉන්දියාව), පුස්තකාල හා තොරතුරු විද්‍යාපති (ඉන්දියාව)*

## 4. 2017 වර්ෂයේ පාලක සභා සාමාජිකයෝ

**උපකුලපති**

මහාචාර්ය එස්. ජේ. බී.ඒ. ජයසේකර මහතා - සභාපති *(2017 මැයි මස 22 වන දින දක්වා)*

*මහාචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා* - සභාපති *(2017 මැයි මස 25 වන දින සිට)*

**පීඨාධිපතිවරු**

| | |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | - ආචාර්ය ඩී සී අබේසිංහ මහතා |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | - ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා *(2017 මැයි මස 24 වන දින දක්වා)*<br>- *ආචාර්ය එල්. ඩී. ආර්. ඩී. පෙරේරා මහතා (2017 මැයි මස 25 වන දින සිට)* |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | - ආචාර්ය ආර් ඒ රත්නසිරි මහතා |
| පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය | - ආචාර්ය එම්. එස්. ඩබ්ලිව්. ද සිල්වා මහතා |
| තාක්ෂණ පීඨය | - *ආචාර්ය එල්. ඩී. ආර්. ඩී. පෙරේරා මහතා* (වැඩ බලන ) |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් පත් කරන ලද සාමාජිකයන්**

ආචාර්ය ඩබ්. ඒ. අබේසිංහ මහතා
මංගලා මාරසිංහ මහත්මිය
එම් එම් විමලසිරි මහතා
උපේන්ද්‍ර විජේසිංහ මහතා
වෛද්‍ය ඩබ් ආර් එන් ඒ වික්‍රමසිංහ මහතා
ඩබ් එච් එම් බී එච් විජේසිංහ මහතා
එච් එම් අබේසිංහ මහතා
නිමල් පෙරේරා මහතා

**සනාතන සභාව මඟින් පත් කරන ලද සාමාජිකයෝ**

ආචාර්ය ජී. ඒ. පි. චන්ද්‍රසේකර මහත්මිය
ආචාර්ය එච්. එම්. එස්. පී. හේරත් මහතා

**ලේඛකාධිකාරී (ලේකම්)**

ජී. පියරත්න මහතා - 2017.11.01 දින දක්වා
*ඩබ්. ඒ. දොන් චිත්‍රානන්ද මහතා - 2017.11.02 දින සිට*

## 5. 2017 මානව සම්පත් හා ශිෂ්‍ය තොරතුරු

| පීඨය | උපාධි පාඨමාලාව | මාධ්‍යය | සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව | සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩල | සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩල |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | විද්‍යාවේදී (කෘෂිකර්මය) | ඉංග්‍රීසි | 576 | 39 | 47 |
| | විද්‍යාවේදී ජෛව තාක්ෂණය | | 84 | | |
| ව්‍යවහාරිකවිද්‍යා | විද්‍යාවේදී (සාමාන්‍ය) | ඉංග්‍රීසි | 541 | 40 | 27 |
| | විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) | | | | |
| | විද්‍යාවේදී (විශේෂ)කර්මාන්ත කළමනාකරණ | | | | |
| | විද්‍යාවේදී (විශේෂ)ගණිතය හා සංඛ්‍යාතය | | | | |
| | විද්‍යාවේදී (විශේෂ)ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව | | | | |
| | විද්‍යාවේදී (විශේෂ) පරිගණක විද්‍යා | | | | |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී (විශේෂ) බැංකු හා මූල්‍ය | ඉංග්‍රීසි | 1732 | 35 | 16 |
| | විද්‍යාවේදී (විශේෂ) ව්‍යාපාර කළමනාකරණය | | | | |
| | විද්‍යාවේදී (විශේෂ) රක්ෂණ හා තක්සේරුකරණය | | | | |
| | විද්‍යාවේදී (විශේෂ) ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය | | | | |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | විද්‍යාවේදී (ආහාර විද්‍යාව හා පෝෂණය) | ඉංග්‍රීසි | 284 | 35 | 39 |
| | විද්‍යාවේදී (ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය) | | 113 | | |
| තාක්ෂණ පීඨය | විද්‍යාවේදි ඉංජිනේරු තාක්ෂණ (ඉදිකිරීම් තාක්ෂණ) | ඉංග්‍රීසි | 150 | 4 | 4 |
| | විද්‍යාවේදි ඉංජිනේරු තාක්ෂණ (විද්‍යුත් තාක්ෂණ) | | | | |
| | විද්‍යාවේදි ඉංජිනේරු තාක්ෂණ (යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ) | | | | |
| | විද්‍යාවේදි ඉංජිනේරු තාක්ෂණ (නැනෝ විද්‍යා තාක්ෂණ) | | | | |
| **එකතුව** | | | **3480** | **153** | **133** |

2017 වර්ෂයේ දී සියලු පීඨයන්හි සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 3480ක් වූ අතර සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 153ක් ද සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 133ක් ද විය. 2016 හා 2015 වර්ෂයන්හිදී සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 3038ක් ද සමස්ත අධ්‍යයන කාර්යමණ්ඩලය 150ක් ද සමස්ත අනධ්‍යයන කාර්යමණ්ඩලය 124ක් ද විය. 2015 හා 2016 වර්ෂයන්ට සාපේක්ෂව 2017 වර්ෂයේ දී සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනයක් සිදු වී ඇත. නව උපාධි පාඨමාලාවන් සඳහා කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයට සිසුන් 84 දෙනෙක් ද තාක්ෂණ පීඨයට සිසුන් 150ක් ද ඇතුළත් කරගන්නා ලදී (විද්‍යාවේදී ඉංජිනේරු තාක්ෂණ සහ විද්‍යාවේදී ජීව තාක්ෂණ උපාධි පාඨමාලා සඳහා)

# 6. 2016 ශිෂ්‍ය තොරතුරු

| පීඨය | උපාධි පාඨමාලාව | මාධ්‍යය | 2017 ශිෂ්‍ය කණ්ඩායම | පළමු වසර ශිෂ්‍ය සංඛ්‍යාව | දෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | තුන්වන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | අවසන් වසර ශිෂ්‍ය සංඛ්‍යාව | උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | විද්‍යාවේදී (කෘෂිකර්මය) | ඉංග්‍රීසි | 150 | 139 | 150 | 135 | 112 | 114 |
| | විද්‍යාවේදී (ජෛව තාක්ෂණය) | | 84 | 84 | - | - | - | |
| | පසුව ඇතුලත් කිරීම් | | - | 5 | 4 | 3 | - | |
| ව්‍යවහාරිකවිද්‍යා | විද්‍යාවේදී (සාමාන්‍ය) | ඉංග්‍රීසි | 200 | 159 | 146 | 159 | 77 | 32 |
| | විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) | | | | | | | 53 |
| | විද්‍යාවේදී (විශේෂ)කර්මාන්ත කළමනාකරණ | | | | | | | 6 |
| | විද්‍යාවේදී (විශේෂ)ගණිතය හා සංඛ්‍යාතය | | | | | | | 5 |
| | විද්‍යාවේදී (විශේෂ)ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව | | | | | | | 5 |
| | විද්‍යාවේදී (විශේෂ) පරිගණක විද්‍යාව | | | | | | | - |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී (විශේෂ) බැංකු හා මූල්‍ය | ඉංග්‍රීසි | 500 | 462 | 494 | 36 | 37 | 42 |
| | විද්‍යාවේදී (විශේෂ) ව්‍යාපාර කළමනාකරණය | | | | | 163 | 205 | 213 |
| | විද්‍යාවේදී (විශේෂ) රක්ෂණ හා තක්සේරුකරණය | | | | | 11 | 20 | 10 |
| | විද්‍යාවේදී (විශේෂ) ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය | | | | | 142 | 162 | 165 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | විද්‍යාවේදී (ආහාර විද්‍යාව හා පෝෂණය) | ඉංග්‍රීසි | 110 | 63 | 67 | 67 | 87 | 53 |
| | විද්‍යාවේදී (ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය) | | 60 | 28 | 22 | 27 | 36 | 39 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| තාක්ෂණ පීඨය | විද්‍යාවේදී තාක්ෂණ උපාධිය (ඉදිකිරීම් තාක්ෂණය/විද්‍යුත් තාක්ෂණය /යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණය/ නැනෝ තාක්ෂණය ) | ඉංග්‍රීසි | **150** | **150** | - | - | - | - |
| **එකතුව** | | | **1105** | **1089** | **871** | **768** | **764** | **737** |

## 7. විදේශීය සිසුන් පිළිබඳ තොරතුරු

| පීඨය | උපාධි පාඨමාලාව | අධ්‍යයන වර්ෂය | රට | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | විද්‍යාවේදී (කෘෂිකර්ම) | 2016/2017 | නැගෙනහිර නේපාලය | 01 |

## 8. 2017 වර්ෂය තුළ දී අලුතින් ආරම්භ කරන ලද උපාධි පාඨමාලා පිළිබඳ තොරතුරු

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | සහතික පත්‍ර/ ඩිප්ලෝමා | උපාධි | පශ්චාද් උපාධි ඩිප්ලෝමා | පරිපාලනවිද්‍යාපති | දර්ශනපති | දර්ශනසූරී |
|---|---|---|---|---|---|---|---|---|
| තාක්ෂණ පීඨය | විද්‍යාවේදී ඉංජිනේරු තාක්ෂණ (ඉදිකිරීම් තාක්ෂණ) | ඉංග්‍රිසි | - | √ | - | - | - | - |
| | විද්‍යාවේදී ඉංජිනේරු තාක්ෂණ (විද්‍යුත් තාක්ෂණ) | ඉංග්‍රිසි | - | √ | - | - | - | - |
| | විද්‍යාවේදී ඉංජිනේරු තාක්ෂණ (යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ ) | ඉංග්‍රිසි | - | √ | - | - | - | - |
| | විද්‍යාවේදී ඉංජිනේරු තාක්ෂණ (නැනෝ විද්‍යා තාක්ෂණ) | ඉංග්‍රිසි | - | √ | - | - | - | - |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | විද්‍යාවේදී (ජෛව තාක්ෂණය) | ඉංග්‍රිසි | - | √ | - | - | - | - |

## 9. 2017 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය මඟින් මෙහෙයවන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර

***1.) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය***

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාද් උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
- රක්‍ෂණය ඩිප්ලෝමා පාඨමාලාව
- රක්‍ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- පුද්ගල මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (AIA රක්‍ෂණ සමාගමේ කාර්යය මණ්ඩලය සඳහා මෙහෙය වන ලදී)

***2.) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය***

- විද්‍යාවේදී වැවිලි කළමනාකරණ(බාහිර උපාධි) පාඨමාලාව
- ආහාර ව්‍යාපාර අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

***3.) ව්‍යවහාරිකවිද්‍යා පීඨය***

- මෘදුකාංග භාවිතය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

***4.) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය***

- ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

***5.) ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය – මාකඳුර***

- E- Learning මගින් ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව

***6.) තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය***

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

***7.) තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය – මාකඳුර***

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- පරිගණක භාවිතය සහ කුසලතා සහතික පත්‍ර පාඨමාලාව

***8.) කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය***

- ඉගෙනුම් තාක්ෂණය සහ ක්‍රමවේදය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලාව
- කාර්යමණ්ඩල සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ඉගෙනුම් ක්‍රමවේදය සහ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

## 10. 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය


2017 වර්ෂයේ අගෝස්තු මස පවත්වන ලද ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේ දී සිසුන්ගෙන් ලබාගන්නා අද ප්‍රශ්නාවලිය මගින් පහත සඳහන් තොරතුරු රැස් කරගන්නා ලදී.

සමස්ත සේවා නියුක්ති ප්‍රතිශතය 66% ලෙස වාර්තා විය.

| ගණය | ප්‍රතිශතය |
|---|---|
| ස්ථිර රැකියා | 37% |
| තාවකාලික රැකියා | 28% |
| ස්වයං රැකියා | 01% |
| සේවා වියුක්ත | 34% |
| මුළු එකතුව | 100% |


### 10.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

| උපාධි පාඨමාලාව | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියා | සේවා වියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| කෘෂිව්‍යාපාර කළමනාකරණ | 03 | 09 | 00 | 13 | 25 |
| ජෛව තාක්ෂණ | 05 | 07 | 00 | 04 | 16 |
| උද්‍යාන විද්‍යා හා දර්ශනීය භූමි අලංකරණ | 07 | 12 | 01 | 16 | 36 |
| වැවිලි කළමනාකරණ | 11 | 10 | 00 | 15 | 36 |
| එකතුව | 26 | 38 | 01 | 04 | 113 |
| ප්‍රතිශතය | 23 | 34 | 01 | 42 | 100 |




## 10.2 ව්‍යවහාරිකවිද්‍යා පීඨය

| උපාධි පාඨමාලාව | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියා | සේවා වියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| විද්‍යාවේදී (සාමාන්‍ය) | 13 | 7 | 0 | 9 | 29 |
| විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) | 24 | 14 | 2 | 12 | 52 |
| විද්‍යාවේදී (විශේෂ)කර්මාන්ත කළමනාකරණ | 0 | 6 | 0 | 0 | 6 |
| විද්‍යාවේදී (විශේෂ)ගණිතය හා සංඛ්‍යානය | 1 | 4 | 0 | 0 | 5 |
| විද්‍යාවේදී (විශේෂ)ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව | 1 | 3 | 0 | 1 | 5 |
| එකතුව | 39 | 34 | 2 | 22 | 97 |
| ප්‍රතිශතය | 40 | 35 | 2 | 23 | 100 |





## 10.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| උපාධි පාඨමාලාව | ස්ථිර | තාවකාලික | සේවා වියුක්ත | එකතුව |
|---|---|---|---|---|
| විද්‍යාවේදී (විශේෂ) බැංකු හා මූල්‍ය | 25 | 4 | 13 | 42 |
| විද්‍යාවේදී (විශේෂ) ව්‍යාපාර කළමනාකරණය | 73 | 32 | 97 | 202 |
| විද්‍යාවේදී (විශේෂ) රක්ෂණ හා තක්සේරුකරණය | 8 | 0 | 2 | 10 |
| විද්‍යාවේදී (විශේෂ) ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය | 64 | 51 | 47 | 162 |
| එකතුව | 170 | 87 | 159 | 416 |
| ප්‍රතිශතය | 41 | 21 | 38 | 100 |




### 10.4 පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| අධ්‍යයනාංශය | ස්ථිර | තාවකාලික | සේවා වියුක්ත | එකතුව |
|---|---|---|---|---|
| ජල ජීවී වගා හා මත්ස්‍ය | 8 | 5 | 4 | 17 |
| ව්‍යවහාරික පෝෂණ | 2 | 12 | 8 | 22 |
| අහාරවිද්‍යා හා තාක්ෂණ | 14 | 13 | 4 | 31 |
| පශුසම්පත් හා පක්ෂි විද්‍යා | 7 | 9 | 47 | 19 |
| එකතුව | 31 | 39 | 19 | 89 |
| ප්‍රතිශතය | 35 | 44 | 21 | 100 |



## 11. 2017.12.31 දිනට පීඨ සහ ඒකකයන්හි අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තොරතුරු


| පීඨය | අධ්‍යයනාංශය | අනුමත සේවක සංඛ්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / ආධුනික කථිකාචාර්ය | සමස්ත තනතුරු සංඛ්‍යාව | පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | කෘෂිව්‍යාපාර කළමනාකරණ | **10** | - | 03 | - | 03 | 03 | **09** | **01** |
| | ජෛව තාක්ෂණ | **10** | - | 01 | 01 | 03 | 03 | **08** | **02** |
| | ජෛව පද්ධති තාක්ෂණය | **04** | - | - | - | 01 | 01 | **02** | **02** |
| | උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | **12** | 01 | - | - | 05 | 04 | **10** | **2** |
| | වැවිලි කළමනාකරණ | **12** | - | 01 | - | 05 | 04 | **10** | **2** |
| ව්‍යවහාරිකවිද්‍යා | පරිගණක හා තොරතුරු පද්ධති | **10** | - | - | - | 07 | 01 | **08** | **02** |
| | ඉලෙක්ට්‍රොනික විද්‍යා | **10** | 01 | 02 | - | 05 | 01 | **09** | **01** |
| | කර්මාන්ත කළමනාකරණ | **15** | - | - | - | 09 | 01 | **10** | **05** |
| | ගණිතමයවිද්‍යා | **16** | - | - | 01 | 06 | 06 | **13** | **03** |
| තාක්ෂණ | ඉංජිනේරු තාක්ෂණ | **04** | | - | - | 01 | 02 | **03** | **01** |
| | නැනෝ විද්‍යා තාක්ෂණ | **05** | - | - | - | 01 | - | **01** | **04** |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | පීඨාධිපති කාර්යාලය | **01** | - | - | - | - | 01 | **01** | **0** |
| | ගණකාධිකරණ හා ව්‍යාපාර මූල්‍ය | **15** | - | - | - | 05 | 05 | **10** | **05** |
| | බැංකු හා මූල්‍ය | **10** | - | - | - | 04 | 04 | **08** | **02** |
| | ව්‍යාපාර කළමනාකරණ | **15** | - | - | - | 06 | 04 | **10** | **05** |
| | රක්ෂණ හා තක්සේරුකරණ | **09** | - | - | - | 03 | 03 | **06** | **03** |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ වෛද්‍ය | පීඨාධිපති කාර්යාලය | **03** | - | - | - | 01 | 01 | **02** | **01** |
| | ව්‍යවහාරික පෝෂණ | **11** | - | - | - | 05 | 04 | **09** | **02** |
| | ජල ජීවී වගා හා මත්ස්‍ය | **9** | - | - | - | 05 | 02 | **07** | **02** |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ | **13** | - | 01 | - | 08 | 01 | **10** | **03** |
| | පශුසම්පත් හා පක්ෂි විද්‍යා | **09** | - | - | - | 05 | 02 | **07** | **02** |
| වෛද්‍ය | පීඨාධිපති කාර්යාලය | **02** | - | - | - | - | - | | **02** |
| | කාය ව්‍යවච්ඡේද | **04** | | | | | | | **04** |
| | කායික විද්‍යා | **04** | | | | | | | **04** |
| | ජෛව රසායන විද්‍යා | **04** | | | | | | | **04** |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය | **04** | - | - | - | 03 | 01 | **04** | **00** |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – මාකඳුර | **03** | - | - | - | - | - | **-** | **03** |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය | **01** | - | - | - | - | 01 | **01** | **00** |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – මාකඳුර | **02** | - | - | - | 01 | 01 | **02** | **00** |
| **එකතුව** | | **227** | **02** | **08** | **02** | **92** | **56** | **160** | **67** |

## **12.** 2017.12.31 දිනට අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ තොරතුරු


| තනතුර | අනුමත තනතුරු ගණන | වර්තමාන තනතුරු ගණන | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| පද්ධති ඉංජිනේරු | 02 | 02 | 00 |
| පරිගණක තාක්ෂණ උපදේශක | 08 | 04 | 04 |
| ඉංග්‍රීසි පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක | - | 01 | - |
| උපදේශක (පරිගණක තාක්ෂණ) | 01 | - | 01 |
| ශාරීරික අධ්‍යාපන උපදේශක | 05 | 04 | 01 |
| වෘත්තීය මාර්ගෝපදේශක | - | 01 | - |
| වෘත්තීය මාර්ගෝපදේශක උපදේශක | 01 | - | - |
| පද්ධති විශ්ලේෂක | 01 | 01 | 00 |
| සහකාර පද්ධති කළමනාකරු | 02 | 00 | 02 |
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරි/ වෛද්‍ය නිලධාරි | 02 | 00 | 02 |
| එකතුව | 22 | 13 | 10 |

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලය 551 කගෙන් සමන්විතව මෙම වර්ෂයේ දී සිය ඉලක්කයන් ලඟා කර ගැනීම සඳහා කටයුතු කළහ. එයින් 30% ක් අධ්‍යයන කාර්ය මණ්ඩලය ද 02% ක් අධ්‍යයන සහයක කාර්යමණ්ඩලය ද 06% ක් විධායක නිලධාරීන් ද 62% ක් අනධ්‍යයන කාර්යමණ්ඩලය ද වශයෙන් සමස්ත කාර්ය මණ්ඩලය සමන්විත විය.




*** පුස්තකාල අධ්‍යයන කාර්ය මණ්ඩලය ද මීට ඇතුලත්ය**


අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ව්‍යාප්තිය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය/ ආධුනික කථිකාචාර්ය තනතුරු පිළිවෙළින් 1%, 5% 1% 58% 35% යන ප්‍රතිශතයන්ගෙන් සමන්විත විය.




**2017 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය**

2015 - 2017 කාලය අතර තුර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය පිළිබඳ සන්සන්දනයකි

| **කාර්ය මණ්ඩලය** | **2015** | **2016** | **2017** |
|---|---|---|---|
| අධ්‍යයන | 151 | 158 | 160 |
| අධ්‍යයන (පුස්තකාලයීය) | 05 | 05 | 05 |
| අධ්‍යයන සහායක | 11 | 13 | 13 |
| විධායක | 24 | 32 | 32 |
| අනධ්‍යයන | 324 | 338 | 34 |
| **එකතුව** | **515** | **546** | **551** |




## 13. 2017.12.31 දිනට විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන කාර්යමණ්ඩල තොරතුරු

| පීඨය/අංශය | විධායක නිලධාරී කාර්ය මණ්ඩලය | කාර්මික නිලධාරීන් | ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක |
|---|---|---|---|---|
| උපකුලපති කාර්යාලය | 1 | - | 1 | 1 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 2 | - | 1 | 2 |
| අධ්‍යයන ආයතන අංශය | 1 | - | 5 | 1 |
| අනධ්‍යයන ආයතන අංශය | 2 | - | 4 | 1 |
| සාමාන්‍ය පාලන අංශය | 1 | - | 5 | 5 |
| මූලධන අංශය | 1 | - | 2 | 1 |
| අධ්‍යයන අංශය | 1 | - | 2 | 1 |
| පොදු සේවා ඒකකය - මාකඳුර පරිශ්‍රය | 2 | - | 3 | 3 |
| අභ්‍යන්තර විගණන අංශය | - | - | 3 | 1 |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | - | - | 1 | - |
| බාහිර සම්බන්ධතා අංශය | - | - | 1 | - |
| මූල්‍ය අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 5 | - | 11 | 1 |
| මූල්‍ය අංශය - මාකඳුර පරිශ්‍රය | 2 | - | 4 | 1 |
| සැපයුම් අංශය | 1 | - | 5 | 2 |
| ආරක්ෂක සේවා | - | - | 3 | 3 |
| ප්‍රවාහන සේවා | - | - | - | 17 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 1 | 6 | 9 | 11 |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2 | 8 | 11 | 26 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 1 | 1 | 8 | 6 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 2 | 9 | 10 | 18 |
| තාක්ෂණ පීඨය | - | 1 | - | 3 |
| වෛද්‍ය පීඨය | 01 | - | - | - |
| විභාග අංශය | 1 | - | 6 | 2 |
| පුස්තකාලය - කුලියාපිටිය පරිශ්‍රය | 1 | - | 7 | 10 |
| පුස්තකාලය - මාකඳුර පරිශ්‍රය | - | - | 5 | 4 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය | - | 2 | 2 | 2 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය | - | 1 | 1 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 1 | 1 |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය | - | - | 1 | 1 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය | - | 3 | 1 | 1 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය | - | 3 | - | 1 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 1 | - | 1 | 7 |
| කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | - | - | 1 | - |
| ශිෂ්‍ය හා සේවක සුබසාධක අංශය | 1 | - | 5 | 2 |
| නඩත්තු අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 1 | 5 | 5 | 28 |
| නඩත්තු අංශය - මාකඳුර පරිශ්‍රය | - | 1 | 1 | 9 |
| භූමි අලංකරණ ඒකකය | 1 | 1 | - | - |
| නේවාසිකාගාර - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 3 | 1 |
| නේවාසිකාගාර - මාකඳුර පරිශ්‍රය | - | - | 2 | 2 |
| **එකතුව** | **32** | **41** | **131** | **169** |

අනධ්‍යයන කාර්යය මණ්ඩල ව්‍යාප්තිය (විධායක නිලධාරීන් හැර) 2017 වර්ෂයේ දී 341ක් විය. ඊට තාක්ෂණ කාර්ය මණ්ඩලය, ලිපිකාර හා සමාන්තර සේවා කාර්ය මණ්ඩලය, සහ සුළු සේවක කාර්ය මණ්ඩලය පිළිවෙළින් 12% ක්ද, 38% ක්ද, 50% ක් ද පරිදි විය.



# 14. පුස්තකාලය

### 14.1 පසුබිම් තොරතුරු

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය පුස්තකාලය පුස්තකාල දෙකකින් සමන්විතය. ඉන් එකක් කුලියාපිටිය පරිශ්‍රයේ පිහිටා ඇති අතර එමගින් ව්‍යවහාරිකවිද්‍යා පීඨය සහ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය යන පීඨයන් දෙකට සේවය සපයන අතර අනෙක් පුස්තකාලය මාකඳුර පරිශ්‍රයේ පිහිටා ඇති අතර එමගින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයට හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය යන පීඨවලට සේවය සපයයි.

### 14.2 ගොඩනැගිලි

### 14.2.1 *කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය -*

පැරණි පරිපාලන ගොඩනැගිල්ලේ පළමු මහලෙහි කුලියාපිටිය පුස්තකාලය ස්ථාපිතව ඇත. පරිපාලන කාර්යාලය නව ගොඩනැගිල්ලට ගෙන යාමෙන් පසු සමස්ත පළමු මහල පුරාම පුස්තකාලය ව්‍යාප්ත කෙරිණි. ඒ අනුව වර්ග අඩි 7326කින් සමන්විත මුළු පළමු මහලෙහිම පුස්තකාලය ව්‍යාප්තව පවතී. මෙහි සිසුන් 91දෙනෙකුට අසුන් ගැනීමේ පහසුව ඇත.

### 14.2.2 *මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය*

මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය ප්‍රධාන මාර්ගයට ආසන්නව, පීඨ දෙක අතර මැද පිහිටා ඇත. මෙම පුස්තකාලය නව දෙමහල් ගොඩනැගිල්ලකින් සමන්විත වන අතර මෙය වර්ග අඩි 7200කින් සම්න්විත වේ. සිසුන් 125කට අසුන් ගැනීමේ හැකියාව ඇත.

### 14.3 නව ජයග්‍රහණ

- කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රයන්හි පුස්තකාල සමීක්ෂණ කටයුතු සාර්ථකව සිදු කෙරිණි.

### 14.4 කාර්ය මණ්ඩලය

### 14.4.1 ස්ථාන මාරුවීම්

- පුස්තකාල තොරතුරු සහයක II ශ්‍රේණියේ සේවය කළ ජේ ඒ එස් ජයසිංහ මහතා 2017 සැප්තැම්බර් මස 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලයට ස්ථාන මාරු ලැබීය.

### 14.4.2 උසස්වීම්

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී II ශ්‍රේණිය තනතුරේ සේවය කළ ඩබ් පුන්‍යවර්ධන මහතා ජ්‍යෙෂ්ඨ සහකාර පුතකාලායාධිකාරී I ශ්‍රේණියට උසස්වීම් ලැබීය
- මාණ්ඩලික සහකාර ජේ. ඒ. ඩී. වීරවර්ධන මහතා 2016 ජූලි අස 15 දින සිට ක්‍රියාත්මකවන පරිදි ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර තනතුරට උසස්වීම් ලැබීය
- පුතකාල තොරතුරු සහකාර තනතුරේ සේවය කළ එච්. ඒ. එන්. විජේකෝන් මහත්මිය 2016 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාණ්ඩලික සහකාර තනතුරට පත් වූවාය

### 14.5 පුස්තකාලය හඳුන්වාදීම

පහත සඳහන් පරිදි 2017 වර්ෂය තුළ බඳවා ගන්නා ලද නවක සිසුන් සඳහා පුස්තකාලය හඳුන්වා දීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කෙරිණි.

- කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය 2017 ජනවාරි 20, 26, දින සහ පෙබරවාරි 02 වන දින
- ව්‍යවහාරිකවිද්‍යා පීඨය - 2017 ජනවාරි 04, 05, සහ 06 දින
- ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය - 2017 ජනවාරි 09, 16, 17, 18, 20, 25, 26 සහ 30 දිනයන් සහ පෙබරවාරි 03, දින කුලියාපිටිය පරිශ්‍රයේ ප්‍රධාන පුස්තකාලයේ දී
- පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය - 2017 ජනවාරි මස 03 වන දින

### 14.6 පර්යේෂණ හා ප්‍රකාශන

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ්. එම්. තුසිතා කුමාරී මිය "තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් පුස්තකාල හා තොරතුරු සේවා පහසුකම් භාවිතයේ ප්‍රවණතාව ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය පදනම් කොටගත් අධ්‍යයනයක්" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ශ්‍රී ලංකා පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ සඟරාවේ 20/1 වෙළුමේ 2017 ජනවාරි කලාපයේ 73 – 84 පිටු අංකවල ප්‍රකාශයට පත් කළාය
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ්. එම්. තුසිතා කුමාරී මිය "පීඨ සමාජිකයින්ගේ ඉලෙක්ට්‍රොනික තොරතුරු පද්ධතියක් භාවිතය පිළිබඳ පදනම් වන සාධක" යන මැයෙන් යුතු පර්යේෂණ පත්‍රිකාවක් ඉංදියාවේ භාරතිදාසන් විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශයේ 2017 පෙබරවාරි 24 හා 25 දිනවල පැවති දැනුම් සම්පත් හා පුස්තකාල විද්‍යා ජාත්‍යන්තර සමුළුවේ දී ඉදිරිපත් කළාය
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ්. එම්. තුසිතා කුමාරී මිය සහ සහකාර පුස්තකාලයාධිකාරී කේ. ජී. අයි. ජයවර්ධන මහතා "Library WOW Planning orientation for Marketing Academic Libraries" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශයේ 2017 ඔක්තෝබර් 26 - 27 දිනයන්හී පැවති පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ජාත්‍යන්තර සමුළුවේ දී ඉදිරිපත් කළහ.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ්. පුන්‍යවර්ධන මහතා "ශ්‍රී ලංකාවේ පුස්තකාල සහකාර වරුන් අතර සේවා තෘප්තිය පිළිබඳ අධීක්ෂණාත්මක් හැසිරීමේ බලපෑම" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 6 වන ජාත්‍යන්තර සමුළුවේ දී ඉදිරිපත් කළේය.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩී. ජී. ඒ. එස්. මල්කාන්ති මිය විසින් "පුස්තකාල චක්‍රීකරණ ව්‍යුහය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල පිළිබඳ විශේෂ අධ්‍යයනයක්" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ සඟරාවේ පළ කෙරිණ.

### 14.7 සහභාගි වූ වැඩමුළු

- සහකාර ලේඛකාධිකාරී - පුස්තකාල සේවා එස්. පතිරාජ මහත්මිය 2017 ජනවාරිමාස 06 - 08 දිනයන්හි විල්පතුවෙහි පැවති බාහිර පුහුණු වැඩසටහනකට සහභාගි වූවාය.
- පුස්තකාලයාධිපති ඩබ්. ජී. පී. ගම්ලත් මහතා පශ්චාද් උපාධි කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද ඉන්දුනීසියාවේ ගජමදා විශ්වවිද්‍යාලයේ පැවති කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුවක් සඳහා 2017 ජනවාරි මස 22 සිට 29 දක්වා කාලය තුළ සහභාගි විය.
- පුස්තකාලයාධිපති ඩබ්. ජී. පී. ගම්ලත් මහතා 2017 ජනවාරි මස 14 සහ් 15 යන දිනයන්හි හලාවත අඹකඳවිල කැරොලිනා බීච් හෝටලයේ පැවති තත්ව පරීක්ෂණයට අදාළ කටයුතු සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපාය මාර්ග සැලැස්ම යාවත්කාලීන කිරීම පිළිබඳ වැඩමුළුවට සහභාගි විය.

- පුස්තකාල තොරතුරු සහායක ඩබ්. එම්. ඩී. එස්. දයානන්ද මිය, වයි. ඩබ්. ඒ. ජී. යාපා මයා, සහ ජී. එම්. සී. ඊ. පතිරාජ මිය යන අය වයඹ විශ්වවිද්‍යාලයේ සේවක සංවර්ධන මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද “SHORT COURSE ON WEB DESIGN” වැඩ සටහන සඳහා 2017.02.23 සිට සහභාගි වූහ.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ් එම් තුසිතා කුමාරි මිය සහ ඩී. ජී. ඒ. එස්. මල්කාන්ති මිය 2017 පෙබරවාරි මස 24 සහ 25 දිනවල ඉංදියාවේ ට්‍රිචි හි පිහිටි භාරතිදාසන් විශ්වවිද්‍යාලයේ පැවති “INTERNATIONAL CONFERENCE ON KNOWLEDGE RESOURSE AND LIBRARY TECHNOLOGIES” සමුළුව සඳහා සහභාගි වූහ.
- සහකාර ලේඛකාධිකාරී එස් පතිරාජ මහත්මිය 2017 මාර්තු 19 සිට 26 දින දක්වා තායිලන්තයේ බැංකොක්හි කැසට්සාර්ට් විශ්වවිද්‍යාලයේ පැවති කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව සඳහා සහභාගි විය.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩී. ජී. ඒ. එස්. මල්කාන්ති මිය 2017 මාර්තු මස 23 සහ 24 දිනයන්හි රුහුණු විශ්වවිද්‍යාලයෙ පැවති “WORKSHOP FOR LIBRARY SUPPORTIVE STAFF IN THE UNIVERSITY SYSTEM IN SRI LANKA” වැඩමුළුවේ සම්පත්දායිකාව ලෙස සහභාගි වූවාය.
- මාකඳුර පරිශ්‍රයේ පුස්තකාල සේවක ඩී. ජී. එම්. දසනායක මහතා 2017 මාර්තු මස 23 සහ 24 දිනයන්හි රුහුණු විශ්වවිද්‍යාලයේ පැවති “ LIBRARY SUPPORTIVE STAFF IN IN THE UNIVERSITY SYSTEM IN SRI LANKA “ වැඩමුළුව සඳහා සහභාගි විය.
- මාකඳුර පරිශ්‍රයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ් පුණ්‍යවර්ධන මහතා 2017 මැයි මස 03 සිට 05 දින තෙක් මහනුවර ග්‍රෑන්ඩ් කැන්ඩියන් හෝටලයේ පැවති සබරගමුව විශ්වවිද්‍යාලයේ 6 වන ජාත්‍යන්තර සමුළුව සඳහා සහභාගි විය.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩී ජී ඒ එස් මල්කාන්ති මිය2017 ජූනි මස 01 වන දින පැවති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ (NACULA 2017) සමුළුව සඳහා සහභාගි විය.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩී. ජී. ඒ. එස්. මල්කාන්ති මිය කොළඹ 07 UPA මධ්‍යස්ථානයේ පැවති “IMPLEMENTATION OF THE SRI LANKA LIBRARY ASSOCIATION STRATAGIC PLAN (2016-2022)” වැඩමුළුව සඳහා සහභාගි වූවාය.
- සහකාර ලේඛකාධිකාරී(පුස්තකාල සේවා) එස් පතිරාජ මහත්මිය ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් සංවිධානය කරන ලද “SOCIAL IMPACT OF LIBRARIANSHIP SCHOLARSHIP TOWARDS SUSTAINABLE DEVELOPMENT GOALS” වැඩමුළුව සඳහා 2017 ජූනි මස 29 වෙනි දින සහභාගි වූවාය.
- සහකාර ලේඛකාධිකාරී(පුස්තකාල සේවා) එස් පතිරාජ මහත්මිය 2017 අගෝස්තු මස 21 දින සහකාර පුස්තකාලයාධිකාරි කේ ජී අයි ජයවර්ධන මයා සහ තාවකාලික පද්ධති විශ්ලේෂක් යූ ඩබ් ඒ සී සී උඩබේසිංහ මයා විසි මෙහෙය වන ලද “පුස්තකාල ස්වයංක්‍රීයකරණය” වැඩමුළුව සඳහා සහභාගි විය.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ් පුන්‍යවර්ධන මහතා 2017 ඔක්තෝබර් 12 දින කොළඹ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිපිළිබඳ ජාතික කවුන්සිලය මගින් මෙහෙය වන ලද “Seminar on User Services in AGRINET” සඳහා සහභාගි විය.
- සහකාර ලේඛකාධිකාරී(පුස්තකාල සේවා) එස් පතිරාජ මහත්මිය උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානයමගින් මෙහෙය වන ලද “Business and Adminstrative Staff of University System” වැඅඩමුළුව සඳහා 2017 ඔක්තෝබර් 12 සහ 13 දිනයන්හි සහභාගි විය.
- මාකඳුර පරිශ්‍රයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ් පුන්‍යවර්ධන මහතා වයඹ විශ්වවිද්‍යාලයීය පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ණිෂබඑැරබ්කැ ්කසඑහ ි ්ර්බජැ කැකක 2017 ඔක්තෝබර් මස 25 දින සංවිධානයකරන ලද ණිඑසබස උදරනියදච දබ ඡරදටර්පපැ ඍැඩසැඅ වැඩමුළුව සඳහා සහභාගි විය.

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ් එම් තුසිතා කුමාරි මිය සහ සහකාර පුස්තකාලයාධිකාරී කේ ජී යි ජයවර්ධන මයා " Library WOW Planning Orientation for Making Academic Librarie" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා 2017 ඔක්තෝබර් 26 හා 27 දෙදින සමුළුවකට සහභාගි විය.
- 2017 නොවැම්බර් 08 දින ඉංදියානු ජාතිකයකු විසින් " Gale Software" පිළිබඳව හඳුන්වා හීමේ වැඅඩසටහනක් මෙහෙය වනු ලැබූ අතර ඒ සඳහා පුස්තකාල සහකාරවරුන් වන ජේ ඒ එස් ජයසිංහ මයා, සහ දිලිණි දයානන්ද මිය ය නඅය සහභාගි වූහ.
- ෂහකාර පුස්තකාලයාධිකාරී කේ ජී යි ජයවර්ධණ මහතා " Challenges and Changes of Libraries in the Digital Age" වැඩමුළුව සඳහා 2017 නොවැම්බර් 11 දින සහභාගි විය. මෙය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සංවිධානය කරන ලදී.
- ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර එස් පී ජේ මුතුගලගේ මිය සහ පී එම් සී ආර් පතිරාජ මහත්මිය "Enrollment for Microsoft Excel Advanced Workshop" වැඩමුලුව සඳහා 2017 නොවැම්බර් මස 23 සහ 24 දිනයන්හී සහභාගි වූහ.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ් එම් තුසිතා කුමාරි මිය " Abstract and Article Reviewing for University Libraries"වැඩමුළුව සඳහා 2017 නොවැම්බර් මස 30 දින සහභාගි විය.
- පුස්තකාලයාධිපති ඩබ් ජී පී ගම්ලත් මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ් පුන්‍යවර්ධන මහතා, සහ සහකාර පුස්තකාලයාධිකාරී කේ ජී අයි ජයවර්ධණ මහතා "Awareness Seminar for Revised Circular of Lost Library Materials" යන වැඩමුළුව සඳහා සහභාගි වූහ. මෙය 2017 දෙසැම්බර් මස 19 දින පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සංවිධානය කරන ලදී.

## 14.8 ලියාපදිංචි පාඨකයින්

**අ) කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය**

| පාඨකයින් | 2017.12.31 දිනට පාඨක සංඛ්‍යාව | 2017 වර්ෂයේ ලියාපදිංචි වූ පාඨක සංඛ්‍යාව |
|---|---|---|
| සිසුන් | 2383 | 673 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය<br>ස්ථිර<br>තාවකාලික | <br>90<br>35 | <br>07<br>26 |
| විධායක නිලධාරී කාර්ය මණ්ඩලය | 22 | 03 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 165 | 10 |

ආ) මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය

| පාඨකයින් | 2017.12.31 දිනට පාඨක සංඛ්‍යාව | 2017 වර්ෂයේ ලියාපදිංචි වූ පාඨක සංඛ්‍යාව |
|---|---|---|
| සිසුන් | 915 | 254 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | | |
| ස්ථිර | 76 | 05 |
| තාවකාලික | 88 | 43 |
| විධායක නිලධාරී කාර්ය මණ්ඩලය | 04 | 01 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 82 | 08 |

**14.9 පොත් සහ වාර සඟරා සඳහා වැය ශීර්ෂය**

*පුස්තකාලයීය* ප්‍රතිපාදන :

පොත් සහ වාර සඟරා - රු. 5, 000, 000.00 (මිලියන 5) - ප්‍රධාන පුස්තකාලය

*වැය:*

**අ) කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය**

| පොත් | වාර සඟරා |
|---|---|
| රු. 3,357,315.53 | රු. 10,630.00 |

**සමස්ත වියදම - රු. 3,367,945.53**

**ආ) මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය**

| පොත් | වාර සඟරා |
|---|---|
| රු. 2,631,800.50 | රු. 14,300.00 |

**සමස්ත වියදම - රු. 2,646,100.50**

**14.10 පොත් තොග**

2017.12.31 දිනට පරිග්‍රහණ ලේඛනයට අනුව සමස්ත පොත් තොගය.

**කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය** - 39446
2016 වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග - 206

**මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය** - 19515
2016 වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග - 482

**14.11** ආදායම

<u>**පුස්තකාල දඩ**</u>

අ) **කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය**

| | |
|---|---|
| නැති වූ පොත් සඳහා අයකර ගැනීම | - රු. 17,031.00 |
| පුස්තකාල කාඩ්පත් අනුපිටපත් නිකුතුව | - රු. 1350.00 |
| නැති වූ පුස්තකාල කාඩ්පත් සඳහා | - රු. 6950.00 |
| ප්‍රමාද ගාස්තු | - රු. 61,410.00 |
| එකතුව | - රු. 86,741.00 |

**ඡායා පිටපත් සේවාව**

ආ) **කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය**

| | |
|---|---|
| 2017.12.31 දිනට ආදායම | - රු. 218,600.00 |

**පරිගණක මුද්‍රණ සේවාව**

| | |
|---|---|
| 2017.12.31 දිනට ආදායම | - රු. 1961.00 |

ඇ ) **මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය**

| | |
|---|---|
| නැති වූ පොත් සඳහා අයකර ගැනීම | - රු. 465.00 |
| පුස්තකාල කාඩ්පත් අනුපිටපත් නිකුතුව | - රු. 75.00 |
| ප්‍රමාද ගාස්තු | - රු. 1405.00 |
| එකතුව | - රු. 1945.00 |

**ඡායා පිටපත් සේවාව**

ආ) මාකඳුර **පරිශ්‍රයේ පුස්තකාලය**

| | |
|---|---|
| 2017.12.31 දිනට ආදායම | - රු. 12,250.00 |
| පරිශ්‍ර දෙකෙහිම සමස්ත ආදායම | - රු. 234,756.00 |

**පොත් බැඳීම් අංශයේ සංඛ්‍යා ලේඛන**

බඳින ලද පොත් සංඛ්‍යාව - 218

**14.12** 2017.12.31 දිනට පුස්තකාල කාර්ය මණ්ඩලය

(අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන මණ්ඩලය )

| පුස්තකාලය | අනුමත කාර්ය මණ්ඩලය | පුස්තකාලයාධිපති | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | සහකාර පුස්තකාලයාධිකාරී | සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) | පද්ධති විශ්ලේෂක | එකතුව | පුරප්පාඩු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය | 6 | 1 | 1 | 1 | 1 | 1 | **5** | **1** |
| මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය | 2 | - | 2 | - | - | - | **2** | **0** |

## **15.** 2017 වර්ෂයේ උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම


2017 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ සමස්ත පිරිමි සහ ගැහැණු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙළින් 1320 ක් සහ 2160 විය.

එයින් පිරිමි 833 සහ ගැහැණු 1659 ක් සඳහා විශ්වවිද්‍යාලයීය නේවාසික පහසුකම් සැපයිණි. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලය මගින් නිවසේ සිට විශ්වවිද්‍යාලයට ඇති දුර ප්‍රමාණය සලකා පළමු සහ අවසන් වසර සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ.


| **විශ්වවිද්‍යාල නේවාසිකාගාර** | **නේවාසිකාගාර තුළ ඉඩ පහසුකම් සැපයිය හැකි ප්‍රමාණය** | | **නේවාසිකාගාර තුළ ඉඩ පහසුකම් ලැබුණු සිසුන් සංඛ්‍යාව** | |
|---|---|---|---|---|
| | **ශිෂ්‍යයන්** | **ශිෂ්‍යාවන්** | **ශිෂ්‍යයන්** | **ශිෂ්‍යාවන්** |
| පණ්ඩුකාභය – කුලියාපිටිය | 120 | | 120 | |
| පඬුවස් දෙව් ශාලාව 01 සහ 02 | 200 | | 163 | |
| විජිත කුරුවිට ශාලාව | 388 | | 270 | |
| ස්වර්ණපාලී - කුලියාපිටිය | | 120 | | 120 |
| චිත්‍රාදේවී- කුලියාපිටිය | | 388 | | 388 |
| අනුලා දේවි | | 388 | | 388 |
| එකතුව | 708 | 896 | 553 | 896 |
| **මාකඳුර පරිශ්‍රය** | | | | |
| සපුමල් බණ්ඩාර I, II | 120 | | 120 | |
| බිසෝ බණ්ඩාර I,II | | 120 | | 60* |
| වීදිය බණ්ඩාර ශාලාව් | 160 | | 160 | |
| විහාර මහා දේවි නේවාසිකාගාරය | | 388 | | 388 |
| සුගලා දේවි ශාලාව (කාමර 40 ) | | 388 | | 315 |
| **එකතුව** | 280 | 896 | 280 | 763 |
| **පරිශ්‍ර 02 හි එකතුව** | 988 | 1792 | 833 | 1659 |

*** සිසුන් 60 ක් සඳහා නේවාසික පහසුකම් සැපයිය හැකි බිසෝ බණ්ඩාර ශාලාවේ එක් කොටසක් නවීකරණය කෙරෙමින් පවතී**

**2017 නේවාසිකාගාර පහසුකම් – ශිෂ්‍යයන් සඳහා**





**2017 නේවාසිකාගාර පහසුකම් – ශිෂ්‍යාවන් සඳහා**




**2014 – 2017 කාලය අතර උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම පිළිබඳ සන්සන්දනයක්**


| වර්ෂය | විශ්වවිද්‍යාල නේවාසිකාගාර | | කුලියට ලබා ගත් නේවාසිකාගාර | | එකතුව |
|---|---|---|---|---|---|
| | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවන් | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවන් | |
| 2014 | 221 | 419 | 89 | - | 729 |
| 2015 | 377 | 434 | - | - | 811 |
| 2016 | 620 | 1350 | - | - | 1970 |
| 2017 | 833 | 1659 | - | - | 2492 |



## 16. මහපොළ / ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍ය පිරිස 2017

| පීඨය | මහපොළ | ශිෂ්‍යාධාර |
|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 173 | 181 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 51 | 276 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය **පීඨය** | 1110 | 119 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ **පීඨය** | 171 | 41 |
| තාක්ෂණ පීඨය | 83 | 11 |
| **එකතුව** | **1588** | **628** |

2017 වර්ෂයේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව වූ 3485 ක් වූ ශිෂ්‍ය පිරිසකගෙන් 1588 දෙනෙකු සඳහා මහපොල ශිෂ්‍යත්ව හිමිකම ලැබුණි. 628ක් වූ ශිෂ්‍ය පිරිස සඳහා ශිෂ්‍යාධාර හිමිකම ලැබුණි. ප්‍රතිශතයක් ලෙස ගත් කල්හි 46%ක් සඳහා මහපොල හිමිකම ලැබුණු අතර 18% ක් සඳහා ශිෂ්‍යාධාර හිමිකම ලැබිණි.




**ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්ව ලැබීම - 2017**

2014 - 2017 කාලය තුළ මහපොළ හා ශිෂ්‍යාධාර හිමිකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සන්සන්දනයක්

| පීඨය | ශිෂ්‍යාධාර | | | | මහපොළ | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2014** | **2015** | **2016** | **2017** | **2014** | **2015** | **2016** | **2017** |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | 141 | 179 | 169 | 181 | 78 | 95 | 120 | 173 |
| ව්‍යවහාරිකවිද්‍යා | 227 | 255 | 265 | 276 | 61 | 61 | 62 | 51 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | 621 | 490 | 485 | 119 | 506 | 683 | 726 | 1110 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | 84 | 65 | 62 | 41 | 176 | 190 | 170 | 171 |
| තාක්ෂණ පීඨය | - | - | - | 11 | - | - | - | 83 |
| **එකතුව** | **1073** | **989** | **981** | **628** | **821** | **1029** | **1078** | **1588** |

## 17. පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

| | විෂය | ප්‍රකාශයට පත් කරන ලද | |
|---|---|---|---|
| | | ජාතික | ජාත්‍යන්තර |
| 1 | නිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 01 | 28 |
| 2 | අනිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 16 | 01 |
| 3 | අධ්‍යයනය සඳහා විශේෂ නොකළ සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | 8 |
| 4 | විද්යුත් සඟරා වල (e-learning ) පළ කරන ලද | - | 01 |
| 5 | ඉදිරිපත් කිරීම් සහ සම්පූර්ණ පත්‍රිකා ( පූර්ණ ) | 103 | 10 |
| 6 | සංක්ෂිප්ත ප්‍රකාශන | 188 | 22 |
| 8 | පොත් පරිච්ඡේද | 01 | 04 |
| 9 | කතෘ හෝ ආයතනික ප්‍රකාශන | 01 | - |

### 17.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

| | විෂය | ප්‍රකාශයට පත් කරන ලද | |
|---|---|---|---|
| | | ජාතික | ජාත්‍යන්තර |
| 1 | නිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | 08 |
| 2 | අනිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 06 | - |
| 3 | අධ්‍යයනය සඳහා විශේෂ නොකළ සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | - |
| 4 | ඉදිරිපත් කිරීම් සහ සම්පූර්ණ පත්‍රිකා ( පූර්ණ ) | 26 | - |
| 5 | සංක්ෂිප්ත ප්‍රකාශන | 29 | 01 |
| 6 | පොත් පරිච්ඡේද | - | 01 |

### 17.2 ව්‍යවහාරිකවිද්‍යා පීඨය

| | විෂය | ප්‍රකාශයට පත් කරන ලද | |
|---|---|---|---|
| | | ජාතික | ජාත්‍යන්තර |
| 1 | නිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 01 | 11 |
| 2 | අනිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 04 | - |
| 3 | අධ්‍යයනය සඳහා විශේෂ නොකළ සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | 03 |
| 4 | ඉදිරිපත් කිරීම් සහ සම්පූර්ණ පත්‍රිකා ( පූර්ණ ) | 37 | 07 |
| 5 | සංක්ෂිප්ත ප්‍රකාශන | 20 | 01 |
| 6 | පොත් පරිච්ඡේද | 01 | - |

## 17.3 තාක්ෂණ පීඨය

| | විෂය | ප්‍රකාශයට පත් කරන ලද | |
|---|---|---|---|
| | | ජාතික | ජාත්‍යන්තර |
| 1 | නිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | - |
| 2 | අනිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 01 | - |
| 3 | අධ්‍යයනය සඳහා විශේෂ නොකළ සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | - |
| 4 | ඉදිරිපත් කිරීම් සහ සම්පූර්ණ පත්‍රිකා ( පූර්ණ ) | 01 | - |

## 17.4 පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| | විෂය | ප්‍රකාශයට පත් කරන ලද | |
|---|---|---|---|
| | | ජාතික | ජාත්‍යන්තර |
| 1 | නිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | 9 |
| 2 | අනිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 1 | 1 |
| 3 | අධ්‍යයනය සඳහා විශේෂ නොකළ සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | 4 |
| 4 | ඉදිරිපත් කිරීම් සහ සම්පූර්ණ පත්‍රිකා ( පූර්ණ ) | 4 | - |
| 5 | සංක්ෂිප්ත ප්‍රකාශන | 119 | 20 |
| 6 | පොත් පරිච්ඡේද | - | 3 |
| 7 | කතෘ හෝ ආයතනික ප්‍රකාශන | 1 | - |

## 17.5 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| | විෂය | ප්‍රකාශයට පත් කරන ලද | |
|---|---|---|---|
| | | ජාතික | ජාත්‍යන්තර |
| 1 | නිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | - |
| 2 | අනිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 2 | - |
| 3 | අධ්‍යයනය සඳහා විශේෂ නොකළ සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | - |
| 4 | ඉදිරිපත් කිරීම් සහ සම්පූර්ණ පත්‍රිකා ( පූර්ණ ) | 34 | 1 |
| 5 | සංක්ෂිප්ත ප්‍රකාශන | 7 | - |

## 17.6 පුස්තකාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය

| | විෂය | ප්‍රකාශයට පත් කරන ලද | |
|---|---|---|---|
| | | ජාතික | ජාත්‍යන්තර |
| 1 | නිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | - |
| 2 | අනිර්දිෂ්ට සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | 2 | - |
| 3 | අධ්‍යයනය සඳහා විශේෂ නොකළ සඟරාවන්හි සම්පූර්ණ පත්‍රිකා ලෙස පළ කරන ලද | - | 1 |
| 4 | ඉදිරිපත් කිරීම් සහ සම්පූර්ණ පත්‍රිකා ( පූර්ණ ) | 1 | 2 |
| 5 | සංක්ෂිප්ත ප්‍රකාශන | 13 | - |

## 18. 2017 වර්ෂය තුළ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි

### 18.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

| විෂය | 2017.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජික සංඛ්‍යාව | 2017 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරි | 24 | - | - |
| දර්ශනපති | 02 | 01 | - |
| විද්‍යාපති | 04 | - | - |
| **එකතුව** | **30** | **01** | **-** |

### 18.2 ව්‍යවහාරිකවිද්‍යා පීඨය

| විෂය | 2017.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජික සංඛ්‍යාව | 2017 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරි | 18 | - | 01 |
| දර්ශනපති | 05 | - | - |
| විද්‍යාපති/ කළමනාකරණ විද්‍යාපති | 11 | 1 | - |
| **එකතුව** | **34** | **1** | **1** |

**18.3** තාක්ෂණ පීඨය

| විෂය | 2017.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජික සංඛ්‍යාව | 2017වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 02 | - | - |
| දර්ශනපති | - | - | - |
| කළමනාකරණ විද්‍යාපති/ වාණිජවිද්‍යාපති/විද්‍යාපති/සමාජීය විද්‍යාපති/ශාස්ත්‍රපති | - | - | - |
| **එකතුව** | **02** | **-** | **-** |

**18.4** ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| විෂය | 2017.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජික සංඛ්‍යාව | 2017වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 08 | 01 | - |
| දර්ශනපති<br><br>කළමනාකරණ විද්‍යාපති/ වාණිජවිද්‍යාපති/විද්‍යාපති/සමාජීය විද්‍යාපති/ශාස්ත්‍රපති | 17 | 05 | - |
| **එකතුව** | **25** | **06** | **-** |

**18.5** පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| විෂය | 2017.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | 2017 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 15 | 01 | 01 |
| දර්ශනපති | 09 | - | - |
| විද්‍යාපති | 07 | 01 | - |
| **එකතුව** | **31** | **02** | **01** |

**18.6** තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සහ ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය

| විෂය | 2017.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | 2017 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 03 | 01 | 01 |
| ශාස්ත්‍රපති | 03 | - | - |
| **එකතුව** | **06** | **01** | **01** |

## 19. ත්‍යාග ලැබීම් පිළිබඳ තොරතුරු

| පීඨය | ත්‍යාගයේ නම | ජාතික / ජාත්‍යන්තර | ත්‍යාගය පිළිබඳ තොරතුරු | ත්‍යාගය පිරිනමන ලද ආයතනය / රට | ත්‍යාගය ලබා ගත් අයගේ නම |
|---|---|---|---|---|---|
| **පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය** | විද්‍යාත්මක ප්‍රකාශන සඳහා පිරිනැමෙන NRC ත්‍යාගය | ජාතික | ශ්‍රී ලංකාවේ පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ භාවිතවන වෛද්‍යමය ද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණයක් Ethno Pharmacology සඟරාවේ 2014 වර්ෂයේ 155 වෙළුමේ 679 - 691 පිටු | ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ සභාව | ආචාර්ය ආර් ජී එස් විජේසේකර මහතා ජලජීවී වගා හා මත්ස්‍ය අධ්‍යයනාංශය |
| **කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය** | 29 වන වාර්ෂික කොංග්‍රසයේ සමස්ත දක්ෂතම ඉදිරිපත් කිරීම සඳහා පිරිනැමෙන විශ්ලේෂණාත්මක වාර්තාකරණය සහ සිතියම් කරණය පිළිබඳ ප්‍රදානය | ජාතික | 2017 නොවැම්බර් මස 16, 17 දිනයන්හි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනයේ පැවති 29 වන වාර්ෂික කොංග්‍රසයේ දී "Detailed Mapping of Soil Texture of a Paddy Growing Soil Using Multivariate Geostatical Analysis" යන හොඳම ඉදිරිපත් කිරීම වෙනුවෙන් පිරිනමන ලද ත්‍යාගය. | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය | ආර්. ඒ. ඒ. එස්. රත්නායක (ඉදිරිපත් කරන ලද ශිෂ්‍යයා ) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂිකර්ම ඉංජිනේරු හා පාංශු විද්‍යා අධ්‍යයනාංශය<br><br>යූ. ඩබ්. ඒ. විතාරණ උපදේශක / කතෘ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂිකර්ම ඉංජිනේරු හා පාංශු විද්‍යා අධ්‍යයනාංශය<br><br>බී. එල්. ඩබ්. කේ. බාලසූරිය උපදේශක / කතෘ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය කෘෂිකර්මා හා වැවිලි කළමනාකරණ පීඨයේ ජීව තාක්ෂණ අධ්‍යයානාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විද්‍යාත්මක පර්යේෂණ සඳහා පිරිනැමෙන ජනාධිපති ත්‍යාගය | ජාතික | විද්‍යාත්මක පර්යේෂණ සඳහා පිරිණැමෙන NRC ජනාධිපති ත්‍යාගය | ශ්‍රී ලංකාව | මහාචාර්ය ජේ. සී. එදිරිසිංහ මහතා |
| **තාක්ෂණ පීඨය** | ජනාධිපති ත්‍යාගය | ජාතික | Automatic Journal හි පළ කරන ලද ප්‍රකාශනය සඳහා | ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ සභාව | ආචාර්ය අයි. පී. එම්. වික්‍රමසිංහ මහතා |

## 20. ශාරීරික අධ්‍යාපන අංශය

### 20.1 හැඳින්වීම

ශාරිරික අධ්‍යාපන අංශය අධ්‍යයන ක්‍රියාවලිය සඳහා උපාධි අපේක්ෂකයන්ගේ ශාරිරික හා මානසික සමබරතාව වර්ධනය කරගැනීමේ වැඩසටහන් මගින් දායකත්වය සපයයි. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අනධ්‍යයන හා ශිෂ්‍ය ප්‍රජාව අතර සමගිය හා සහයෝගය වර්ධනය කරගැනීම සඳහා ඉතා වැදගත් වන අංශය මෙය වේ.


### 20.2 අපගේ දැක්ම

සමාජයට ශාරීරික, මානසික සහ සමාජමය අංශයන්ගෙන් පරිපූර්ණ සමබර සෞඛ්‍ය සම්පන්න පුද්ගලයෙකු බිහිකරලීම.

### 20.3 මෙහෙවර

අපගේ දැක්ම ලඟාකර ගැනීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් මෙහෙයවීම.

### 20.4 ශාරීරික අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩල සංයුතිය




### 20.5 බාහිර උපදේශකවරු

පහත සඳහන් ක්‍රීඩා ඉසව් සඳහා බාහිර උපදේශකවරුන් මගින් සේවය ලබාගන්නා අතර ඒ සඳහා විනිසුරු කඳවුරු පැවැත්වීම ද සිදු කෙරේ.

2017 වර්ෂයේ දී ශාරීරික අධ්‍යාපන අංශය සඳහා සුදුසුකම් ලත් බාහිර උපදේශකවරු දහතුන් දෙනෙක් (13) පහත සඳහන් ඉසව් සඳහා බඳවා ගන්නා ලදී.

| ක්‍රීඩා ඉසව්ව | නම | සුදුසුකම් |
|---|---|---|
| 1 බේස් බෝල් | ටී ලක්ෂ්මන් මහතා | සබරගමුව විශ්වවිද්‍යාලයේ පුහුණුකරු |
| 2 පැසි පන්දු | කේ සීකුමාර මහතා | ක්‍රීඩා නිලධාරි |
| 3 කැරම් | බී. ඩී. ආර්. කුමාර මයා | ජාතික කැරම් ශූරතාව |
| 4 චෙස් | ජේ ඒ බී කන්දෙආරච්චි මහතා | පාසල් මට්ටමේ සහ ක්‍රීඩා සමාජ මට්ටමේ පුහුණුකරු |
| 5 ක්‍රිකට් | ඩබ් ජී ඒ ආර් කුමාර මහතා | පළමු හා දෙවන මට්ටමේ ශ්‍රී ලංකා ක්‍රිකට් පුහුණුකරු |
| 6 එල්ලේ | එන් එම් පී කේ ප්‍රනාන්දු මහතා | ක්‍රීඩා සමාජ පුහුණුකරු |
| 7 හොකි | එස් එස් ලියනගේ මහතා | ශ්‍රී ලංකා හොකී සංගමයේ විනිසුරු හා පුහුණුකරු |
| 8 කරාතේ | ඩබ් එස් ආර් ප්‍රනාන්දු මහතා | ජාත්‍යන්තර කළු පටි ශූර |
| 9 රගර් | බී.එම්.බී.ඩී. බණ්ඩාර මහතා | සුදුසුකම්ලත් දෙවන පෙළ රග්බි පුහුණුකරු |
| 10 පිහිනුම් | එන්.එම්.ජේ.කේ. නවරත්න මහතා | ශිල්ප ශාලිකා ආයතනයේ පිහිනුම් උපදේශක |
| 11මේස පන්දු | ටී.එම්.කේ.පී.බී. තෙන්නකෝන් මහතා | ක්‍රීඩා නිලධාරි |
| 12 බර ඉසිලීම | කේ ඩී ඩී අයි ජයතිලක මහතා | ජාතික ක්‍රීඩක |
| 13 මල්ලව පොර | කේ පී ඩී ප්‍රියන්ත මහතා | ජාතික ක්‍රීඩා උළෙලේ ජයග්‍රාහක |

**20.6 වාර්ෂික ක්‍රීඩා වැඩසටහන්**


**20.6.1 පීඨාන්තර නවක ශිෂ්‍ය තරගාවලිය 2017**

නව පරිශ්‍රයකට ප්‍රවේශ වන විට නවක ශිෂ්‍යයන්ගේ ක්‍රීඩා කුසලතාවර්ධනය කරලීම සඳහා නව්‍යමය ක්‍රීඩා කටයුතු අවශ්‍ය කෙරේ. මෙම අත්‍යවශ්‍ය අංගයන් අවබෝධකොට ගනිමින් ශාරිරික අධ්‍යාපන අංශය මගින් වාර්ෂිකව පීඨාන්තර නවක ශූරතා තරගාවලියක් පවත්වමින් විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා කටයුතු සඳහා දිරිමත් කිරීමට කටයුතු කෙරේ. 2017 වර්ෂය තුළ දී ශාරීරික අධ්‍යාපන අංශය මගින් පීඨාන්තර නවක ශූරතා තරගාවලියක් සූදානම් කරන ලද අතර ගැහැණු පිරිමි ක්‍රීඩා ඉසව් විස්සක් (20) මේ සඳහා සූදානම් කෙරිණි.

1. බැඩ්මින්ටන්
2. බාස්කට් බෝල්
3. කැරම්
4. චෙස්
5. එල්ලේ
6. පාපන්දු
7. දැල්පන්දු
8. මේසපන්දු
9. ජවන හා පිටිය
10. අත්පන්දු
11. බර ඉසිලීම

2017 පෙබරවාරි මස 27 සිට මාර්තු 09 දින අතර තුර කුලියාපිටිය හා මකඳුර පරිශ්‍රයන්හි දී මෙම තරග ඉසව් පැවැත්විණි.

**අන්තර් පීඨ නවක ශිෂ්‍ය තරගාවලිය අවසන් ප්‍රතිඵලය**




**අන්තර් පීඨ නවක ශිෂ්‍ය සහභාගීත්වය**


| 2017 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | **කෘෂි කර්ම හා වැවිලි කළමනාකරණ පීඨය** | **ව්‍යවහාරිකවිද්‍යා පීඨය** | **ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය** | **පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය** | |
| පිරිමි | 54 | 98 | 93 | 58 | 303 |
| ගැහැණු | 82 | 52 | 88 | 38 | 259 |
| එකතුව | 136 | 149 | 181 | 96 | 562 |
| 2017 ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | 241 | 325 | 501 | 100 | 1167 |
| සහභාගීත්ව ප්‍රතිශතය | 56% | 46% | 36% | 96% | 48% |

### 20.6.2 අන්තර් පීඨ තරගාවලිය 2017

2017 මාර්තු මස 27 වන දින සිට අප්‍රේල් මස 04 වන දින දක්වා අන්තර් පීඨ තරගාවලිය විශ්වවිද්‍යාල කුලියාපිටිය පරිශ්‍රයේ සහ මාකඳුර පරිශ්‍රයේ දී පැවැත්විණි. ක්‍රීඩා තරග ඉසව් 22ක් පැවැත් වූ අතර මේ සඳහා පිහිණුම් තරග මෙන්ම ජවන හා පිටිය තරග ඉසව් ද පැවැත්විණි.


<u>**අන්තර් පීඨ අවසන් ප්‍රතිඵලය**</u>

| | |
|---|---|
| ශූරතාව | ව්‍යවහාරිකවිද්‍යා පීඨය (ලකුණු 207) |
| පළමු අනුශූරතාවය | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය (ලකුණු 190) |
| දෙවන අනුශූරතාවය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය (ලකුණු 106) |
| සිව්වන ස්ථානය | පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය (ලකුණු 46) |



**2017 අන්තර් පීඨ ශූරතාව සහභාගීත්වය**

| 2017 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | ව්‍යවහාරිකවිද්‍යා පීඨය | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය | |
| පිරිමි | 58 | 65 | 69 | 44 | 236 |
| ගැහැණු | 47 | 45 | 48 | 37 | 177 |
| එකතුව | 105 | 110 | 117 | 81 | 413 |
| 2017 ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | 647 | 694 | 1769 | 414 | 3524 |
| සහභාගීත්ව ප්‍රතිශතය | 16% | 16% | 7% | 20% | 12% |




2016 වර්ෂයට සාපේක්ෂව සමස්තශිෂ්‍ය සහභාගීත්වය කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ව්‍යවහාරිකවිද්‍යා පීඨය සහභාගීත්වය අතින් වර්ධනයක් පෙන්නුම් කරනු ලැබ ඇත. එසේම ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍යපීඨය 2016 වර්ෂයේ ඔවුන්ට හිමි ස්ථානය එලෙසම පවත්වා ගෙන ඇති අතර පශු සම්පත් ධීවර හා පෝෂණපීඨය සහභාගීත්වය අතින් සියයට පහක 5% වර්ධනයක් අත්පත්කොට ගෙන ඇත. මේ අනුව 2016 වර්ෂය සහ 2017 වර්ෂය අතර සමස්ත ශිෂ්‍ය සහභාගීත්වයේ ප්‍රතිශතය සියයට දොළහක 12% සමාන මට්ටමක පැවතුණි.

**අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා ශූරතාව 2017**

2017 වර්ෂයේ මැයි මස 06 වන දින සිට සැප්තැම්බර් 30 වන දින දක්වා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා සංගමය මගින් සංවිධානය කරන ලද 39 වන අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාව පැවැත්විණි. විවිධ විශ්වවිද්‍යාල පරිශ්‍රයන්හි දී ක්‍රීඩා ඉසව් තිස් හතරක් (34) ක් සංවිධානය කොට තිබුණු අතර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය ශාරීරික අධ්‍යාපන අංශය අන්තර් විශ්වවිද්‍යාලයීය බැඩ්මින්ටන් පිරිමි සහ කාන්තා ශූරතාව සංවිධානය කිරීමෙහිලා මූලිකත්වය ගෙනක්‍රියා කළේය, එය 2017 අගෝස්තු මස 4, 5 සහ 6 දිනවල කුලියාපිටිය ගෘහස්ත ක්‍රීඩාගරයේ දී පැවැත්විණි.

**සමස්ත ජයග්‍රහණ**

ජාතික විශ්වවිද්‍යාල 14 අතරින් 08 වන ස්ථානය හිමි විය.

**2017 අන්තර් විශ්වවිදාලයීය ශූරතාවයේ ජයග්‍රහණයන්**


**ඒකල ඉසව්**

| තරඟකරුගේ නම | තරඟ ඉසව්ව | ස්ථානය |
|---|---|---|
| ඊ එම් ආර් පී බණ්ඩාර | ටයිකොන්ඩෝ<br>(80 කි ග්‍රෑ - 87 කි ග්‍රෑ) | ශූරතාව |
| එච් ඩී එස් උදාකර | කරාතේ<br>(84 කි ග්‍රෑ ට අඩු පිරිමි) | පළමු අනුශූරතාව |
| ඊ එම් ආර් පී බණ්ඩාර | කරාතේ<br>(84 කි ග්‍රෑ ට වැඩි පිරිමි) | පළමු අනුශූරතාව |
| වී සී පෙරේරා | කරාතේ<br>(55 කි ග්‍රෑ ට අඩු පිරිමි) | දෙවන අනුශූරතාව |
| ඩබ් ඒ ඒ ඩිල්ශාන් | ටයිකොන්ඩෝ<br>(54 කි ග්‍රෑ) | දෙවන අනුශූරතාව |

**කණ්ඩායම් ඉසව්**

| **ඉසව්ව** | **ස්ථානය** |
|---|---|
| මල්ලව පොර - පිරිමි | පළමු අනුශූරතාව |
| බේස් බෝල් - පිරිමි | දෙවන අනුශූරතාව |
| එල්ලේ - කාන්තා | දෙවන අනුශූරතාව |
| එල්ලේ - පිරිමි | අර්ධ අවසාන වටය |
| චෙස් - පිරිමි | පස්වන ස්ථානය |
| බැඩ්මින්ටන් - කාන්තා | අර්ධ අවසන් පූර්ව වටය |
| කැරම් - පිරිමි | අර්ධ අවසන් පූර්ව වටය |
| දැල් පන්දු | අර්ධ අවසන් පූර්ව වටය |

| 2017 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | කෘෂි කර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | ව්‍යවහාරිකවිද්‍යා පීඨය | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය | |
| පිරිමි | 17 | 95 | 83 | 10 | 205 |
| ගැහැණු | 16 | 43 | 44 | 05 | 108 |
| එකතුව | 33 | 138 | 127 | 15 | 313 |
| 2017 ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | 647 | 694 | 1769 | 414 | 3524 |
| සහභාගීත්ව ප්‍රතිශතය | 05% | 20% | 7% | 04% | 09% |




2016 වර්ෂය හා සසඳා බැලීමේදී 2017 වර්ෂයේ ශිෂ්‍ය සහභාගීත්ව ප්‍රතිශතය සියයට දහයක 10% ක සිට සියයට නවය 09% දක්වා සුළු ප්‍රමාණයකින් අඩු වී ඇත.

**20.7 බාහිර තරග**

ගත වූ වර්ෂය තුළ දී අපගේ ශිෂ්‍යයන් තම අත්දැකීම් සහ හැකියාවන් වර්ධනය කර ගැනීමේ අරමුණින් පහත සඳහන් බාහිර තරග ඉසව් සඳහා ද සහභාගි වූහ.
විශ්වවිද්‍යාල මට්ටමින්

- මොරටුව විශ්වවිද්‍යාලය - අධ්‍යයන රග්බි තරගාවලිය
- කැලණිය විශ්වවිද්‍යාලය - අන්තර් විශ්වවිද්‍යාලයීය ටයිකොන්ඩෝ ශූරතාව "WORRIORS"
- කැලණිය විශ්වවිද්‍යාලය - ජවන හා පිටිය ශූරතාව " FLYING SHOE"
- කැලණිය විශ්වවිද්‍යාලය – මේසපන්දු ශූරතාව "SIEG"

- දිස්ත්‍රික් සිංහ සමාජ 306 – C – 1 ක්‍රීඩා සමාජ තරගාවලිය “LEO RUGBY SEVENS TOURNAMENT”
- කැලණිය විශ්වවිද්‍යාලය - කැරම් තරගාවලිය “Grip to Grip”
- මොරටුව විශ්වවිද්‍යාලය - මේසපන්දු ශූරතාව “MORSMASHES”
- කැලණිය විශ්වවිද්‍යාලය - අන්තර්විශ්වවිද්‍යාලයීය ආරාධිත හොකී ශූරතාව “KELANI NINES”
- මොරටුව විශ්වවිද්‍යාලය - හොකී තරගාවලිය “Mora Hockey 7s”
- පේරදෙණිය විශ්වවිද්‍යාලය - පාපන්දු තරගාවලිය “PERA CUP”
- පේරදෙණිය විශ්වවිද්‍යාලය - පාපන්දු තරගාවලිය “PERA SIXES”
- ශ්‍රී ලංකා එල්ලේ සංගමය - අන්තර් සංගම් කාන්තා එල්ලේ ශූරතාව
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - රජරට විශ්වවිද්‍යාලයීය එල්ලේ අභියෝගතාව
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - රජරට විශ්වවිද්‍යාලයීය හොකී සික්ස්සස්
- ශ්‍රී ලංකා කැරම් සංගමය - තුන්කොන් කැරම් තරගාවලිය
- NSBM හරිත විශ්වවිද්‍යාලය - NSBM මලලක්‍රීඩා තරගාවලිය

**ජාතික තරග**

- ශ්‍රී ලංකා පැසි පන්දු සංගමය - කුරුණෑගල දිස්ත්‍රික් පැසිපන්දු තරග
- ශ්‍රී ලංකා දැල්පන්දු සංගමය - අන්තර් සමාජික දැල්පන්දු ශූරතාව
- ශ්‍රී ලංකා බර ඉසිලීම් සංගමය - 2017 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ සහ යෞවන බර ඉසිලීම් ශූරතාව
- ශ්‍රී ලංකා මල්ලව පොර සංගමය - ජාතික මල්ලවපොර ශූරතාව
- ශ්‍රී ලංකා බර ඉසිලීම් සංගමය - ශ්‍රී ලංකා අන්තර් මධ්‍යම බර ඉසිලීමේ ශූරතාව 2017
- කුරුණෑගල දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය - තුන්වන බාණ්ඩයේ ක්‍රිකට් තරගාවලිය
- ශ්‍රී ලංකා කැරම් සංගමය - ජාතික කැරම් ශූරතාව

**ජාත්‍යන්තර මට්ටම**

- The 29th Summer Universiade – Taipae

  “Universiade” යනු ජාත්‍යන්තර ක්‍රීඩා හා සංස්කෘතික සංදර්ශනයක් වන අතර එය දෙවසරකට වරක් වෙනස් නගරයක පවත්වනු ලැබේ. 29 වන උළෙල 2017 අගෝස්තු මස 19 සිට 30 දක්වා දිනවල තායිපේහි දී පවත්වන ලදී. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ශිෂ්‍යයෙකු වන යූ. එච්. බී. වයි. දිල්ෂාන් මහතා ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාලයීය මේස පන්දු කණ්ඩායම සඳහා තෝරගන්නා ලද අතර ඔහු මෙම තරගාවලියට සහභාගි විය. ඔහු තරගය අතරතුර දී ඔහුගේ උපරිම දක්ෂතා පෙන්නුම් කළ අතර ස්විට්සර්ලන්තය වැනි රටවල් සමග පැවති තරගවලින් ජයග්‍රහණය අත්කරගත්තේය.

  ශාරීරික අධ්‍යාපන උපදේශක කේ. ඒ. එම්. බණ්ඩාරතිලක මහතා, ශාරීරික අධ්‍යාපන උපදේශක එම් ඒ සම්මානී මහත්මිය යන අය ජාතික විශ්වවිද්‍යාල බැඩ්මින්ටන් සහ මේස පන්දු පුහුණුකරුවන් ලෙස පිළිවෙළින් මේ සඳහා සහභාගි වූහ.

  උසස් කුසලතා, ශිල්පීය ක්‍රම, උපක්‍රම සහා ජාත්‍යන්තර අත්දැකීම් ලැබීම මෙහි දී අපගේ ක්‍රීඩකයන්ට මෙන්ම නිලධාරීන්ට ද ප්‍රයෝජනවත් විය.
- විවෘත අන්තර්ජාතික චෙස් ශූරතාව
- කැලණි විවෘත අන්තර්ජාතික චෙස් තරගාවලිය

**සංවිධානය කරන ලද තරගාවලි**

- අන්තර් විශ්වවිද්‍යාලයීය මේසපන්දු ශූරතාව “WAYOSPINS”

  ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය විසින් පළමු වරට සංවිධානය කරන ලද “WAYOSPINS”මේස පන්දු තරගාවලිය 2017 මාර්තු මස 24 සහ 25 දිනවල කුලියාපිටිය පරිශ්‍රයේ ගෘහස්ත ක්‍රීඩාගාරයේ දී පැවැත්විණ. මෙම මේස පන්දු තරගාවලිය සංවිධානය කරන ලද්දේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතර මේස පන්දු ජනප්‍රිය කරලීම සඳහාත් ඔවුනගේ කුසලතා සහා ක්‍රීඩා හැකියාවන් විශ්වවිද්‍යාල මට්ටමින් නිරූපණය කිරීම සඳහාත්ය. එසේම විශ්වවිද්‍යාලයෙන් පිට වී ගිය ශිෂ්‍යයන්ගේ සහයෝගය ලබා ගනිමින් දැනුම සහ තාක්ෂණික

ඥානය වර්තමන හා අනාගත තරගකරුවන්ට විශ්වවිද්‍යාල මට්ටමින් වර්ධනය කරවා ගැනීමත් අරමුණු විය.
ශ්‍රී ලංකා මේස පන්දු සංගමයේ මෙහෙය වීමෙන් මෙම තරගාවලිය සංවිධානය කරන ලද අතර ජාතික විශ්වවිද්‍යාලවල තරගකරුවන් සඳහා මෙය විවෘත විය.

## 20.8 වර්ණ ප්‍රදානෝත්සවය

2017 නොවැම්බර් 08 වන දින විශ්වවිද්‍යාලයීය ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී දිගු කලක් අපේක්ෂාවෙන් සිටි 2017 වර්ණ ප්‍රදානෝත්සවය වයඹ විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා ලෝලීන්ගේ සහභාගීත්වයෙන් සන්ධ්‍යාභාගයේ දී පැවැත්විණි. සවස 6.30ට ආරාධිතයන්ගේ සහ සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන් උත්සවය ආරම්භවිය.
ශ්‍රීලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ඊ එම් පී ඒකනායක මැතිතුමා මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වූ අතර ඔහුගේ හඬ අවධිකරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා අගය කළ අතර ජයග්‍රාහකයන්ට සුබපැතුම් එක්කළේය. එසේම ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුබවාදී අනාගතය උදෙසා ද සුබපැතුම් එක් කළේය.
මෙහි දී 2015 සහ 2016 වර්ෂයන්හි විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා පළ කළ ක්‍රීඩා ඉසව් 19ක් නියෝජනය කරමින් 165 දෙනෙක් වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වර්ණ ප්‍රදානය සිදු කෙරිණි.
විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විසින් ඉදිරිපත්කරන ලද සෞන්දර්යාත්මක නිර්මාණ මගින් මෙම උත්සවය වර්ණවත් විය. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා සංගමයේ සහයෝගයෙන් විශ්වවිද්‍යාලයීය ශාරීරික අධ්‍යාපන අංශය මගින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.

## 20.9 පහසුකම් සපයන ලද වැඩසටහන්

- **නම්නීකරණ වැඩසටහන.**
  අලුතින් විශ්වවිද්‍යාලවලට පැමිණෙන සිසුන් සඳහා ශාරීරික අධ්‍යාපන අංශයේ කාර්යභාරය පිළිබඳව හඳුන්වා දෙමින් එහි මෙහෙවර හා දැක්ම, වෘත්තීය තත්වය ක්‍රියාකාරකම් සහ අනාගත ප්‍රතිලාභ සහ විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතුවල නියැලීමේ ඇල්ම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක විය.

- **ක්‍රීඩා විද්‍යා හා අභ්‍යාස පිළිබඳ වැඩමුළු**
  අපගේ අංශය විසින් ක්‍රීඩා විද්‍යා හා අභ්‍යාස වැඩමුළුවක් පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨයේ පෝෂණ අධ්‍යයනාංශ සිසුන්ගේ විශේෂ ඉල්ලීමක් පරිදි තෙවන වසර සිසුන් සඳහා සංවිධානය කොට පවත්වන ලදී.
  ඔවුන්ගේ අධ්‍යයන විෂයන්ට අදාළව ක්‍රීඩා ක්ෂේත්‍රයේ දැනුම පුළුල් කර ගැනීම සඳහා එය මහඟු අවස්ථාවක් විය.

## 20.10 මූල්‍ය ප්‍රකාශය

### වාර්ෂික වියදම

| අංකය | විස්තරය | ගණන (රු) |
|---|---|---|
| 01 | අන්තර්පීඨ පළමු වසර සිසුන්ගේ ශූරතාව | 102635.00 |
| 02 | අන්තර්පීඨ ශූරතාව | 117975.00 |
| 03 | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා | 591301.80 |
| 04 | ක්‍රීඩා උපකරණ | 3814925.00 |
| 05 | වෙන්කර තබා ගැනීමේ ගාස්තු | 9000.00 |
| 06 | ක්‍රීඩා ඇඳුම් | 754256.00 |
| 07 | පුහුණු හා පුහුණු තරග | 68819.00 |
| 08 | බාහිර තරග | 248308.70 |
| | විශ්වවිද්‍යාල මට්ටම | 167351.00 |
| | ජාතික මට්ටම | 115879.00 |
| | ජාත්‍යන්තර මට්ටම | 151023.00 |
| 09 | තරග සංවිධාන | 8000.00 |
| 10 | සුළු මුදල් | 140685.55 |
| 09 | දුරකථන බිල්පත් | 17658.28 |
| 10 | SLUSA දායකත්ව මුදල් | 112000.00 |
| 11 | බාහිර උපදේශක ගාස්තු | 940125.00 |
| 12 | කාර්යාල උපකරණ | 369040.31 |
| 15 | 2017 වර්ණ ප්‍රදානෝත්සවය | 264270.00 |
| 16 | සහතිකපත්‍ර | 72000.00 |
| 17 | වෙනත් | 1000.00 |
| | **වාර්ෂික මුළු වියදම** | **7753143.94** |

# 21. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2003 ජනවාරි මස ස්ථාපනය කරන ලද්දකි. මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ පිහිටුවන ලද අතර විශ්වවිද්‍යාල සිසුන්ගේ වෘත්තීය හා මෘදු කුසලතා ඉහළ නැංවීමේ අභිලාසයෙන් පිහිටුවන ලදී. ඒ අනුව විශ්වවිද්‍යාලයීය සිසුන් හා ආයතන අතර යම් සබඳතාවක් මේ හරහා ගොඩ නැගෙයි. ආරම්භයේ සිට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් ඉහත පරමාර්ථය පදනම් කොටගත් නොයෙකුත් අවස්ථාවන් සංවිධානය කරනු ලැබ ඇත. මෙම අංශය උපකුලපති තුමා යටතේ ඍජුව පාලනය වෙයි.

තම අධ්‍යයන පසුබිමේ සිට වෘත්තීය ඉලක්කයන් කරා යොමුවීමට සිසුන්ට සාර්ථක දිරිගැන්වීමක් වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් සිදු කෙරේ. මේ අනුව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමබර අන්දමින් ඍජු සේවා, අධ්‍යාපන වැඩසටහන් සහ සම්පත් ද්‍රව්‍ය ආදිය සැපයීම සිදු කොට ඇත.

ඒ අනුව ශිෂ්‍යයන්ට

- අර්ථවත් රැකියා සොයාගැනීමට උපකාරී වීම
- පුහුණුව සඳහා ආයතන සොයාගැනීම
- ඔවුන්ගේ වෘත්තීය අභිලාසයන්ට සරිලන පරිදි අමතර අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීමට උපකාරී වීම

යන පහසුව ලැබෙයි.

ව්‍යාපෘති සඳහා සහභාගී වීමට සිදුවන උපාධි අපේක්ෂකයනට මෘදු කුසලතා පිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සහ අනෙකුත් ක්ෂේත්‍රයන්හි පුද්ගල සංවර්ධන වැඩසටහන් ප්‍රයෝජනවත් වෙයි.

වෙළඳ ලෝකයේ පැවැත්ම සඳහා ඔවුන්ට මේවා අතිශයින්ම වැදගත් වෙයි. මෙම වැඩසටහන් සඳහා සහභාගි වන සිසුන් පමණක් පෞද්ගලික සම්මුඛ පරීක්ෂණ ස්වාභාවයෙන් පවත්වනු ලබන වෘත්තීය වෙළඳපොළ (පෞද්ගලික ආයතන සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරෙන ) සඳහා සහභාගිවීමට සුදුසුකම් ලබති.

## 21.1 දැක්ම

යාවජීව අධ්‍යාපනය, ආර්ථික සමෘද්ධිමත්භාවය, මානසික ස්ථාවරත්වය සහ සමාජ සංචලනය සහ අවසන් ඉලක්කය කරා මෙහෙය වන සංකීර්ණ කාර්යමය ලෝකයේ ප්‍රශස්ත වෘත්තීය අවස්ථා ලඟාකර දෙන තත්වයෙන් උසස් සහ අත්‍යවශ්‍ය වෘත්තීය සහ මෘදු කුසලතාවලින් සමන්විත උපාධිධාරීන් පිරිසක් ලෙස දැනුවත්භාවය ඇතිකිරීම සහ සවිබල ගැන්වීම.


## 21.2 මෙහෙවර

වෘත්තීය හා මෘදු කුසලතාවර්ධනය කරගැනීමට උපකාරී වන වැඩසටහන් මෙන්ම ආයතනික සම්බන්ධතාව වර්ධනය කිරීම මගින් සිසුන් තත්වයෙන් උසස් වෘත්තිකයන් බවට පත්කරලීමෙන් උද්යෝගී ගෝලීය පුරවැසියන් වීමට අවස්ථාව අපි සලසා දෙන්නෙමු.

## 21.3 අරමුණු

- වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන සහ පුහුණුවීම් වැනි විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- සිසුන්ට ගැලපෙන හා තාත්වික වෘත්තීන් තෝරාගැනීමට සහ වෘත්තීය මග පෙන්වීමට සහාය වීම
- අධ්‍යාපනික සංවර්ධනය උදෙසා දායක වීමට තරුණයින් පෙළඹවීම
- සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ගමන් මග සාර්ථක කර ගැනීම සඳහා ඔවුන්ගේ කෙටි කාලීන හා දිගු කාලීන අරමුණු පෙළගැස්වීමට මග පෙන්වීම.
- අන්තර්ජාලය හරහා වෘත්තීය පුහුණු අවස්ථා හා රැකියා අවස්ථා පිළිබඳ දත්ත ගබඩාවක් ඇති කිරීම.
- ශිෂ්‍යත්ව / පුහුණු වැඩසටහන්, රැකියා සහ ඉගෙන ගැනීමේ අවස්ථා පිළිබඳ කළමනාකරණය කිරීම සහ තොරතුරු ලබාදීම.
- සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම් වීමට ජීව දත්ත සකස් කිරීමට සහ සිසුන්ගේ සන්නිවේදන කුසලතා වැඩිදියුණු කර ගැනීමට උදව් වීම.

## 21.4 අපගේ ආයතනික සැලැස්ම




## 21.5 කාර්ය මණ්ඩලය

| **තනතුර** | **නම** |
|---|---|
| අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන | ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා |
| වෘත්තීය උපදේශක | එස් ඩී ජී ජයසූරිය මහතා |
| පරිගණක යෙදවුම් සහකාර | එන් පී එස් ජනකසිරි මහතා |

මීට අතරව එක් පීඨයකින් එක් නියෝජිතයකු බැගින් පීඨ හතර සඳහා සම්බන්ධීකාරකවරු පත්කොට ඇත

| **සම්බන්ධීකාරකවරයාගේ නම** | **පීඨයේ නම** |
|---|---|
| නිපුන චාමර මයා | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය |
| ඩී එම් ජයසේන මයා | ව්‍යවහාරිකවිද්‍යා පීඨය |
| මේනකා කොඩිසිංහ මිය | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය |
| බී පී ඒ ජයවීර මයා | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය |

## 21.6 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් මෙහෙය වන ලද වැඩමුළු / පුහුණු / දැනුවත් කිරීම්

1. දෙදින පුහුණු වැඩමුළුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර ව්‍යවහාරිකවිද්‍යා පීඨය
   සම්පත් හා තාක්ෂණික සහයෝගය ස්වර්ණ රණතුංග මහතා සහ වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කණ්ඩායම
   
   | | |
   |---|---|
   | දිනය | 2017 ජනවාරි 05, 06 |
   | ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
   | ඉලක්ක කණ්ඩායම | ව්‍යවහාරිකවිද්‍යා පීඨය ප්‍රථම වසර සිසුන් |
   | සහභාගි වූ පිරිස | සිසුන් 84 |
   | ස්ථානය | සඳලංකා ඕතර කඳවුරු පරිශ්‍රය |

2. වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය
   සම්පත් හා තාක්ෂණික සහයෝගය ආචාර්ය ඩී. සී. අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය වයඹ විශ්වවිද්‍යාලය
   
   | | |
   |---|---|
   | දිනය | 2017 ජනවාරි 09 |
   | ඉලක්ක ක්ෂේත්‍රය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය |
   | ඉලක්ක කණ්ඩායම | පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය ප්‍රථම වසර සිසුන් |
   | සහභාගි වූ පිරිස | සිසුන් 60 |
   | ස්ථානය | මාකඳුර පරිශ්‍රය |

3. වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
   සම්පත් හා තාක්ෂණික සහයෝගය - මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා වෘත්තීය මාර්ගෝපදේශක ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
   ස්වර්ණ රණතුංග මහතා
   
   | | |
   |---|---|
   | දිනය | 2017 ජනවාරි 10 |
   | ඉලක්ක ක්ෂේත්‍රය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය |
   | ඉලක්ක කණ්ඩායම | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍යපීඨය ප්‍රථම වසර සිසුන් |
   | සහභාගි වූ පිරිස | සිසුන් 415 |
   | ස්ථානය | කුලියාපිටිය පරිශ්‍රය |

4. වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ව්‍යවහාරිකවිද්‍යා පීඨය
   සම්පත් හා තාක්ෂණික සහයෝගය - මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා වෘත්තීය මාර්ගෝපදේශක ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
   ස්වර්ණ රණතුංග මහතා
   
   | | |
   |---|---|
   | දිනය | 2017 ජනවාරි 18 |
   | ඉලක්ක ක්ෂේත්‍රය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය |
   | ඉලක්ක කණ්ඩායම | ව්‍යවහාරිකවිද්‍යා පීඨය ප්‍රථම වසර සිසුන් |
   | සහභාගි වූ පිරිස | - |
   | ස්ථානය | කුලියාපිටිය පරිශ්‍රය |

5. බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ස්වර්ණ රණතුංග මහතා සහ වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කණ්ඩායම

| | |
|---|---|
| දිනය | 2017 ජනවාරි 19 |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 80 |
| ස්ථානය | සඳලංකා ඕතර කඳවුරු පරිශ්‍රය |

6. බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ස්වර්ණ රණතුංග මහතා සහ වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කණ්ඩායම

| | |
|---|---|
| දිනය | 2017 ජනවාරි 20, 21 |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 84 |
| ස්ථානය | සඳලංකා ඕතර කඳවුරු පරිශ්‍රය |

7. බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ස්වර්ණ රණතුංග මහතා සහ වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කණ්ඩායම

| | |
|---|---|
| දිනය | 2017 ජනවාරි 23 |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 80 |
| ස්ථානය | සඳලංකා ඕතර කඳවුරු පරිශ්‍රය |

8. බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර ව්‍යවහාරිකවිද්‍යා පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ස්වර්ණ රණතුංග මහතා සහ වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කණ්ඩායම

| | |
|---|---|
| දිනය | 2017 ජනවාරි 26, 27 |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | ව්‍යවහාරිකවිද්‍යා පීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 85 |
| ස්ථානය | සඳලංකා ඕතර කඳවුරු පරිශ්‍රය |

9. රැකියා පොල
සම්පත් හා තාක්ෂණික සහයෝගය – රාජ්‍ය හා පෞද්ගලික ආයතන

| | |
|---|---|
| දිනය | 2017 ජනවාරි 31 |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | විශ්වවිද්‍යාලයේ උපාධි ලාභීන් සහ උපාධි අපේක්ෂකයන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 500 |
| ස්ථානය | කුලියාපිටිය පරිශ්‍රය |

10. බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ස්වර්ණ රණතුංග මහතා සහ වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කණ්ඩායම

| | |
|---|---|
| දිනය | 2017 පෙබරවාරි 02, 03 |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 84 |
| ස්ථානය | සඳලංකා ඕතර කඳවුරු පරිශ්‍රය |

11. බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ස්වර්ණ රණතුංග මහතා සහ වයඹ විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ කණ්ඩායම

| | |
|---|---|
| දිනය | 2017 පෙබරවාරි 08 |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍යපීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 80 |
| ස්ථානය | සඳලංකා ඕතර කඳවුරු පරිශ්‍රය |

12. බාහිර පුහුණුව - "ඓතිහාසික යාපහුව නැරඹීම්" කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය වයඹ විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| දිනය | 2017 පෙබරවාරි 17 |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 220 |
| ස්ථානය | යාපහුව පරිශ්‍රය |

13. පුද්ගල පිබිදීම පිළිබඳ වැඩමුළුව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය ආචාර්ය ඩී. සී. අබේසිංහ මහතා

| | |
|---|---|
| දිනය | 2017 මාර්තු 21 |
| ඉලක්ක ක්ෂේත්‍රය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය |
| ඉලක්ක කණ්ඩායම | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය අවසන් වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 130 |
| ස්ථානය | මාකඳුර පරිශ්‍රය |

14. සම්මුක පරීක්ෂන වලට පෙනී සිටීමේ ක්‍රමවේද ( කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය)
සම්පත් හා තාක්ෂණික සහයෝගය අචාර්ය ඩී. සී. අබේසිංහ මහතා

| | |
|---|---|
| දිනය | 2017 මාර්තු 28 |
| ඉලක්ක ක්ෂේත්‍රය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය |
| ඉලක්ක කණ්ඩායම | කෘෂිකර්ම වැවිලි කළමනාකරණ පීඨයේ සිව්වන වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 130 |
| ස්ථානය | මාකඳුර පරිශ්‍රය |

15. දෙදින බාහිර පුහුණු වැඩමුළුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර (ව්‍යවහාරිකවිද්‍යා පීඨය)
සම්පත් හා තාක්ෂණික සහයෝගය ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා, ස්වර්ණ රණතුංග මහතා, මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා සහ එස් ජනකසිරි මහතා.

| | |
|---|---|
| දිනය | 2017 අගෝස්තු 08 සහ 09 දින |
| ඉලක්ක ක්ෂේත්‍රය | සේවා නියුක්ති කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | ව්‍යවහාරිකවිද්‍යා පීඨය පළමු වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 62 |
| ස්ථානය | සඳලංකා ඕතර කඳවුරු පරිශ්‍රය |

16. වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - අධ්‍යක්ෂ අචාර්ය බණ්ඩාර ගජනායක මහතා, වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකය වයඹ විශ්වවිද්‍යාලය, මේජර් එස්. ඩී. ගාමිණී ජයසූරිය මහතා වෘත්ටීය උපදේශක වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකය වයඹ විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| දිනය | 2017 සැප්තැම්බර් 06 |
| ඉලක්ක ක්ෂේත්‍රය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය |
| ඉලක්ක කණ්ඩායම | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 100 |
| ස්ථානය | මාකඳුර පරිශ්‍රය |

17. "උපාධිධාරී ව්‍යවසාය උද්‍යානය" වැඩමුළුව
සම්පත් හා තාක්ෂණික සහයෝගය - (NEDA )ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය

| | |
|---|---|
| දිනය | 2017 සැප්තැම්බර් 14 |
| ඉලක්ක ක්ෂේත්‍රය | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 500 |
| ස්ථානය | කුලියාපිටිය පරිශ්‍රය |

18. ඔබගේ ශක්‍යතාව හඳුනාගැනීමේ වැඩමුළුව කෘෂිකාර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය නෙස්ලේ ලංකා සමාගම

| | |
|---|---|
| දිනය | 2017 සැප්තැම්බර් 20 |
| ඉලක්ක ක්ෂේත්‍රය | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය |
| ඉලක්ක කණ්ඩායම | කෘෂිකාර්ම හා වැවිලි කළමනාකරණ පීඨය ප්‍රථම වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 200 |
| ස්ථානය | මාකඳුර පරිශ්‍රය |

19. ජීව දත්ත තොරතුරු සම්පාදනය පිළිබඳ වැඩමුළුව - ව්‍යවහාරිකවිද්‍යා පීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය ගාමිණී ජයසූරිය මහතා වෘත්තීය මාර්ගෝපදේශක වෘත්තීය මාර්ගෝප දේශන ඒකකය

| | |
|---|---|
| දිනය | 2017 ඔක්තෝබර් මස 09 වන දින |
| ඉලක්ක ක්ෂේත්‍රය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය |
| ඉලක්ක කණ්ඩායම | ව්‍යවහාරිකවිද්‍යා පීඨය තෙවන වසර සිසුන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 60 |
| ස්ථානය | කුලියාපිටිය පරිශ්‍රය |

20. සම්මුඛ පරීක්ෂණයට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද (ව්‍යවහාරිකවිද්‍යා පීඨය)
සම්පත් හා තාක්ෂණික සහයෝගය ගාමිණී ජයසූරිය මහතා වෘත්තීය මාර්ගෝපදේශක, වෘත්තීය මාර්ගෝප දේශන ඒකකය

| | |
|---|---|
| දිනය | 2017 ඔක්තෝබර් මස 12 වන දින |
| ඉලක්ක ක්ෂේත්‍රය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය |
| ඉලක්ක කණ්ඩායම | ව්‍යවහාරිකවිද්‍යා පීඨය තෙවන වසර උපාධි අපේක්ෂකයන් |
| සහභාගි වූ පිරිස | සිසුන් 60 |
| ස්ථානය | කුලියාපිටිය පරිශ්‍රය |

21. ජීව දත්ත තොරතුරු සම්පාදනය පිළිබඳ වැඩමුළුව - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨ සිසුන්
සම්පත් හා තාක්ෂණික සහයෝගය ගාමිණී ජයසූරිය මහතා වෘත්තීය මාර්ගෝපදේශක වෘත්තීය මාර්ගෝප දේශන ඒකකය

දිනය 2017 ඔක්තෝබර් මස 13
ඉලක්ක ක්ෂේත්‍රය වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය
ඉලක්ක කණ්ඩායම ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨ තෙවන වසර සිසුන්
සහභාගි වූ පිරිස සිසුන් 250
ස්ථානය කුලියාපිටිය පරිශ්‍රය

22. සම්මුඛ පරීක්ෂණයට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද ( ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය)
සම්පත් හා තාක්ෂණික සහයෝගය ගාමිණී ජයසූරිය මහතා, වෘත්තීය මාර්ගෝපදේශක, වෘත්තීය මාර්ගෝප දේශන ඒකකය

දිනය 2017 ඔක්තෝබර් මස 13 වන දින
ඉලක්ක ක්ෂේත්‍රය වෘත්තීය සම්බන්ධතා තොරතුරු සම්පාදනය
ඉලක්ක කණ්ඩායම ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය තෙවන වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 300
ස්ථානය කුලියාපිටිය පරිශ්‍රය

23. බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර ව්‍යාවහාරික විද්‍යාපීඨය
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා, ස්වර්ණ රණතුංග මහතා, මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා සහ එස් ජනකසිරි මහතා.

දිනය 2017 නොවැම්බර් මස 06, 07
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 10
ස්ථානය ඕතර කඳවුරු පරිශ්‍රය සඳලංකාව

24. එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සංවිධානය සහ වයඹ විශ්වවිද්‍යාලයේ ස්වේච්ඡා සංවිධානය් රුක්රෝපණ වැඩසටහන
සම්පත් හා තාක්ෂණික සහයෝගය එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා නිලධාරීන්

දිනය 2017 නොවැම්බර් මස 25 වන දින
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම මාකඳුර පරිශ්‍රයේ ස්වේච්ඡා සාමාජිකයන්
සහභාගි වූ පිරිස සිසුන් 50
ස්ථානය ගල්ගමුව ගංගා ප්‍රදේශය

25. දෙදින බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර – කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිසුන්
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා, ස්වර්ණ රණතුංග මහතා, මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා සහ එස් ජනකසිරි මහතා.

දිනය 2017 දෙසැම්බර් මස 05, 06 දින
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 100
ස්ථානය ඕතර කඳවුරු පරිශ්‍රය සඳලංකාව

26. දෙදින බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිසුන් සහ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ සිසුන්
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා, ස්වර්ණ රණතුංග මහතා, මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා සහ එස් ජනකසිරි මහතා.

දිනය 2017 දෙසැම්බර් මස 06, 07 දින
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය

ඉලක්ක කණ්ඩායමකෘෂිකර්මහා වැව්ලි කළමනාකරණ පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්, පශු සම්පත් ධීවර ජා පෝෂණ පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 100
ස්ථානය ඕතර කඳවුරු පරිශ්‍රය සඳලංකාව

27. දෙදින බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර් කෘෂිකර්ම හා වැව්ලි කළමනාකරණ පීටයේ සිසුන්
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා, ස්වර්ණ රණතුංග මහතා, මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා සහ එස් ජනකසිරි මහතා.
දිනය 2017 දෙසැම්බර් මස 11, 12දින
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම කෘෂිකර්මහා වැව්ලි කළමනාකරණ පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 100
ස්ථානය ඕතර කඳවුරු පරිශ්‍රය සඳලංකාව

28. දෙදින බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර් කෘෂිකර්ම හා වැව්ලි කළමනාකරණ පීඨයේ සිසුන්
සම්පත් හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා, ස්වර්ණ රණතුංග මහතා, මේජර් එස්. ඩී. ගාමිණී ජයසූරිය මහතා සහ එස්. ජනකසිරි මහතා.
දිනය 2017 දෙසැම්බර් මස 13, 14දින
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම කෘෂිකර්මහා වැව්ලි කළමනාකරණ පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 100
ස්ථානය ඕතර කඳවුරු පරිශ්‍රය සඳලංකාව

29. දෙදින බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර - ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ සම්පත් හා තාක්ෂණික සම්පත් හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා, ස්වර්ණ රණතුංග මහතා, මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා සහ එස් ජනකසිරි මහතා.
දිනය 2017 දෙසැම්බර් මස 18, 19දින
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 100
ස්ථානය ඕතර කඳවුරු පරිශ්‍රය සඳලංකාව

30. දෙදින බාහිර පුහුණුව - මෘදු කුසලතා සංවර්ධන කඳවුර - ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ සම්පත් හා තාක්ෂණික සම්පත් හා තාක්ෂණික සහයෝගය - ආචාර්ය බණ්ඩාර ගජනායක මහතා, ස්වර්ණ රණතුංග මහතා, මේජර් එස් ඩී ගාමිණී ජයසූරිය මහතා සහ එස් ජනකසිරි මහතා.
දිනය 2017 දෙසැම්බර් මස 20, 21දින
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ප්‍රථම වසර උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 100
ස්ථානය ඕතර කඳවුරු පරිශ්‍රය සඳලංකාව

31. උපාධිධාරී ව්‍යවසායක උදානය – යෝජනා සැකසීම
සම්පත් හා තාක්ෂණික සහයෝගය ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය (NEDA )
දිනය 2017 දෙසැම්බර් මස 20 දින
ඉලක්ක ක්ෂේත්‍රය සේවා නියුක්ති කුසලතා සංවර්ධනය
ඉලක්ක කණ්ඩායම විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්
සහභාගි වූ පිරිස සිසුන් 15
ස්ථානය මාකඳුර පරිශ්‍රය

**21.7 වර්ෂයේ වැඩසටහන් සමාලෝචනය**

2017 වර්ෂය තුළ පීඨ හතරෙහි සිසුන් සඳහා වැඩසටහන් 31 ක් ක්‍රියාත්මක කිරීමට වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයට හැකි විය.

| **පීඨය** | වැඩසටහන් |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 11 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 08 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 06 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 02 |
| මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක | 01 |
| කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ දෙක | 00 |
| විශ්වවිද්‍යාලයේ පීඨ හතර | 03 |
| **එකතුව** | **31** |

**21.8** 2017 **වර්ෂයේ අපගේ වැඩසටහන්වලට සම්බන්ධ වූ සිසුන්හට ලැබෙන වරප්‍රසාද හා ලැබීම්**

- නායකත්ව පුහුණු
- ශිෂ්‍ය සමාගම් වැඩසටහන්
- බාහිර පුහුණු වැඩමුළු
- කර්මාන්තමය පුහුණුව
- රැකියා සඳහා ස්ථානගතවීම
- අයදුම්පත්‍ර ලිවීම ප්‍රගුණ කිරීම
- පෞද්ගලික උපදේශන
- ශිෂ්‍ය දත්ත එකතුව
- රැකියා වෙළඳ පොල
- පුද්ගල පෞරුෂ හා ආකල්ප වර්ධනය

**21.9 2017 විශේෂ ජයග්‍රහණ**

- කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ දෙක සඳහා රැකියා වෙළඳපොළ සංවිධානය කිරීම
- වර්ෂය තුළ වැඩසටහන් 31 ක් ක්‍රියාත්මක කිරීම

**21.10 2018 වර්ෂය සඳහා සංවර්ධන වැඩසටහන්**

➢ **වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ මානව සම්පත් සංවර්ධන කටයුතු**
- පර්යේෂණ කටයුතු සඳහා දායක වීම
- නව පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගීත්වය
- උසස් අධ්‍යාපනයට සහ ක්ෂේත්‍ර චාරිකාවලට සම්බන්ධවීම

➢ **භෞතික සම්පත් සංවර්ධනය**

| ඒකකය | ප්‍රමාණය |
| --- | --- |
| කැම්කෝඩර් | 01 |
| නාන කාමර / වැසිකිළි පද්ධති | 01 |
| පොත් රාක්ක | 02 |
| වානේ අල්මාරි (6'×4'×1.5) | 02 |
| සංගීත භාණ්ඩ (බොංගෝ ඩ්‍රම් සහ ගිටාර්) | 02 |
| ජංගම ඇමතුම් පද්ධති | 01 |
| පුහුණු උපකරණ හා ආධාරක | 10 |
| මාකඳුර පරිශ්‍රයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සඳහා වෙනම ගොඩනැගිල්ලක් | 01 |

**සිසුන් සඳහා නව වැඩසටහන්**

- ආකෘති සම්මුඛ පරීක්ෂණ - පටිගත කිරීම් සහිතව
- සමාජීය වගකීම් වැඩසටහන් සහ සේවා
- අධ්‍යයන චාරිකා සහ පර්යේෂණ සඳහා සහභාගීත්වය
- ශිෂ්‍ය තොරතුරු ජාලගත කිරීම
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- බඳවා ගැනීම් ඒජන්සි සමග සම්බන්ධතා ගොඩ නංවා ගැනීම
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ වෙබ් පිටුව සැකසීම

**21.11** 2017 **වර්ෂය තුළ සිදු කරන ලද සියලු කාර්යන් සඳහා වැය වූ මුළු වියදම**

| අංකය | වැඩසටහන | වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම |
| --- | --- | --- |
| 1 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAS | 370,000.00 |
| 2 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන – FLFN | - |
| 3 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන – FBSF | - |
| 4 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන – FAS | - |
| 5 | එක්දින බාහිර පුහුණු කඳවුර - FBSF | 185,000.00 |
| 6 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAPM | 370,000.00 |
| 7 | දෙදින බාහිර පුහුණු කඳවුර - FBSF | 370,000.00 |
| 8 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAS | 370,000.00 |
| 9 | රැකියා පොල 2017 | 166,930.00 |
| 10 | දෙදින බාහිර පුහුණු කඳවුර මෘදු කුසලතා සංවර්ධන කඳවුර - FAPM | 370,000.00 |
| 11 | එක්දින බාහිර පුහුණු කඳවුර - FBSF | 185,000.00 |
| 12 | බාහිර පුහුණුව - ඓතිහාසික යාපහුව නැරඹීම | 8440.00 |
| 13 | පුද්ගල පිබිදීම ඩවැඩමුළුව - FAPM | - |
| 14 | සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ ක්‍රමවේද - FAPM | - |

| | | |
|---|---|---|
| 15 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAS | 370,000.00 |
| 16 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන – FAS | - |
| 17 | උපාධිධාරී ව්‍යවසායක උදානය | 5898.00 |
| 18 | ඔබගේ ශක්‍යතාව හඳුනාගැනීමේ වැඩමුළුව - FAPM | - |
| 19 | සාර්ථක ජීවදත්ත තොරතුරු සම්පාදනය පිළිබඳ වැඩමුලුව | - |
| 20 | සම්මුඛපරීක්ෂණයට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද | - |
| 21 | සාර්ථක ජීවදත්ත තොරතුරු සම්පාදනය පිළිබඳ වැඩමුලුව - FBSF | - |
| 22 | සම්මුඛපරීක්ෂණයට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද - FBSF | - |
| 23 | දෙදින බාහිර පුහුණු කඳවුර – FAS | 420,000.00 |
| 24 | එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සංවිධානය සහ වයඹ විශ්වවිද්‍යාලයේ ස්වේච්ඡා සංවිධානය රුක්රෝපණ වැඩසටහන | - |
| 25 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAPM | 420,000.00 |
| 26 | දෙදින බාහිර පුහුණු කඳවුර – FAPM+FLFN | 420,000.00 |
| 27 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAPM | 420,000.00 |
| 28 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAPM | 420,000.00 |
| 29 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAPM | 420,000.00 |
| 30 | දෙදින බාහිර පුහුණු කඳවුර - FAPM | 420,000.00 |
| 31 | උපාධිධාරී ව්‍යවසායක උදානය යෝජනා සැකසීම (සියලු පීඨ) | - |
| **එකතුව** | | **5,711,268.00** |

**21.12 සමාප්තිය**

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2017 වර්ෂයේ දී වැඩසටහන් 31ක් මෙහෙය වීය. මේ තුළින් අපගේ ශිෂ්‍යයන්හට පහත සඳහන් පුද්ගල කුසලතා ඉහළ නංවා ගැනීමට හැකිවිය

- නව චින්තනය
- උනන්දුව ඇතිකර ගැනීම
- නිර්මාණාත්මකබව
- නම්‍යශීලී බව
- සම්පත්දායකත්වය
- කාර්යශූර
- ශක්‍යතාපිරි
- අවංක
- ස්වයං ප්‍රලෝභන
- ධනාත්මක ආකල්ප පිරි
- උපායශීලී
- වගකීම් දරන
- වෙළඳ ක්ෂේත්‍රයට අවතීර්ණ වන
- සිතීමේ හැකියාවෙන් යුත්
- විනය ගරුක
- දැඩිව ක්‍රියාවන්හි එල්බගත්
- විනෝදකාමී
- උනන්දුවෙන් පිරි

## 22. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය

### 22.1 හැඳින්වීම

කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය මඟින් කුලියාපිටිය පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා තොරතුරු තාක්‍ෂණික සේවාව සහ තොරතුරු තාක්‍ෂණ පුහුණු වැඩසටහන් සැපයේ. මේ මඟින් සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුවල කාර්ය මණ්ඩලය සහ බාහිර වෘත්තිකයන්ගේ තොරතුරු තාක්ෂණ පුහුණුව සඳහා සේවය ලබාදෙයි. මෙම අංශය මඟින් අධ්‍යයන කටයුතු සඳහා නොමඳ දායකත්වයක් ලබාදෙයි. එමගින් තොරතුරු තාක්ෂණ සාක්‍ෂරතාවල සුදුසු පරිසරාත්මක පසුබිමක් ඔස්සේ ලබාදෙන අතර අධ්‍යාපන හා පර්යේෂණ වැඩසටහන් සඳහා පරිගණක පහසුව සැපයේ.ඒ අනුව තොරතුරු තාක්ෂණයේ නවතම උපාංග භාවිතයෙන් සේවය සැපයීම සිදුකෙරේ. මෙම සේවාවන්ට විද්‍යුත් තැපැල, අන්තර්ජාල පහසුකම්, ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය, අන්තර්ජාල නඩත්තුව ආදිය ඇතුලත් වේ. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්ල විද්‍යුත් අධ්‍යයන ඇරඹුම් (ඉගෙනුම් ආධාරක පරිගණක ගත කිරීම, ඉගෙනුම් කළමනාකරණ පද්ධති ) මෙමගින් සැපයේ. අධ්‍යයනාංශ සහ ඒකක සඳහා ඔවුන්ගේ තොරතුරු මාර්ගගත (Online) පද්ධතිය හරහා සැපයීම සිදු කෙරේ.

### 22.2 පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන් /මෙහෙය වන ලද පාඨමාලා

- ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා ඩිප්ලෝමා සහ උසස් සහතික පත්‍ර පාඨමාලා මෙහෙයවීම.
- බාහිර අයදුම්කරුවන් සඳහා ඩිප්ලෝමා පාඨමාලාව (මුදල් අය කෙරේ)
- රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩ සටහන් මෙහෙය වීම.
- කාර්යමණ්ඩලය සඳහා කෙටි පුහුණු වැඩසටහන්
- LMS – දැනුවත් කිරීමේ වැඩසටහන්
- ත්වරිතවත් සහ විශ්වාසනීය ජාල පහසුකම් පද්ධතියක් කුලියාපිටිය පරිශ්‍රයේ ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සහයෝගය ඇතුව ෆයිබර් ඔප්ටික් කේබල් එළීමේ අවසන් අදියර කරා ළඟාවීම
- විශ්වවිද්‍යාලයේ උත්සව ඡායාරූපකරණය සහ වීඩියෝ පටිගත කිරීම සඳහා පහසුකම් සැපයීම
- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන උත්සවය වන උපාධි ප්‍රධානෝත්සවය සහ සාකච්ඡා සභා සඳහා Live Web Casting පහසුකම් සැපයීම
- 2017 පැවති "AI Tea – 2017" සමුළුව ඇතුළු උත්සව සඳහා Web Site නිර්මාණය කිරීම
- සියලු අධ්‍යයනාංශ සඳහා LMS මඟින් Online විභාග එහසුකම් සැපයීම

### 22.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය සහ ව්‍යවහාරිකවිද්‍යා පීඨය සඳහා පරිගණක විද්‍යාගාර පහසුකම්

මෙම මධ්‍යස්ථානය සඳහා පරිගණක විද්‍යාගාර තුනක් ඇත. මෙයින් විශාලතම විද්‍යාගාරයේ පරිගණක 40ක් අඩංගුවන අතර අනෙකුත් විද්‍යාගාර දෙකෙහි 20 බැගින් වන පරිදි පරිගණක පහසුව ඇත. මෙම විද්‍යාගාර පෙ.ව. 8.00 සිට ප.ව. 8.00 දක්වා සතියේ දිනවල විවෘතව තැබෙන අතර සෙනසුරාදා දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා විවෘතව පවතී.

**22.4 කාර්යමණ්ඩලය**

| | |
|---|---|
| පද්ධති ඉංජිනේරු | - 01 |
| උපදේශක - පරිගණක තාක්‍ෂණ | - 01 |
| කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්‍ෂණ | - 01 |
| පරිගණක යෙදුම් සහකාර | - 02 |
| විද්‍යාගාර සහායක | - 01 |
| කම්කරු | - 01 |
| කාර්මික නිලධාරී | - 02 |

**22.5 වර්ෂය තුළ ප්‍රගතිය**

- විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නඩත්තු කටයුතු
- බාහිර සිසුන් සඳහා ඩිප්ලෝමා පාඨමාලාවේ III වන වැඩසටහ ආරම්භ කිරීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම

**22.6 දුෂ්කරතාවන්**

- කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රතිපාදන හිඟ වීම
- වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව පරිගණක විද්‍යාගාර පුළුල් කිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- මෙම මධ්‍යස්ථානය ස්ථාපිතව ඇත්තේ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන ඉතා පැරණි ගොඩනැගිල්ලකය

**22.7 අනාගත සංවර්ධනය සඳහා යෝජනා**

- මෙම ගොඩනැගිල්ල ඉතා පැරණි සහ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන හෙයින් කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරුතාක්ෂණ මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් අවශ්‍ය කෙරේ
- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (Learning Management System) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා හඳුන්වා දීම
- බාහිර පුද්ගලයන් සඳහා වැඩමුළු පැවැත්වීම
- පරිගණක විද්‍යාගාරයේ පුළුල් කිරීම් සිදු කරමින් වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට පහසුකම් සැපයීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම
- කාර්ය මණ්ඩල පුහුණුව සාමාන්‍ය තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පරීක්ෂණය සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම.

**22.8 වෙනත් අදාළ තොරතුරු**

බහුසේවා මධ්‍යස්ථානයක් (Multi Service Centre) වශයෙන් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය දියුණු කිරීම අවශ්‍ය වන අතර එමගින් විශ්වවිද්‍යාලයටත් බාහිර පාර්ශ්වයන්ටත් පුළුල් සේවාවන් සැපයිය හැකිය.

වඩාත් විධිමත් සහ ප්‍රමාණවත් සේවාවක් සැපයීම සඳහා නව ගොඩනැගිල්ලක මෙම මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම අවශ්‍යය.

# 23. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය

## 23.1 හැඳින්වීම

සිසුන්ගේ ශීඝ්‍රයෙන් දියුණුවන විෂය ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු තාක්‍ෂණ අභියෝගයන්ට මුහුණ දීමට හැකි සේවාවක් සැපයීම සඳහා මාකඳුර තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. එමෙන්ම මේ නිසා ඔවුන්ට පරිගණක සාක්‍ෂරතාව මෙන්ම ඉහළ වෘත්තීය කාර්යය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත.

මෙම ඒකකය මඟින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සඳහා තොරතුරු තාක්‍ෂණ හා උසස් පරිගණක භාවිතය පිළිබඳ පාඨමාලා ඉදිරිපත් කරන අතර පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා පරිගණක තාක්‍ෂණ පාඨමාලාව පවත්වනු ලැබේ. එමෙන්ම අධ්‍යයනාංශ මඟින් පවත්වන සංඛ්‍යානය ආශ්‍රිත පාඨමාලා සඳහා විශේෂයෙන්ම ප්‍රායෝගික පරීක්‍ෂණවල දී මෙම ඒකකය මඟින් සේවාව සැපයේ. ඊට අමතරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ බාහිර උපාධි පාඨමාලාව හදාරන සිසුන්ට පරිගණක තාක්‍ෂණය සහ විද්‍යුත් වාණිජ්‍ය හා තොරතුරු කළමනාකරණ පද්ධති යන පාඨමාලා පවත්වනු ලැබේ. එමෙන්ම පළාතේ බාහිර ප්‍රජාවට ප්‍රයෝජනවත් වන පරිගණක තාක්‍ෂණයට සම්බන්ධ පාඨමාලා කීපයක්ම පවත්වමින් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය මඟින් වඩාත් පුළුල් සේවාවක් සැපයේ.

මෙම මධ්‍යස්ථානය සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වාත්, විභාග කාලය තුළ දී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 10.00 දක්වාත් විවෘතව පවතී.

## 23.2 මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

- 2017 මාර්තු මස DIT සහ CCAS ශිෂ්‍යයන් සඳහා "Computer Hardware assembeling " පිළිබඳ එක්දින වැඩමුළුවක් පවත්වන ලදී
- 2017 ජූනි මස දී පරිගණක යෙදවුම් සහ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව අටවෙනි (08) ශිෂ්‍ය කණ්ඩායම අධ්‍යයන කටයුතු අවසන් කළහ.
- 2017 දෙසැම්බර් මස වන විට තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවේ හයවන (06) ශිෂ්‍ය කණ්ඩායම අධ්‍යයන කටයුතු අවසන් කළහ.
- පරිගණක යෙදවුම් සහ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව නවවෙනි (09) ශිෂ්‍ය කණ්ඩායම අධ්‍යයන කටයුතු 2017 නොවැම්බර් මස දී ආරම්භ කෙරිණි.
- තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවා සඳහා හත්වන (07) ශිෂ්‍ය කණ්ඩායම 2017 නොවැම්බර් මස දී බඳවා ගන්නා ලදී.

## 23.3 පර්යේෂණ කටයුතු

ඩබ් කේ ජී කේ එස් වීරසිංහ මහත්මිය **“Development of an online tool for teaching ornamental plant identification “** පර්යේෂණ ව්‍යාපෘතියේ කටයුතු කිරීම

එච් ඩබ් එච් ප්‍රේමචන්ද්‍ර මයා “Speeding up Line and Geomatric Line Object Detection Using Hough Transform and Parallel Pixel Scananing for Efficient Line Object Detection on Large Images” කාර්යයේ නියැළිණි.

**ප්‍රකාශන**

1) කේ. එච් එන් එච් විමලවංශල ඩබ් කේ ජී කේ එස් වීරසිංහ, සහ ඩබ් ජේ එස් කේ වීරක්කොඩි යන අය විසින් " An Emperial Assessment of Information Systems in Agricultural in the Southern Province of Sri Lanka " යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළහ.
වයඹ විශ්වවිද්‍යාලයීය 16 වන කෘෂිකර්ම පර්යේෂණ සාකච්ඡා සභාව 2017 - 204 - 208 පිටු
2) එල් එස් මධුසංක, කාංචනා එස් වීරසිංහ, ඩබ් ජේ එස් කේ වීරක්කොඩි යන අය විසින් ශ්‍රී ලංකාවේ පුත්තලම් දිස්ත්‍රික්කයේ කජු වගා ක්ෂේත්‍රයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් International Conference on Advances in ICT for Enarging Regions සඳහා ඉදිරිපත් කරන ලදී

3) එච් ඒ සී කේ ජයතිලක, යූ කේ ජයසිංහ මුදලිගේ, එල් ඩී ආර් ඩී පෙරේරා ජී ඒ හොබ් සහ එන් වෛද්‍යනාථ යන අය " Fostering Technology Stewarship Approach to promote Knowledge Sharing among Farming communities in Sri Lanka " යන මැයෙන් 29 වෙනි PGIA වාර්ෂික පර්යේෂණ සැසිවාරයේ දී පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළහ.
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාද් උපාධි ආයතනයේ 2017 නොවැම්බර් 17 සහ 18 දිනවල පර්යේෂණ සඟරාවෙහි සංක්ෂිප්ත පත්‍රිකාව පළවිය.
4) එච් ඒ සී කේ ජයතිලක, යූ කේ ජයසිංහ මුදලිගේ, එල් ඩී ආර් ඩී පෙරේරා, ජී ඒ හොබ්, එන් වෛද්‍යනාථ යන අය විසින් " use of Mobile Phones for Agricultural Knowledge Mobilization Exploring the Case of Subsistance Farmer in the Bottom of the Pyramid in Batticaloa Sri Lanka - International multidisciplinary Research Conference යන මැයෙන් ICRD and UCC මගින් සංවිධානය කරන ලද කොළඹ 02 රේණුකා හෝටයේ පවත්වන ලද සමුළුවේදී පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.
5) එච් ඒ සී කේ ජයතිලක, යූ කේ ජයසිංහ මුදලිගේ, එල් ඩී ආර් ඩී පෙරේරා, ජී ඒ හොබ්, එන් වෛද්‍යනාථ යන අය විසින් " Teaching Stemandship approach to Share Agriculture Knowledge among smallholder Communities : an emperial investigation " යන මැයෙන් වයඹ ජාත්‍යන්තර සමුළුවේදී පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළහ.
6) එච් ඒ සී කේ ජයතිලක, යූ කේ ජයසිංහ මුදලිගේ, එල් ඩී ආර් ඩී පෙරේරා, ජී ඒ හොබ්, එන් වෛද්‍යනාථ එල් එම් ජේ කේ ලිදර සහ ටී බර්ලට් යන අය úiska " Potential of Mobile Communication for Agricultural Knowledge Sharing Exploring the case of Ginger farmers in the Kurunegala District. යන මැයෙන් රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ 2017 ජනවාරි 14 වන දින පැවති කෘෂිකර්ම හා පරිසර ජාත්‍යන්තර සාකච්ඡා සභාවේ දී පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළහ.

**23.4 කාර්යය මණ්ඩලය**

| | |
|---|---|
| පද්ධති ඉංජිනේරු | - 01 |
| උපදේශක - පරිගණක තාක්‍ෂණ | - 01 |
| කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්‍ෂණ | - 02 |
| පරිගණක යෙදුම් සහකාර | - 01 |
| විද්‍යාගාර සහායක | - 01 |
| කම්කරු | - 01 |
| තාක්ෂණ නිලධාරි | - 01 |

**23.5 අයවැය**

මිලියන 1.5 ක මුදලක් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය සඳහා වෙන් කරන ලද අතර පරිගණක පද්ධතිය නගා සිටුවීම සඳහා වැය කෙරිණි.

**23.6 බාධාවන්**

- පරිගණක විද්‍යාගාර සඳහා භෞතික ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- අවශ්‍ය ප්‍රමාණයට දේශන ශාලා සහ කාර්ය මණ්ඩල කාමර පහසුකම් නොමැති වීම

**23.7 අනාගත සංවර්ධනය සඳහා යෝජනා**

වර්ග මීටර 2000ක ඉඩකඩක් සහිත ගොඩනැගිල්ලක් තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය කෙරේ. තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා යෝජිත නව ගොඩනැගිල්ලේ පරිගණක විද්‍යාගාර, දේශන ශාලා සහ කාර්යමණ්ඩල කාමර සඳහා වෙන්කිරීමට යෝජිත අතර වර්ෂයක් පාසා වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පහසුකම් සැපයීමට වර්තමාන මධ්‍යස්ථානයට හැකියාවක් නොමැත. එහෙයින් යෝජිත ගොඩනැගිල්ල ඉතා ඉක්මනින් සකසා ගත යුතුය.

පරිගණක උපදේශක, විද්‍යාගාර සහායක සහ විද්‍යාගාර කම්කරු තනතුරු 01 බැගින් අවශ්‍යව ඇත.

**23.8 වර්ෂය තුළ ප්‍රගතිය**

2017 වර්ෂයේ දී පරිගණක හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්තානය සඳහා පහත සඳහන් උපකරණ සහ උපාංග මිලදී ගන්නා ලදී.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| Canon Laser Printer LBP 253 Y | 01 |
| Rescom Level pro 6Kv UPS | 02 |
| STC General Air Conditioner 48000BTU | 02 |
| Asus notebook computers 9240UV | 03 |
| Hitachi Multimedia projector | 01 |
| Refrigerator Damro 250L | 01 |
| Dell Vostro 3669 Desktop Computers | 15 |
| Wall Mount network cabinet 16u | 01 |
| Cable management panel 1 u | 02 |
| Patch panel 24pt | 03 |
| Cisco network switch 48 port | 01 |
| Samsung color laser printer | 01 |
| Computer Table | 10 |
| Hikvision CCTV Camera | 16 |
| Hikvision 16 CCTV Chanel NVR unit | 01 |
| Segate 4TB Hard Disk Drive | 01 |
| York Air Conditioner 48000BTU | 01 |
| Wooden conference table | 01 |
| Low back Chair | 08 |
| Wooden Dining Table | 01 |
| Wooden Dining Chair | 06 |
| Computer Chair | 10 |
| Viewsonic VS1903A LCD Monitor | 05 |
| Wire Rack (Bag rack) | 07 |
| Multi Layer rack (Shoe Rack) | 02 |
| Whiteboard 8’x4’ | 01 |
| Vacuum Cleaner | 02 |

**23.9 වෙනත් අදාළ තොරතුරු**

- එච් ඒ සී කේ ජයතිලක මහතා, ඩබ් කේ ජී කේ එස් වීරසිංහ මිය, ඩබ් ඩී සමින් වික්‍රම මහතා, එච් ඩබ් එච් ප්‍රේමචන්ද්‍ර මහතා " Web Designing for Non Academic Staff of the Wayamba University" වැඩමුළුව සඳහා සම්පත් දායකයන් ලෙස සහභාගී වූහ. මෙම වැඩ මුළුව ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලද අතර, ඒ සඳහා තොරතුරු සන්නිවේදනා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ ද සහයෝගය ලබා දුනි. මෙය 2017 ජුනි මස 04, 11, 18, 25, යන දිනවල පැවැත්විණි.
- එච් ඒ සී කේ ජයතිලක මහතා "Web Tools for Administration for Educational Directors in North Western Province" යන වැඩමුළුවේ සම්පත් දායකයකු ලෙස සහභාගී වූ අතර එය 2017 දෙසැම්බර් 14 සහ 15 යන දිනවල දී වයඹ විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලද අතර, ඒ සඳහා තොරතුරු සන්නිවේදනා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ ද සහයෝගය ලබා දුනි.
- එච් ඒ සී කේ ජයතිලක මහතා "Capasity Building Programme for A/L Econ Teachers in Giriulla Zonal Education Office" වැඩමුළුවේ සම්පත් දායකයකු ලෙස සහභාගී වූ අතර එය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලද අතර, ඒ සඳහා තොරතුරු සන්නිවේදනා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ ද සහයෝගය ලබා දුනි. මෙය 2017 සැප්තැම්බර් මස 29 සහ 30 යන දිනවල පැවැත්විණි.
- එච් ඒ සී කේ ජයතිලක මහතා "Capasity Building Programme for A/L Teachers in North Western Province" වැඩමුළුවේ සම්පත් දායකයකු ලෙස සහභාගී වූ අතර එය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලද අතර, ඒ සඳහා තොරතුරු සන්නිවේදනා හා තාක්ෂණ මධ්‍යස්ථානයේද සහයෝගය ලබා දුනි. මෙය 2017 මාර්තු මස 24 සිට 27දක්වා පැවැත්විණි.
- ඩබ් ඩී සමන් වික්‍රම මහතා " Assembling an Application of a Drone" Image Processing and Robot Controlling Using Rasperify for Small type Devices at SHIBAURA INSTITUTE of TECHNOLOGY " JAPAN"" වැඩමුළුව සඳහා 2017 පෙබරවාරි මස 06 සිට 15 දක්වා සහභාගි විය.
- ඩබ් ඩී සමන් වික්‍රම මහතා " Deployment of IPV6 in a Campus Network – Lanka Educationand Research Network at University of Peradeniya" වැඩමුළුව සඳහා 2017 මැයි 22 සහ 23 යන දිනවල දී සහභාගි විය.
- ඩබ් ඩී සමන් වික්‍රම මහතා " Network monitoring and Messurment - Lanka Educationand Research Network at University of Peradeniya" වැඩමුළුව සඳහා 2017 නොවැම්බර් 27 සිට 29 දක්වා දිනවල දී සහභාගි විය.
- ඩබ් එච් ඩබ් ප්‍රේමචන්ද්‍ර මහතා " Assembling an Application of a Drone" Image Processing and Robot Controlling Using Rasperify for Small type Devices at SHIBAURA INSTITUTE of TECHNOLOGY " JAPAN" වැඩමුළුව සඳහා 2017 පෙබරවාරි මස 06 සිට 15 දක්වා සහභාගි විය.
- ඩබ් එච් ඩබ් ප්‍රේමචන්ද්‍ර මහතා " Assembling an Application of a Drone Image Processing and Robot Controlling Using Rasperify for Small type Devices" යන මැයෙන් වැඩමුළුවක් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ දී 2017 අගෝස්තු 17 වන දින කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ දී පැවත්විය.
- ඩබ් එච් ඩබ් ප්‍රේමචන්ද්‍ර මහතා "Sinhala Chanter Recognition and Based on Research" යන මැයෙන් පර්යේෂණයක් මෙහෙයවා ඊට අදාළ ප්‍රකාශන 02 2017 වසරේ දී පළ කළේය.

# 24. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය

## 24.1 දැක්ම

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වීමය.

## 24.2 මෙහෙවර

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ මෙහෙවර වනුයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා ඉගෙන ගැනීම සම්බන්ධ තෝරාගත් ක්‍රමවේද මඟින් උපාධි අපේක්ෂකයින්ගේ භාෂා ප්‍රවීණතාව වැඩි දියුණු කිරීම.

- ඵලදායී ක්‍රමවේද මගින් කතාව, කියවීම, ලිවීම සහ සවන්දීම පිළිබඳ මනා පුහුණුවක් ලබාදීම.
- ශාස්ත්‍රීය, සමාජීය, හා වෘත්තීය ප්‍රජාවේ ක්‍රියාකාරී කොටසක් බවට පත්වීම සඳහා සිසුන් පෙළඹවීම.
- ජාතික සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ඵලදායි සන්නිවේදන කුසලතා ලබා දීම.

## 24.3 පසුබිම

කුලියාපිටිය ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මඟින් සිසුන්ට ඔවුන්ගේ අනාගතය හමුවේ ඇති අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය භාෂා නිපුණතාව ලබා ගැනීමටත්, ඔවුන්ගේ අවංකභාවය වැඩි දියුණු කර, අනුවර්තනීය සහ සක්‍රීය ඵලදායී පුරවැසියන් ලෙස රටට බිහිකිරීමත් අපේක්ෂා කරනු ලැබේ. ජාතික සංවර්ධනය සඳහා විශාල වශයෙන් දායක වීමට සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාව වර්ධනය කිරීම මෙම පාඨමාලාව හැදෑරීම තුළින් අවස්ථාව උදාකරගත හැක. ශිෂ්‍ය කේන්ද්‍රගත ඉගැනුම් ක්‍රම හඳුන්වාදීම තුළින් ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලට වැඩි අවස්ථාවක් ලබා දීමෙන් ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණත්වය ලබා ගැනීම සඳහා සිසුනට උසස් බලාපොරොත්තුවක් ඇති කෙරේ.

## 24.4 කාර්යය මණ්ඩලය

### අධ්‍යයන කාර්යය මණ්ඩලය

ආචාර්ය කේ. එම්. දිසානායක මහතා - සමායෝජක

ඩබ්ලිව්. එස්. ඒ. ප්‍රනාන්දු මිය - කථිකාචාර්ය

ඊ. එම්. එච්. ජේ. එදිරිසිංහ මහතා - කථිකාචාර්ය

එම්. කේ. එස්. එම්. සමරනායක මහතා - කථිකාචාර්ය

### තාවකාලික උපදේශකවරු

ඩී එල් ටී පී ලියනගේ මෙය

ආචාර්ය එච් එම් එන් එන් මැණිකේ මිය

එස් එච් එම් එම් හේමමාලි මෙය

ඩී එන් ජේ රත්නායක මෙය

ඊ එම් ඩී එච් ඒදිරිසිංහ මෙය

පී ජී එස් ගුණතිලක මෙය

එස් ආර් කනංකේ මෙය

සී එම් ආර් වී චන්ද්‍රසේකර මෙය

එච් එම් ඩී අයි හේරත් මෙය

එල් එම් බී කේ කරුණාරත්න මෙය

බී එම් ටී සී බස්නායක මෙය

ඒ එම් ඩී පී අතාවුද මෙය

ජේ ඒ ටී ජයසූරිය මෙය

පී පී ඩබ් සේකර් මෙය

ඊ එම් කේ කේ කේ ඒකනායක මෙය

ආර් එම් එන් යූ රත්නායක මෙය

ඕ එන් කොඩිසිංහ මෙය

ආර් ජී ඩී කේ රාජපක්ෂ මෙය

**අනධ්‍යයන කාර්යය මණ්ඩලය**

ඩී ජී ආර් එම් විජේසිංහ මෙය (පරිගණක යෙදුම් සහකාර)

ඩබ්ලිව් පී ඩී සිරිවර්ධන මයා (කාර්යාල කම්කරු)

**24.5** 2017 **වසරේ දී පවත්වන ලද අධ්‍යයන පාඨමාලා**

**I) ව්‍යවහාරිකවිද්‍යා පීඨය සඳහා**

- නවක සිසුන් සඳහා කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව.
- පළමු වසර සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාව.
- දෙවන වසර සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාව.
- තුන්වන වසර සිසුන් සඳහා ව්‍යාපාර ඉංග්‍රීසි පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.
- තුන්වන වසර සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා උසස් මට්ටමේ ප්‍රවීණතා පාඨමාලාව.

**II) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය.**

- නවක සිසුන් සඳහා පවත්වන කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව
- ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි I ව්‍යාකරණ පදනම් පාඨමාලාව (ELTU 1110)
- ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි II ලේඛන පාඨමාලාව (ELTU 1210)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන I පාඨමාලාව (BSF 2131)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන II පාඨමාලාව (BSF 2251)

**III) තාක්ෂණ පීඨය.**

- නවක සිසුන් සඳහා පවත්වන කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව
- පළමු වසර සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාව I (ELPC 1110) සහ තාක්ෂණය සඳහා ඉංග්‍රීසි I (ETCH 1110) පාඨමාලාව
- පළමු වසර සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාව II (ELPC 1210) සහ තාක්ෂණය සඳහා ඉංග්‍රීසි II (ETCH 1210) පාඨමාලාව
- දෙවන වසර සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂාව සහ ස්න්නිවේදන කුසලතා I (ELCS 2110/ETCH 2110) පාඨමාලාව
- දෙවන වසර සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂාව සහ ස්න්නිවේදන කුසලතා II (ELCS 2210/ETCH 2211) පාඨමාලාව

## 24.5 බාහිර පාඨමාලා

### 25.5.1 ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව -11 වන කණ්ඩායම

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මගින් මෙහෙයවනු ලබන ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවේ 11 වන කණ්ඩායම සඳහා 2017 වසරේදී සිසුන් 330 දෙනෙක් ලියාපදිංචි කරන ලදී. එසේම 10 වන කණ්ඩායමේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2017.11.10 වන දින විශ්වවිද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. ඩිප්ලෝමා ලාභීන් 234 දෙනෙක් සහතික පත්‍ර උපකුලපති තුමා අතින් ලබාගත්හ.

### 25.5.2 විශේෂ පාඨමාලා

අනධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයන් සඳහා සහකාර ලේඛකාධිකාරී විභාගයට සූදානම් වීමේ පාඨමාලාවක් පැවැත්විණි. මේ සඳහා විශේෂ පංතියක් පවත්වන ලදී.

## 24.6 ඉංග්‍රීසි දින තරග

2017 දෙවන සමාසිකයේ දී වාර්ෂිකව පැවැත්වෙන ඉංග්‍රීසි දින තරග පවැත්විණි. මේ සඳහා පීඨ හතර නියෝජනය කරමින් සිසුන් 152 නියෝජනය කරමින් සාමානය දැනීමේ තරග, නිර්මාණාත්මක ලේඛනය, ගායනය සහ කථික තරග පැවැත්විණි.

### ආදර්ශ සම්මුඛ පරීක්ෂණ

ව්‍යාපාර ඉංග්‍රීසි පාඨමාලාව හදාරන ලද සිසුන් සඳහා ආදර්ශ සම්මුඛ පරීක්ෂණ (mock interviews) 2017.11.29 දින ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ දී පැවැත්විණි. ප්‍රදේශයේ ආයතනවල කළමනාකරුවන් සහ විධායක නිලධාරීන් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා සහභාගි විය.

## 24.7 කාර්යමණ්ඩල ජයග්‍රහණ

ආචාර්ය කේ එම් දිසානායක මහතා මලයාසියාවේ Aducation විශ්වවිද්‍යාලයේ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ආචාර්ය උපාධිය සම්පූර්ණ කළේය.

**24.8 ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්**

- කේ එම් දිසානයක මහතා " An ESP Need Analysis for English Medium Undergradutes in a Sri Lankan University" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සමුළුවට ඉදිරිපත් කළේය.
- ආචාර්ය කේ එම් දිසානායක මහතා "Exploiting New Conceptual Oppertunites for Better EAP Classroom" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපයේ පැවති පර්යේෂණ සමුළුවට ඉදිරිපත් කළේය.
- එම් කේ එස් එම් සමරනායක මහතා University Lerners Performance in Using the Definete article in Definite Contexts Versus the Indefinite Article in Indefinite Contexts" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පැවති දසවන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවට ඉදිරිපත් කළේය.
- එම් කේ එස් එම් සමරනායක මහතා " Effectiveness of the Intensive English Language Course Offered to the New Entrance, a Study Based on the Language Proficiency of Weaker Students at the Wayamaba University of Sri Lanka" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 වයඹ විශ්වවිද්‍යාලයේ පැවති වාර්ෂික පර්යේෂණ සභාවට ඉදිරිපත් කළේය.
- එම් කේ එස් එම් සමරනායක මහතා " Attitude of Undergraduate towards Lerning English Grammer and Four Skills Seperatly ; a Study Based on Wayamba University of Sri Lanka" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 වයඹ විශ්වවිද්‍යාලයේ පැවති වාර්ෂික පර්යේෂණ සභාවට ඉදිරිපත් කළේය.
- ඩබ් එස් ඒ ප්‍රනාන්දු මහත්මිය " The Impact of Task Based Language Teaching on Grammar Instruction : A Comparative Study of Planned vs. Incidental Forcus of form Instruction" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 වර්ෂයේ දී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පර්යේෂණ සභාවට ඉදිපත් කළාය.
- ඩබ් එස් ඒ ප්‍රනාන්දු මහත්මිය " A Comparative Analysis of Corrective Feedback Received Under Planned vs. Incidental Focus on Form Instruction" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 වයඹ විශ්වවිද්‍යාලයේ පැවති වාර්ෂික පර්යේෂණ සභාවට ඉදිරිපත් කළාය.
- ඩබ් එස් ඒ ප්‍රනාන්දු මහත්මිය " The Impact of Focus on Form Instruction on Grammatical Accuracy" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 වර්ෂයේ ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සභාවට ඉදිපත් කළාය.
- ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා " Teacher Code Switching ; Functions and Impact on Students Performance and Attitudes" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 කොළඹ විශ්වවිද්‍යාලයේ පැවති ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සභාවට ඉදිරිපත් කළේය.
- ඊ එම් එච් ජේ එදිරිසිංහ් මහතා " Translanguaging – Functions and Impact of Students performance and Attitudes" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් 2017 ශ්‍රී ලංකා වාග්විද්‍යා තුන්වන (03)ජාත්‍යන්තර පර්යේෂණ සභාවට ඉදිරිපත් කළේය.

**24.9 පත්වීම්**

- ආචාර්ය කේ එම් දිසානායක මහතා 2017.08.23 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකයේ සම්බන්ධීකාරක ලෙස පත් කරනු ලැබීය.
- ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යක්ෂ ලෙස 2017.09.12 වන දින සිට පත් කරනු ලැබීය.
- ඩබ් එස් ඒ ප්‍රනාන්දු මහත්මිය ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන සම්බන්ධීකාරක ලෙස 2017.12.08 වන දින සිට පත් කරනු ලැබීය.

## 25. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය

### 25.1 හැඳින්වීම

මාකඳුර පරිශ්‍රයේ පිහිටි පීඨ දෙකෙහි පළමු දෙවන සහ තෙවන වසර සිසුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලා මෙම ඒකකය මගින් පවත්වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පළමු වසර සිසුන් සඳහා " අධ්‍යයන ඉංග්‍රීසි" පාඨමාලාව පැවැත්විණි. "විද්‍යාව සඳහා ඉංග්‍රීසි" පාඨමාලාව පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ පළමු වසර සිසුන් සඳහා පැවැත්විණි. "අධ්‍යයන ලේඛනය" පාඨමාලාව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන වසර සිසුන් සඳහා පැවැත්විණි. එසේම පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ දෙවන වසර සිසුන් සඳහා " අධ්‍යයන ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත්වන ලදී. ව්‍යාපාරික ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන සහ තුන්වන වසර සිසුන් සඳහා පැවැත්විණි. විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක සඳහා කඩිනම් ඉංග්‍රීසි පාඨමාලා සාර්ථක අන්දමින් පවත්නා ලද අතර එය පීඨ දෙකෙහිම 2016 ජනවාරි සිට අප්‍රේල් දක්වා ක්‍රියාත්මක විය.

### 25.2 පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන්

මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙකට අයත් සිසුහු ඉංග්‍රීසි දින තරග සඳහා සහභාගි වූහ. කෙටි කාලීන් ඉංග්‍රීසි පාඨමාලාව සඳහා බඳවා ගන්න ලද ඉංග්‍රීසි උපදේශකයන් සම්බන්ධීකාරක විසින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ක්‍රමවේද භාවිත කරමින් පුහුණුකරන ලදී. මේ යටතේ ඉගැනුම් ක්‍රියාවලියේ භාවිතයන් පිළිබඳව සාකච්ඡා කිහිපයක් පැවැත්විණි. කාර්යමණ්ඩලයේ දැනුම සහ අත්දැකීම් හුවමාරු කරගැනීම සඳහා පවත්වනු ලබන රැස්වීම් ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේදී පැවැත්විණි. e-learning මගින් ඉංග්‍රීසි ඉගැනීමේ සහතිකපත්‍ර පාඨමාලාව සඳහා පස්වන ශිෂ්‍ය කණ්ඩායම ජූලි මස අවසන් කළ අතර 07 වන කණ්ඩායම ඔක්තෝබර් මස දී බඳවා ගන්නා ලදී. සම්බන්ධීකාරක තුමිය විෂයමාලා සංවර්ධන වැඩමුළුව සඳහා සහභාගි වූවාය. එහිදී ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ උපාධිය කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය මගින් පිරිනැමීම පිළිබඳව නිර්නායක සැකසිණි.

### 25.3 කාර්යය මණ්ඩල තත්වය

සියලු ඉංග්‍රීසි වැඩ සටහන් සාර්ථකව සිදු කෙරිණිග E-learning මගින් ඉංග්‍රීසි ඉගෙනීමේ සහතික පත්‍ර පාඨමාලාවෙ 07 වන කණ්ඩායම සාර්ථකව නිමවූ අතර එහි 08 වන කණ්ඩායම අධ්‍යයන කටයුතු වල නිරත වෙමින් සිටී.

### 25.4 ගත වූ වර්ෂයේ ප්‍රගතිය

පීඨ මට්ටමින් ඉංග්‍රීසි දින තරග පවත්වන ලද අතර එමඟින් විශ්වවිද්‍යාල මට්ටමින් තරග සඳහා ඉදිරිපත් වීමට ශිෂ්‍යයන් උනන්දු කරවීම සිදු විය. විශ්වවිද්‍යාල මට්ටමේ තරග පැවැත්විණි. මෙම තරගයේ දී මෙම සිසුන්හට ස්ථානයක් ලබා ගැනීමේ හැකියාව ලැබුණි. සහතික පත්‍ර ප්‍රදානය මාකඳුර පරිශ්‍රයේ දී පැවැත්විණි. සියලු ඉංග්‍රීසි වැඩසටහන් සාර්ථකව පැවැත්විණි. e-learning මඟින් ඉංග්‍රීසි ඉගෙනීමේ සහතික පත්‍ර පාඨමාලාව පස්වන ශිෂ්‍ය කණ්ඩායම සඳහා මාකඳුර පරිශ්‍රයේ දී පැවැත්විණි. එදිනම e-learning පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානය ද සිදු කෙරිණි.

e-learning මගින් ඉංග්‍රීසී ඉගෙනීමේ සහතික පත්‍ර පාඨමාලාවෙ 07 වන කණ්ඩායම් අධ්‍යයන කටයුතු සම්පූර්ණ කළ අතර 08 වන කණ්ඩායම අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් සිටී. මෙම පාඨමලාව සඳහා ඉහළ ඉල්ලුමක් ඇත. එසේම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයට අයත් අධ්‍යයන අංශයක් බවට ඉදිරියේ දී පත් කිරීමට නියමිතය.

### 25.5 බාධාවන්

ඉංග්‍රීසි ඉගැන්වීමේ අංශය සඳහා ස්ථිර කාර්ය මණඩලයේ හිඟය ප්‍රධාන බාධාවක් ලෙස පෙන්වා දිය හැකිය.

**25.6 යෝජනා**

මාකඳුර පරිශ්‍රයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය සඳහා ස්ථිර අචාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.

# 26. වෛද්‍ය මධ්‍යස්ථානය

වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් ක්‍රියාත්මක වේ. එයින් එකක් කුලියාපිටිය පරිශ්‍රයේ ස්ථාපිත වී ඇති අතර අනෙක මාකඳුර පරිශ්‍රයේ ස්ථාපනය කර ඇත. මෙමගින් 2017 වර්ෂය තුළ දී සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. 2016 වර්ෂයේ මෙන්ම 2017 වර්ෂයේ දී ද කුලියාපිටිය පරිශ්‍රයේ කාර්ය මණ්ඩලය සාත්තු සේවකයකු, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු, ඖෂධවේදියෙකු, ලසු ලේඛිකාවක සහ කම්කරුවෙකු ගෙන් සමන්විත විය. මාකඳුර පරිශ්‍රයේ ද ලසු ලේඛිකා තනතුර හැර අනෙකුත් තනතුරු සමානව ඇත.

**වෛද්‍ය පරීක්ෂණ**

විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරී විසින් අලුතෙන් පත්කරන ලද කාර්ය මණ්ඩලයේ සහ සේවා දීර්ඝ කිරීම් අවශ්‍ය වන කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය නිර්දේශයන් ලබාදීම සිදු විය.

සුළු අසනීප සඳහා කාර්යමණ්ඩලයට සහ ශිෂ්‍ය ප්‍රජාවට ප්‍රතිකාර කිරීම වෛද්‍ය මධ්‍යස්ථානය මගින් සිදු විය.විශේෂ වෛද්‍ය අවධානයක් අවශ්‍යවන අය සඳහා කුලියාපිටිය මූලික රෝහල වෙත යොමු කිරීම සිදු විය.

2017 වර්ෂය තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් බොහොමයක් සිදු කෙරිණි.

1. මදුරුවන් සඳහා දූමායනය කිරීම (තුන්වතාවක්)
2. දඩාවතේ යන සුනඛයින් වන්ධ්‍යකරණයට ලක් කිරීම
3. මදුරු මර්ධන වැඩසටහන්
4. ජලභීතිකාව සඳහා එන්නත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක විය
5. වාර්ෂික අහාර සහ ජල සාම්පල පරීක්ෂා කිරීම
6. තැලසීමියා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක විය
7. ප්‍රජා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් සහ ලිංගිකව බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීම

සාමාන්‍යයෙන් 2017 වර්ෂය තුළ කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රයන්හි සීමාවන්ට යටත්ව කණ්ඩායමක් ලෙස සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහාම උපකාර කිරීමට වෛද්‍ය නිලධාරී ඇතුළු කණ්ඩායමට හැකියාව ලැබුණි

## 27. පුනරාවර්තන වියදම් විස්තර

| විෂය | 2016<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| අ. පුද්ගල වැටුප් හා වේතන | 645,615,622 | 738,119,700 |
| ආ. ගමන් වියදම් | 5,507,184 | 10,411,320 |
| ඇ. සැපයීම් | 40,861,384 | 43,164,761 |
| ඈ. නඩත්තු | 5,555,663 | 21,300,615 |
| ඉ. කොන්ත්‍රාත් සේවා | 134,498,641 | 160,148,659 |
| ඊ. වෙනත් | 57,145,728 | 39,746,450 |
| **එකතුව** | **899,185,222** | **1,012,891,505** |

## 28. ප්‍රාග්ධන වියදම් තොරතුරු

| විෂය | 2016<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| අ. ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත්කර ගැනීම් | 117,810,260 | 122,170,552 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම් | | - |
| ඇ. ගොඩනැගිලි සහ සවිකිරීම් අත්පත්කර ගැනීම් | | - |
| ඈ. ඉඩකඩම් අත්පත්කර ගැනීම් | 138,825,000 | - |
| ඉ. වෙනත් (පොත් සහ අනෙකුත් භාණ්ඩ) | 1,341,710 | 8,278,805 |
| **එකතුව** | **257,976,970** | **130,449,357** |

## 29. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්)

| විෂය | 2017 වර්ෂයේ ප්‍රතිපාදන<br>රු. | 2017 වර්ෂය වියදම<br>රු. | ඉතිරිය /හිඟය<br>රු. |
|---|---|---|---|
| අ. පුනරාවර්තන (ව්‍යාපෘති හැර) | 915,502,000 | 1,012,891,505 | 97,389,505 |
| ආ. ව්‍යාපෘති හැර මූලධන | 827,844,307 | 857,192,807 | 29,348,500 |
| ඇ. ව්‍යාපෘති – දේශීය අරමුදල් | - | - | - |
| ඈ. ව්‍යාපෘති - විදේශීය අරමුදල් | - | - | - |
| **එකතුව** | **1,743,346,307** | **1,870,084,312** | **126,738,005** |

## 30. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්)


| ආදායම් ප්‍රභවය | 2017 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2017 වර්ෂයේ එකතුව රු. | ඌනතාවය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධිඅපේක්ෂක අධ්‍යයන | - | 22,369,000 | - |
| ආ. පශ්චාද් උපාධි අධ්‍යයන | - | 31,468,000 | - |
| ඇ. උපදේශන | - | - | - |
| ඈ. අනෙකුත් | - | 36,029,820 | - |
| **එකතුව** | **-** | **89,866,820** | **-** |

## 31. 2017 - මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය

| විෂය | සමීකරණය | එක් ශිෂ්‍යයෙකු සඳහා වියදම රු. |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම (RE) | ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 290,643.19 |
| ආ. ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම් (CE) | ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 37,431.67 |
| **එකතුව** | | **328,074.86** |

## 32. 2014 - 2017 තුළ ඒක ශිෂ්‍ය පිරිවැය පීඨ මට්ටමින් (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ද ඇතුළුව)

| පීඨය | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 331,530.51 | 406,468,.16 | 470,620.67 | 506,440.00 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 317,772.87 | 401,273.56 | 475,765.32 | 475,217.00 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 171,190.70 | 251,089.50 | 299,503.71 | 333,602.10 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 365,408.97 | 489,186.51 | 552,471.34 | 622,529.89 |



## 33. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්)

| නම සහ තොරතුරු | ණය/ප්‍රතිපාදන | අරමුදල් ප්‍රභවය | මුළු පිරිවැයේ එකතුව රු. |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සඳහා යෝජිත වෛද්‍ය පීඨයේ සැලසුම සහ ඉදිකිරීම් පිළිබඳ ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය | - | 2,341,400,000.00 |

## 34. 2017 වර්ෂයේ යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ තොරතුරු

| යටිතල පහසුකම් තොරතුරු | වියදම රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| බුලියාපිටිය පරිශ්‍රයේ සමස්ත විදුලිබල පද්ධතිය බෙදා හැරීම නවීකරණය කිරීම | 10,718,785.28 | 50% |
| කුලියාපිටිය පරිශ්‍රයේ නේවාසිකාගාර ආපනශාලාවේ වහල නවීකරණය කිරීම | 379,008.00 | 100% |
| වෛද්‍යපීඨය සඳහා යෝජිත භූමියේ නේවාසිකාගාර් ඉදිකිරීම සඳහා භූමිය සකස් කිරීම | 1,250,000.00 | 100% |
| වෛද්‍ය පීඨයට අයත ඉඩම වටා වැටක් ඉදි කිරීම | 1,147,000.00 | 100% |
| කුලියාපිටිය පරිශ්‍රයේ යෝජිත අපවහන පද්ධතිය | 9,986,000.00 | 60% |
| වෛද්‍ය පීඨයේ නේවාසිකාගාර ඉදිකිරීම | 2,696,650.00 | 100% |
| කුලියාපිටිය පරිශ්‍රයේ තාක්ෂනපීඨය සඳහා තාවකාලික ගොඩනැගිලි ඉදි කිරීම | 683,200.00 | 100% |
| මාකඳුර පරිශ්‍රයේ නේවාසිකාගාර අලුත්වැඩියාව | 1,792,220.00 | 100% |
| පශු සම්පත් ධීවර හා පෝෂන පීඨයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම | 4,485,000.00 | 60% |
| මාකඳුර පරිශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාරය පිටුපස මායිම් වැට ඉදි කිරීම | 496,400.00 | 100% |
| මාකඳුර පරිශ්‍රයේ කෘෂි කර්ම හා වැවිලි කළමනාකරණ පීඨයෙ ගොවිපල භූමියේ වැට ඉදි කිරීම | 660,400.00 | 100% |
| මාකඳුර පරිශ්‍රයේ පවත්නා ආපන ශාලාවට කොටසක් එක් කිරීම | 2,793,350.00 | 100% |
| මාකඳුර පරිශ්‍රයේ පැති බැම්ම ඉදි කිරීම සහ ඇතුලුවීමේ දොරටුව අසල බොරළු පිරවීම | 287,500.00 | 100% |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ බිම් මහලේ දේශන ශාලා වැඩි දියුණු කිරීම | 6,502,750.00 | 20% |

## 35. ව්‍යාපෘති වියදම් තොරතුරු (දේශීය අරමුදල්)

| නම | පිරිවැයේ එකතුව රු. | 2016 වර්ෂයේ වියදම රු. | 2017 වර්ෂයේ වියදම රු. | 31.12.2017 වන විට මුළු වියදම | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| **ඉදිකිරීම් ව්‍යාපෘති ඉදිරියට ගෙන ඒම** | | | | | |
| පීඨ ගොඩනැගිල්ල – පළමු අදියර (අවසාන කොටස) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍යපීඨය - කුලියාපිටිය | 165,000,000 | 4,433,821.07 | 2,753,790.00 | 124,160,155.52 | 100% |
| කුලියාපිටිය පරිශ්‍රයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා තනිපුද්ගල නේවාසිකාගාර ඉදි කිරීම | 49,000,000 | 2,545,036.74 | 2,956,062.59 | 23,833,724.40 | 100% |
| කුලියාපිටිය පරිශ්‍රයේ නේවාසිකාගාර 04 වන අදියර | 69,000,000 | 2,482,245.95 | - | 53,755,651.51 | 100% |
| මාකඳුර පරිශ්‍රයේ නේවාසිකාගාර 05 වන අදියර | 93,000,000 | 17,456,470.56 | - | 65,417,760.19 | 100% |
| මාකඳුර පරිශ්‍රයේ නේවාසිකාගාර 06 වන අදියර | 93,000,000 | | - | 50,075,829.88 | 100% |
| කුලියාපිටිය පරිශ්‍රයේ ක්‍රීඩාංගණයේ තණකොළ සිටුවීම සහ අනෙකුත් වැඩි දියුණු කිරීම | 50,000,000 | 9,510,061.35 | - | 34,100,085.91 | 100% |
| පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ පීඨ සංකීර්ණයේ තෙවන අදියර | 169,500,000 | 15,623,029.71 | 15,590,598.63 | 85,915,598,.16 | 43% |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ පීඨ සංකීර්ණයේ තෙවන අදියර | 367,000,000 | 159,006,763.92 | 38,624,981.54 | 333,710,554.67 | 90% |
| කුලියාපිටිය පරිශ්‍රයේ පරිපාලන සංකීර්ණයේ දෙවන අදියර | 100,000,000 | 8,353,833.39 | 41,617,918.24 | 69,213,274.48 | 90% |
| කුලියාපිටිය පරිශ්‍රයේ ආපන ශාලා අදියර අංක 01 | 45,000,000 | 369,867.02 | | 34,447,525.48 | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| කුලියාපිටිය පරිශ්‍රයේ ඉංජිනේරු තාක්ෂණ උපාධි පාඨමාලාව සඳහා විද්‍යාගාර ඉදි කිරීම | 282,000,000 | - | 72,034,933.30 | 113,849,933.30 | 26% |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පීඨ සංකීර්ණයේ තෙවන අදියර | 233,000,000 | 29,283,958.25 | 67,092,660.42 | 102,292,660.42 | 42% |
| **දැයට කිරුළ ව්‍යාපෘති** | | | | | |
| ක්‍රීඩාගාරය | 250,000,000 | 44,670,000.00 | - | 155,355,690.50 | 100% |
| ශ්‍රවණාගාරය | 250,000,000 | 654,687.60 | 4,500,000.00 | 236,110,248.52 | 100% |
| නැනෝ තාක්ෂණ විද්‍යාගාරය | 30,000,000 | 192,930.73 | - | 16,275,509.82 | 100% |

**1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) ඡේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව**

1. මෙම මූල්‍ය ප්‍රකාශය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(බී) ඡේදයන්ට හා කලින් කල නීතිගත කරන ලද සංශෝධනවලට හා 1971 අංක 38 දරණ මුදල් පනතට අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබේ.

(i) ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා අර්ථ නිරූපනය කිරීම සංගතතාවක් පවත්වා ගනිමින් හා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී සාමාන්‍යයෙන් පිළිපදිනු ලබන පොදුවේ පිළිගත් පරිචයන්ට අනුකූලව මෙම ගිණුම් අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සිදු කොට ඇත.

**අ මූල්‍ය හෙළිදරව්ව**

**(1) රජයේ ප්‍රතිපාදන**

| | 2017 | 2016 |
|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන ( මහා භාණ්ඩාගාරයෙන් ) | 915,502,000 | 847,500,000 |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන ( වි වි ප්‍ර කො ) | | |
| මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | 83,445,000 | 69,179,000 |
| ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | 10,420,600 | 30,724,100 |
| මූළධන 101 - පුනරුත්තාපන වැඩසටහන | 70,000,000 | 58,000,000 |
| මූළධන 102 වත්කම් අත්පත් කර ගැනීම | 39,500,000 | 246,000,000 |
| මූළධන 103 ස්ථිර ඉදිකිරීම් | 301,500,000 | 323,250,000 |
| වෙනත් මූළධන ප්‍රතිපාදන ( මහා භාණ්ඩාගාරය ) | 18,000,000 | 18,000,000 |
| වෙනත් විශේෂ ප්‍රතිපාදන ( වි වි ප්‍ර කො ) | 339,700,000 | 265,000,000 |
| වෙනත් විශේෂ ප්‍රතිපාදන ( උසස් අධ්‍යාපන අමාත්‍යංශය ) | 44,374,027 | |
| **එකතුව** | **1,822,441,627** | **1,857,653,100** |

| **පශ්චාද් උපාධි පාඨමාලා** | 2017 | 2016 |
|---|---|---|
| ව්‍යාපාර පරිපාලනපති පාඨමාලාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 13,912,000 | 12,853,545 |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 17,556,000 | 11,248,618 |
| **බාහිර උපාධි පාඨමාලා** | | |
| කෘෂිකර්ම කළමනාකරණ පාඨමාලාව – මාකඳුර | 22,369,000 | 20,096,993 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 9,992,000 | 9,415,172 |
| රක්ෂණ ඩිප්ලෝමාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 3,546,000 | 6,084,220 |
| රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | - | 1,525,050 |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව | 3,486,000 | 2,704,782 |

| | | |
|---|---|---|
| මෘදුකාංග පිළිබඳ ඩිප්ලෝමාව | 1,293,000 | 2,422,900 |
| බැංකු කරණය හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව | 89,000 | 1,564,580 |
| අහාර ව්‍යාපාර හා අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 163,500 | 63,000 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 854,700 | 1,138,400 |
| ඉගැන්වීමේ ක්‍රම සහ අධ්‍යාපන කළමනාකරණය පිළිබද උසස් ඩිප්ලෝමාව | 698,250 | 246,750 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | |
| බාහිර පරිගණක පාඨමාලා – මාකඳුර | 5,291,700 | 5,536,500 |
| බාහිර පුහුණු පාඨමාලා | 486,000 | 320,000 |
| **පර්යේෂණ ප්‍රතිපාදන** | | |
| NSF ප්‍රතිපාදන | 6,901,000 | 12,387,399 |
| CARP ව්‍යාපෘති | 1,253,670 | 777,300 |
| U.G.C (P.G.R) | 1,475,000 | 1,475,000 |
| පර්යේෂණ ප්‍රතිපාදන | | |
| NCAS ප්‍රතිපාදන | 500,000 | 1,212,900 |
| **අනෙකුත් ප්‍රතිපාදන** | | |
| WINC | - | 4,319,405 |
| **එකතුව** | **89,866,820** | **95,392,514** |

2. 2017 වර්ෂයේ වියදම මත ආදායම් අතිරික්තය රු 67,708,979.27 ක් විය මෙය 2016 වර්ෂයේදී රු 204,029,628.14 ක් විය. මෙය මූලික වශයෙන් ක්ෂය කිරීම් මත ගිණුම් ගැලපීම හේතුවෙන් වන තත්වයකි.
3. මෙම විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු වූවන් සඳහා ගෙවන ලද ණය සහ අත්තිකාරම් මගින් ඉතිරිය අයවිය යුතුය. එහි අගය රු 54,952,523.16 කි. මෙය 2016 වර්ෂයේ දී රු 52,502,719.38 ක් විය.
4. විශ්වවිද්‍යාලය මගින් අනුමැතිය නොලත් ආයෝජනය කරන ලද මුදල්වල අගය ශේෂ පත්‍රය සකසන අවස්ථාව වන විට රු 120,766,587.83 කි. මෙය 2016 වර්ෂයේ දී රු 89,611,825.04කි.
5. අභ්‍යන්තර ආදායම් ප්‍රභව

| 2016<br>Rs. | 2017<br>Rs. | වෙනස<br>Rs. | වෙනස ප්‍රතිශතයක් ලෙස<br>% |
|---|---|---|---|
| 33,782,521.25 | 29,680,524.65 | (4,101,996.60) | (12.14%) |

a. ශේෂ පත්‍රයේ දැක්වෙන අන්දමට විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම්වල අවසන් ශේෂය අදාල මුදල් පොත් සමග ප්‍රත්‍යා ගණනය කොට ඇත. අදාල බැංකු මගින් ඔවුන්ගේ අගයන් සනාථ කොට විගනකාධිපති වෙත දැනුම් දෙන ලෙස දන්වනු ලැබ ඇත. මෙම අගයන් කෙටි කාලීන ගනු දෙනුවලට සම්බන්ධව පවතී.

b. ශේෂ පත්‍රයේ සඳහන් තොග අගය රු 26,000,118.76 කි. මෙහි අගය සනාථ කළ යුත්තේ හිමිකම පවත්නා තොග අගය මතය. ප්‍රත්‍යාගණනය කරන ලද තොග අගයන් ගිණුම් ගත කොට ඇත.

c. ශේෂ පත්‍රයේ දැක්වෙන පරිදි කෙරෙමින් පවතින වැඩවල මූල්‍ය අගය 949,722,246.57 කි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව කෙරෙමින් පවතින වැඩ ඉදිරියට ගෙන ඇත.

d. 2017 සාමාන්‍ය ශේෂය රු 238,632,7861.03 කි. මෙය 2016 වර්ෂය හා සසඳන කල රු 1,251,680,421.15 කි. මෙය ක්ෂය කිරීම් ගැලපීම හා ග්‍රැට්විට් මත පදනම් වී ඇත. ශේෂ පත්‍රයේ මෙය සාමාන්‍ය ගිණුම් යටතේ සකසා ඇත. කෙසේ වුවද 2017 වර්ෂයේ ක්ෂය ගිණුමෙහි මෙය දැක්විය යුතුය. වාර්ෂික ගිණුම්වල ක්ෂය වීම් ගැලපීම පිළිබඳව විශ්වවිද්‍යාල විද්‍යාල ප්‍රතිපාදන

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 (1995 ඔක්තෝබර් 05 දිනැති ) හි සඳහන් වෙයි. සලකා බලන වර්ෂයේ අගයන් ඒ මත පදනම් වෙයි.
2016 වර්ෂයේ සමස්ත ක්ෂය අගය රු 383,187,605.53 කි.

e. 2017 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම යාමේ දී ගෙවනු ලබන පාරිතෝෂික ගෙවීමේ අගය රු 129,222,617.68 කි. මේවා පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාර වේ. මේ හා සමාන ආයෝජන දක්නට නොලැබේ.

**ආ <u>අය වැය පාලනය</u>**

ගත වූ වර්ෂය තුළ ඵලදායී මූල්‍ය කළමනාකරණ මෙවලමක් ලෙස අය වැය වැඩසටහන යොදා ගන්න ලදී.

ඇ වත්කම්, යන්ත්‍රෝපකරණ, ස්ථාවර වත්කම් ලේඛනය

විශ්වවිද්‍යාලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය සැකසීමේ ක්‍රියා මාර්ග අනුගමනය කරමින් පවතී.

ඈ ගිණුම් ප්‍රත්‍යාගණනය

සියලු පාලන ගිණුම් ප්‍රත්‍යාගණනය කොට ඇති අතර තොරතුරු ලේඛන සකසා මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කෙරේ

සාමාන්‍ය

අවසන් වශයෙන් ප්‍රකාශ කළ හැක්කේ විශ්වවිද්‍යාලය ගැටළු කිහිපයකට මුහුණපෑම හේතුවෙන් මිල ගණන් වෙනස් වීම් සහ විවිධ පාලනය කල නොහැකි තත්වයන් 2017 තුළ දක්නට ලැබුණු බවයි. කෙසේ වෙතත් ඒ සියලු බාධාවන් නොසලකා විශ්වවිද්‍යාලය තම ඉලක්කයන් කරා සාර්ථක අන්දමින් මෙහෙය වීම සඳහා අධ්‍යයන අනධ්‍යයන සහ උසස් අධ්‍යාපන වැඩසටහන් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක විය.

මහාචාර්ය ඊ එම් පී ඒකනායක

උපකුලපති

2017.02.27

## 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය

| | | 2017 දෙසැම්බර් 31 දිනට | | 2016 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | සටහන | | | | |
| බැංකු ගිණුම් ශේෂය | **1** | 131,630 | | 203,813 | |
| ඉතිරිකිරීම් තැන්පත් | **2** | 5,641 | | 10,049 | |
| වෙළඳ හා වෙනත් ලැබීම් | **3** | 391 | | 3,366 | |
| වට්ටෝරුගත/ගබඩාගත තොග | **4** | 26,000 | | 24,064 | |
| ඉදිරියට කළ ගෙවීම් | | 1,874 | | 2,965 | |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් | **5** | 345 | | 100 | |
| මූලධන අත්තිකාරම් | **6** | 292,783 | | 160,017 | |
| සේවා සහ සැපයුම් සඳහා අත්තිකා | **7** | 5,103 | | 7,423 | |
| අනෙකුත් ජංගම වත්කම් | **8** | 16,363 | | 20,011 | |
| | | | 480,130 | | 431,808 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දිගුකාලීන ආයෝජන | **9** | 120,767 | | 89,612 | |
| දේපල, පිරියත සහ උපකරණ | **10** | 5,149,281 | | 4,868,775 | |
| නොනිමි වැඩ | **11** | 949,722 | | 835,467 | |
| කාර්යය මණ්ඩල ණය | **12** | 54,952 | 6,274,722 | 52,503 | 5,846,357 |
| | | | | | |
| **වත්කම්වල එකතුව** | | | 6,754,852 | | 6,278,165 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| විවිධ ණය හිමියෝ | **13** | 115,026 | | 91,674 | |
| තැන්පත් | **14** | 5,611 | | 9,883 | |
| වියදම් ණය හිමියෝ | **15** | 26,236 | | 27,349 | |
| වෙනත් | **16** | 300,893 | 447,766 | 191,121 | 320,027 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| මූලධන - වැයවූ මූලධන ප්‍රතිපාදන | **17** | 2,193,507 | | 2,885,606 | |
| මූලධන - වැයවූ ප්‍රතිපාදන / නොප් | | 949,722 | | 835,467 | |
| වැය නොවූ මූලධන ප්‍රතිපාදන | **18** | 38,557 | | 67,905 | |
| විශේෂ ප්‍රතිපාදන | **19** | 1,567,384 | | 1,626,861 | |
| පරිත්‍යාග අරමුදල් | **20** | 1,402 | | 860 | |
| විශේෂ අරමුදල් | **21** | 53,063 | | 47,278 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 129,223 | 4,932,858 | 107,431 | 5,571,408 |
| **වගකීම්වල එකතුව** | | | **5,380,624** | | **5,891,435** |
| **ශුද්ධ වත්කම්වල එකතුව** | | | **1,374,228** | | **386,730** |
| ඒකාබද්ධ අරමුදල | | 238,634 | | (1,251,681) | |
| සංචිත | | 1,612,862 | 1,374,228 | 1,638,411 | 386,730 |
| **ශුද්ධ වත්කම්/කොටස්වල එකතුව** | | | **1,374,228** | | **386,730** |

.......................................................... .......................................... .......................................

(මහාචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා)
උපකුලපති

(ඩබ්. ඒ. ඩී. චිත්‍රානන්ද මයා)
ලේඛකාධිකාරී

(ඩී. ඒ. යූ. ධර්මදාස මයා)
මූල්‍යාධිකාරී

22 පෙබරවාරි 2018

# 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

| මෙහෙයුම් ආදායම | මෙම වර්ෂය 2017 (රුපියල් '000) | පසුගිය වර්ෂය 2016 (රුපියල් '000) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | 915,502 | 847,500 |
| ශිෂ්‍යාධාර සඳහා රජයේ ප්‍රතිපාදන | 10,421 | 30,724 |
| මහපොළ ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රතිපාදන | 83,445 | 69,179 |
| පුනරාවර්තන ප්‍රතිපාදන (පුනරුත්තාපන ස්වභාවයේ) | 22,212 | 16,695 |
| HETC ව්‍යාපෘතිය | - | 2,796 |
| ඍජයේ ප්‍රතිපාදන හා පරිත්‍යාග | 383,187 | 70,671 |
| ආයෝජන පොලිය | 8,520 | 6,769 |
| කාර්ය මණ්ඩල ණය පොලිය | 2,188 | 2,115 |
| දේපල කුලිය | 2,174 | 4,303 |
| පැරණි භාණ්ඩ අලෙවිය | 118 | 56 |
| එලදා විකිණීම | 608 | 417 |
| විවිධ ලැබීම් | 13,603 | 18,618 |
| ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 2,255 | 32 |
| විභාග ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 136 | 1,394 |
| පුස්තකාලයීය දඩ | 78 | 78 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | **1,444,447** | **1,071,347** |
| **මෙහෙයුම් වියදම (ක්ෂයවීම් ඇතුළුව)** | | |
| පුද්ගල වැටුප් හා වේතන (සටහන 01) | 738,120 | 645,616 |
| ගමන් වියදම් | 10,411 | 5,507 |
| සැපයුම් හා පාරිභෝජන | 43,165 | 40,861 |
| නඩත්තු | 21,301 | 15,556 |
| ගිවිසුම්ගත සේවා | 160,149 | 134,499 |
| ක්ෂයවීම් | 383187 | 256,798 |

| | | |
|---|---|---|
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 39,746 | 57,146 |
| මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් | 93,866 | 99,903 |
| පුනරුත්තාපන වියදම් (පුනරාවර්තන ස්වභාවයේ) | 14,819 | 11,489 |
| පර්යේෂණ වියදම් (පුනරාවර්තන ස්වභාවයේ) | 7,393 | 5,206 |
| HETC ව්‍යාපෘතිය | - | 2,796 |
| **සමස්ත මෙහෙයුම් වියදම** | **1,512,157** | **1,275,377** |
| **ශුද්ධ අතිරික්තය (ඌනතාව) ගත වූ කාලය තුළ** | **(67,710)** | **(204,030)** |
| ඉදිරියට ගෙනා පෙර වර්ෂ ශේෂය | 1,251,681 | 1,091,887 |
| වර්ෂයේ ඌනතාව | 67,710 | 204,030 |
| එකතු කිරීම් - පෙර වර්ෂයේ ආදායම් | | |
| වෙනත් ගැලපීම් | 1,085,452 | 44,236 |
| අඩු කිරීම් - පෙර වර්ෂයේ වියදම් | | |
| වෙනත් ගැලපීම් | (4,695) | |
| **ඉ/ගෙ පොදු සංචිතය** | **(238,634)** | **(1,251,681)** |
| සටහන 01 | | |
| වැටුප් හා වේතන | 288,658 | 200,897 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 20,438 | 15,634 |
| වෙනත් දීමනා | 317,964 | 349,113 |
| විශ්‍රාම ප්‍රතිලාභ (වි.වි.අ.අ., සේ.නි.භා.අ., විශ්‍රාම වැටුප්, පාරිතෝෂික) | 111,060 | 79,972 |
| **සමස්ත පුද්ගල ගෙවීම්** | **738,120** | **645,616** |

........................................................ (මහාචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා)
උපකුලපති

.......................................... (ඩබ්. ඒ. ඩී. චිත්‍රානන්ද මයා)
ලේඛකාධිකාරී

....................................... (ඩී. ඒ. යූ. ධර්මදාස මයා)
මූල්‍යාධිකාරී

## 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2017 දෙසැම්බර් 31 දිනට රු ' 000 | 2016 දෙසැම්බර් 31 දිනට රු ' 000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | | |
| අතිරික්තය/(ඌනතාවය) සාමාන්‍ය ක්‍රියාකාරීත්වය | 67,710 | 204,030 |
| **එකතු කිරීම්: සංචලනය නොවන මුදල්** | | |
| ක්ෂය | 383,187 | 256,798 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 27,103 | 15,743 |
| පාරිතෝෂික ගෙවීම් | 5,312 | 1946 |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් ලද ආදායම් | 718 | - |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් කළ ගෙවීම් | 31,280 | 873 |
| රජයේ ප්‍රතිපාදන හා පරිත්‍යාග | 383,187 | 70,671 |
| තොගයේ වැඩිවීම්/අඩුවීම් | 1,936 | 3816 |
| ණයගැතියෝ වැඩිවීම්/අඩුවීම් | 2,975 | 3706 |
| කාර්යය මණ්ඩල ණය වැඩිවීම්/අඩුවීම් | 2,449 | 954 |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | 245 | 8 |
| සැපයුම් සහ සේවා අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | 2,320 | 5159 |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | 1,091 | 1051 |
| ප්‍රාග්ධන අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | 132,766 | 72,397 |
| අනෙකුත් ජංගම වත්කම් වැඩිවීම්/අඩුවීම් | 3,648 | 2,889 |
| විවිධ ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | 23,352 | 26,191 |
| තැම්පත් වැඩිවීම්/අඩුවීම් | 4,271 | 6,851 |
| වියදම් ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | 1,112 | 9771 |
| අනෙකුත් ජංගම වගකීම් වැඩිවීම්/අඩුවීම් | 109,772 | 89,883 |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | 77,538 | 123,315 |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | **77,538** | **123,315** |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම් | 665,602 | (842,356) |
| සීමිත අරමුදල් ආයෝජන | 31,155 | (19,038) |
| කාර්ය ප්‍රගතිය | 114,255 | (177,589) |
| ඉතුරුම් තැන්පතු | 542 | (87) |
| **ශුද්ධ ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | 810,470 | (683,718) |
| **මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් | 70,000 | 58,000 |
| මූලධන ප්‍රතිපාදන - වත්කම් අත්පත්කර ගැනීම් | 39,500 | 246,000 |
| මූලධන ප්‍රතිපාදන - ස්ථිර ඉදිකිරීම් | 301,500 | 223,250 |
| මූලධන ප්‍රතිපාදන වෙනත් | 18,000 | 18,000 |
| මූලධන ප්‍රතිපාදන වි වි ප්‍ර කො ස | 339,700 | 265,000 |
| මූලධන ප්‍රතිපාදන අමාත්‍යංශය | 44,374 | - |
| වෙනත් ප්‍රතිපාදන - බාහිර වැඩසටහන් | 10,328 | 783 |
| මූලධන ප්‍රතිපාදන වෙනත් | 4,442 | - |
| විශේෂ ලැබීම් | 5,785 | 13,901 |
| පුනරාවර්තන ස්වාභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන | 22,212 | 16,695 |
| විශේෂ ප්‍රධාන | | |
| **ශුද්ධ මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | 811,417 | 908,239 |
| **ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)** | **76,591** | **101,206** |
| | **213,862** | **112,656** |
| | **137,271** | **213,862** |

| මුදල් සහ මුදල් සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය | 2017 දෙසැම්බර් 31 දිනට | 2016 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| මහජන බැංකුව කුලියාපිටිය - ගි. අ. 028100151586123 | 14,547 | 17,376 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000171 | 27,677 | 18,542 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140000165 | 3,140 | 1,077 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0002874770 | 15,382 | 30,068 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 00001473507 | 12,816 | 39,351 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473508 | 2,066 | 5,428 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473388 | 38,008 | 67,962 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000963 | 14,122 | 13,624 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100130041538 | 785 | 778 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140044857 | 676 | 9,541 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 137100230000165 | 2,411 | 65 |
| එකතුව | **131,630** | **203,812** |
| | | |
| ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 001 - 3 - 1548782 | **396** | **380** |
| සම්පත් බැංකුව - කුලියාපිටිය 102361000585 | **164** | **2,480** |
| ලංකා බැංකුව කුලියාපිටිය 76183365 | **1,030** | **2,771** |
| ලංකා බැංකුව කුලියාපිටිය 76183353 | **398** | **1,193** |
| ලංකා බැංකුව කුලියාපිටිය 76183339 | **487** | **333** |
| ලංකා බැංකුව කුලියාපිටිය 76183268 | **576** | **2,051** |
| ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 028200131586123 | **1,200** | **589** |
| ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 137-2001-1-0000171 | **1,387** | **253** |
| ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 137-2002-1-0044857 | **1** | **-** |
| ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 137-2002-0-0041538 | **1** | **-** |

| | | |
|---|---|---|
| ඉතුරුම් තැම්පතු - මහජන බැංකුව කුලියාපිටිය 137-2001-2-0044857 | **1** | **-** |
| | **5,641** | **10,050** |

| | | |
|---|---|---|
| සමස්ත මූල්‍ය හා මුදල් හා සමාන දෑ | **137,271** | **213,862** |

**දේපල් යන්ත්‍ර හා උපකරණ**

අදාළ කාලසීමාවේ එකතුවීම් පහත පරිදි වේ

| | |
|---|---|
| ඍජයේ ප්‍රදාන – මූලධන | **665,601,511** |

**විශේෂ ප්‍රදාන**

| | |
|---|---|
| ප්‍රදාන – කාර්යාලීය උපකරණ | **51,900** |
| සමස්ත එකතුව | **665,653,411** |

| | | |
|---|---|---|
| ....................................................... | .......................................... | ....................................... |
| (මහාචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා)<br>උපකුලපති | (ඩබ් ඒ. ඩී. චිත්‍රානන්ද මයා)<br>ලේඛකාධිකාරී | (ඩී. ඒ. යූ. ධර්මදාස මයා)<br>මූල්‍යාධිකාරී |

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } එන්ඩබ්ලිව්පී/පීටී/බී/ඩබ්ලිව්යූ/01/2017/70

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 10 දින.

උපකුලපති,

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නාලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් පිළියෙල කරන බවට ගිණුම් ප්‍රතිපත්ති මගින් අනාවරණය කර තිබුණද, ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ පවත්වාගෙන යනු ලබන බාහිර පාඨමාලා මගින් ලැබෙන ආදායම් මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නැනෝ තාක්ෂණ විද්‍යාගාරය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2016 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 1,742,595 ක අත්තිකාරම් මුදල, 2017 මැයි 18 දින කොන්ත්‍රාත්කරු විසින් පියවා තිබුණද, එම මුදල සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් අයවිය යුතු අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය හා මාකඳුර පරිශ්‍රවල වූ වෛද්‍ය මධ්‍යස්ථානවල 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 93,643 ක් වූ ඖෂධ තොග අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයට අදාලව, මාකඳුර පරිශ්‍රයේ සවිකර ඇති දුරකථන කුළුණ සඳහා එම ආයතනයෙන් ලැබියයුතු බදුකුලී සහ විදුලි ගාස්තු පිළිවෙලින් රු.42,350ක් සහ රු.169,510 ක්ද පිරිසිදු කිරීමේ ආයතනයට ගෙවිය යුතු රු. 1,229,656 ක්ද ගිණුම් ගත කිරීම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ) ප්‍රාග්ධන ප්‍රදානවලින් මිලදී ගත් වත්කම් ක්‍රම ක්ෂය කිරීමේදී එම වත්කමට අදාල ප්‍රදාන වටිනාකමට ක්‍රම ක්ෂය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රමක්ෂය ගණනය කිරීම, ගොඩනැගිලි හැර වත්කම්වල ප්‍රත්‍යාගණන අගය මත සිදු කිරීම නිසා රු.68,697,000 ක් වැඩියෙන් ක්‍රමක්ෂය ගැලපීම් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රු.253,891,149 ක් වූ වියදම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

වටිනාකම රු.408,276,027 ක් වූ ඉඩම් අක්කර 37 රූඩ් 02 පර්චස් 04 ක් සම්බන්ධයෙන් ඔප්පු / පැවරුම් නියෝග විගණනයට ඉදිරිපත් නොවිය.

### 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ ණයගැති සහ නේවාසිකාගාර ගාස්තු පිළිවෙලින් රු. 31,330 ක් සහ රු. 261,867 ක් වර්ෂ 04 සහ වර්ෂ 7 ත් වර්ෂ 13 ත් අතර කාල පරාසයක සිට හිඟව පැවතුනි.

(ආ) එකතුව රු.159,740 ක් වූ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල ණය ශේෂ 03 ක් වර්ෂ 09 කට වැඩි කාලයක සිට අයවීමකින් තොරව පැවතුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම්වල දැක්වෙන වර්ෂ 01 සිට වර්ෂ 02 දක්වා සහ වර්ෂ 02 ට වැඩි පිළිවෙලින් රු. 352,850 ක් හා රු.374,270 ක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 වගන්තිය හා 2005 ජූලි 13 දිනැති අංක 30 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පත්වල රු.26,000,000 ක් ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 770 හා 772 | දීර්ඝ කාලයක් තිස්සේ නිකුත් නොවන සහ භාවිතයට නොගන්නා වටිනාකම රු.428,452 ක්වූ තොග අයිතම 74 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිතවන අරමුදල් භාවිතය සඳහාවන මගපෙන්වීම අනුව පිරිවැය ආවරණය සහ ලාභදායි නොවන පදනම මත ස්වයං මූල්‍ය පාඨමාලා පවත්වා ගතයුතු වුවත් පාඨමාලා 17 ක වියදම් ඉක්මවා රු.21,668,562 ක අතිරික්තයක් ඇති වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.7,295,596 ක්වූ පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2016 අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබා දී තිබුණු රු.50,000,000 ක් වූ මුදලින් ඉතිරිව තිබූ රු. 21,148,762 ක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව වත්කම් අත්පත් කරගැනීම සඳහා වැයකර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 67,708,979 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 204,029,628 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම රු.136,320,649 කින් අඩුවී තිබුණි. ක්ෂය රු.126,389,000 කින් වැඩිවුවද ක්‍රමක්ෂය හා පරිත්‍යාග රු.312,516,000 කින් වැඩිවීම ඉහත පිරිහීම අඩුවීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.135,852,595 ක්වූ ඌනතාවය උච්ඡාවචනයන් සහිතව සමාලෝචිත වර්ෂයේදී රු.67,708,979 ක ඌනතාවයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.371,793,368 ක්වූ මණ්ඩලයේ හිතකර දායකත්වය 2017 වර්ෂයේදී රු.1,071,768,057 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2004 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016/17 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ පීඨ 05 ක් සඳහා බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 1245 ක් වුවත් එම අධ්‍යයන වර්ෂ සඳහා බඳවාගෙන තිබුණේ සිසුන් 1084 ක් එනම් සියයට 87 කි. පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨය සඳහා 2016/17, 2015/16 හා 2014/15 අධ්‍යයන වර්ෂ සඳහා බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 170 ක් වුවත් බඳවාගෙන තිබුණේ පිළිවෙලින් 91 , 89, 94 දෙනෙකු ලෙස ඉතා අඩු සිසුන් ප්‍රමාණයක් එනම් සියයට 55 කට අඩු ප්‍රතිශතයකි.

(ආ) විශ්වවිද්‍යාලයේ එකිනෙක පීඨයන්හි 2017 වර්ෂයේ උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාවද, සම්මත හා තථ්‍ය අනුපාතයන්ද පහත දැක්වේ.

| පීඨය | උපාධි අපේක්ෂක සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය | | අනුපාතයන් | |
|---|---|---|---|---|---|
| | | සම්මත | තථ්‍ය | සම්මත | තථ්‍ය |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 602 | 60 | 39 | 10:1 | 15:1 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 642 | 64 | 40 | 10:1 | 16:1 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 1853 | 103 | 35 | 18:1 | 53:1 |
| පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 455 | 46 | 35 | 10:1 | 13:1 |
| තාක්ෂණ පීඨය | 311 | - | 04 | - | - |

විශ්වවිද්‍යාලය විසින් පවත්වාගත යුතු ශිෂ්‍ය හා ආචාර්යවරුන්ගේ අනුපාතය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති අතර, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සම්මත හා තථ්‍ය කාර්ය මණ්ඩල විචලනයේ අනුපාතය සියයට 194 ක් වැනි ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී සමාජගතව සිටින උපාධිධාරීන්ගෙන් ලබාගෙන තිබූ තොරතුරු අනුව උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | රැකියාවක නියුක්ත ප්‍රතිශතය සියයට |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 58 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 77 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 62 |
| පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 79 |

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) උපාධිධාරීන්ගේ ඉහත සේවානියුක්තිය පිළිබඳ සමීක්ෂණය අවසන් වසර විභාග නිමවී මාස 02 ක්වූ සුළුකාලයක් තුල සිදුකර තිබුණු අතර, ලබාගෙන තිබූ අදාළ දත්ත මගින් සිසුන්ගේ රැකියා නියුක්තිය හා වියුක්තිය පෙන්නුම් කළද තමන් විසින් ලබාගෙන තිබූ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව රැකියාවල නියුක්තිය ගණනය කර නොතිබුණි.

(ii) ලෝක ශ්‍රේණිගත කිරීම් (World if Universities Ranking) සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව 2016 වර්ෂයේදී වයඹ විශ්වවිද්‍යාලය පිළිවෙලින් 5409 හා 10 වන ස්ථාන හිමිකරගෙන තිබුණු අතර, 2017 වර්ෂයේදී පිළිවෙලින් 5791 හා 08 වන ස්ථාන හිමිකරගෙන තිබුණි.

(iii) 1999 වර්ෂයේදී ආරම්භ කර තිබෙන පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයෙන් 2013 වර්ෂය වනවිට උපාධිධාරීන් 350 ක් සිය උපාධි පාඨමාලා අවසන් කර තිබුණද, පෝෂණවේදීන් වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට බඳවාගෙන තිබෙන ප්‍රමාණය 18 දෙනෙකු පමණක් වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන 02 (කුලියාපිටිය හා මාකඳුර) සඳහා වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකුගේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණද ස්ථිරව එක් වෛද්‍ය නිලධාරියෙකු හෝ බඳවාගෙන නොතිබුණි. කෙසේ වුවද, වෛද්‍ය මධ්‍යස්ථානය මගින් සිදුකල යුතු ප්‍රතිකාර කටයුතු කුලියාපිටිය රෝහලෙන් ගෙන්වා ගත් වෛද්‍යවරයෙකු මගින් සිදුකරන අතර ඒ වෙනුවෙන් එම වෛද්‍යවරයා වෙත සමාලෝචිත වර්ෂයේදී රු.1,690,000ක් ගෙවා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ බැංකු ජංගම ගිණුමකට අදාලව සමාලෝචිත වර්ෂයේදී සෘජු ලැබීම් රු.124,500 ක්වූ අතර ඒවා හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තක්සේරු වටිනාකම රු. 3,835,000 ක්වූ පර්චස් 711 ක ඉඩම් කොටස් 08 ක් පවරා ගැනීම වෙනුවෙන් 2013 වර්ෂයේදී රු. 1,013,750 ක් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත තැන්පත් කර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකෙරෙමින් පවතින රු. 77,872,750 කට තක්සේරු කර ඇති අක්කර 28 පර්චස් 12.84 ක භූමිය පවරා ගැනීමේ කටයුතු සඳහා විශ්වවිද්‍යාලය විසින් 2016 වර්ෂයේදී රු.16,500,000 ක් කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබූ අතර, අදාල පවරා ගැනීමේ කටයුතු 2017 වර්ෂය අවසන් වන විටද නිම වී නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය හා කාර්යමණ්ඩල නේවාසිකාගාර ඉදිකිරීම සඳහා මාකඳුර පරිශ්‍රයේ අක්කර 05 ක මහයාය වත්ත ඉඩම මිළ දී ගැනීම සඳහා 2013 ජුලි 10 දින පොල් පර්යේෂණ ආයතනය වෙත රු.මිලියන 10 ක් ගෙවා තිබුණද ඒ සඳහා විකුණුම්කර ඔප්පුවක් ලබාගෙන නොතිබුණි.

(ඊ) වර්ෂ 03 ක පර්යේෂණ කාලයක් තුල කටයුතු කර පර්යේෂණ වාර්තා ලබාදීමේ එකඟතාවය මත 2014 වර්ෂයේදී රු.324,535 ක්වූ පර්යේෂණ දීමනා ලබාගෙන තිබූ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකාවක් සිය පර්යේෂණ කාලය අවසන්ව තිබුණද, 2018 අගෝස්තු මාසය වන විටත් පර්යේෂණ වාර්තාව විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන අනුමත කාර්යමණ්ඩලය පිළිවෙලින් 376 දෙනෙක් හා 491 දෙනෙක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 284 දෙනෙක් හා 373 දෙනෙක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 94 දෙනෙක් හා 119 දෙනෙක් වූ අතර අතිරික්තය පිළිවෙලින් 03 දෙනෙක් හා එක් අයෙකු විය.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද 2017 වර්ෂයේ කාර්ය මණ්ඩල වාර්තාව අනුව සමස්ථ කාර්ය මණ්ඩල පුරප්පාඩුව සියයට 25 ක් වන අතර ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය සියයට 29 ක් පුරප්පාඩු වී තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට අත්‍යවශ්‍ය වූ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල අවශ්‍යතාවය අධ්‍යයනය කර, කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාවක් සකස් කර තිබුණද 2018 වර්ෂයේදී සිසුන් 75 ක් බඳවා ගැනීමට නියමිතව ගොඩනැගිලි ඉදිකෙරෙමින් පවතින වෛද්‍ය පීඨය සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සමාලෝචනය කර බඳවා ගැනීම් සඳහා සැළසුම් පිළියෙල කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී කුලියාපිටිය පරිශ්‍රයේ හා මාකඳුර පරිශ්‍රයේ පවත්වාගෙන යන තාක්ෂණ පීඨයට අදාළ තාක්ෂණවේදී පාඨමාලා 03 ට බඳවාගෙන තිබූ සිසුන් සංඛ්‍යාව 234 ක් වූ අතර ඉදිරි වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී සිසුන් 246 ක් ලියාපදිංචි කර තිබුණි. එහෙත් එම පාඨමාලා සඳහා අවශ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලය තීරණය කර නොතිබුණි.

4.4 නිෂ්ක්‍රීය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.500,000 ක්වූ වෑන් රථයක් 2014 වර්ෂයේ සිට ධාවන කටයුතු සඳහා යොදවා නොගෙන විශ්වවිද්‍යාල පරිශ්‍රයේ නවතා තිබුණි.

(ආ) මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා 2015 වර්ෂයේදී රු.680,042 ක්වූ වෛද්‍ය උපකරණ මිලදීගෙන තිබු අතර එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව වයඹ විශ්විද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

6.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව මගින් ආයතනයේ විෂයපථයට සමගාමීව සහකාර අභ්‍යන්තර විගණන නිළධාරියෙක් හා විගණන සහායකයින් 04 දෙනෙකු නිර්දේශ කර තිබුණද වරින් වර වැඩ බැලීමේ පදනමින් සහකාර අභ්යන්තර විගණන නිලධාරියෙකු හා විගණන සහායකයෙකු පත් කර තිබුණි. මෙලෙස අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට බාධාවක් වී තිබුණි.

(ආ) 2015 හා 2016 වර්ෂවල විගණන වැඩසටහන් අනුව ශිෂ්‍ය ඉගැන්වීම් කටයුතු සඳහා කථිකාචාර්යවරුන් යෙදවීම පිළිබඳ පරීක්ෂාව හා ඇගයීම සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් ගෙවීම්වලට අදාල වවුචර් හා ලිපිගොනු අවසන් ගෙවීමට ප්‍රථම පරීක්ෂාකරද නොතිබුණි.

## 6.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කර්මාන්ත 24 ක 2016 දෙසැම්බර් 31 දිනට නොනිම් වැඩ වටිනාකම රු.68,661,154 ක් ලෙස පැවති අතර සමාලෝචිත වර්ෂයේදී එහි කිසිදු ප්‍රගතියක් දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ නිමකර තිබූ රු.26,516,869 ක ගොඩනැගිලි දැනට භාවිතයේ පැවතියද ඒවා අදාල වත්කම් ගිණුම්වලට මාරු කිරීමට පියවර නොගෙන නොනිම් වැඩ ලෙස තවදුරටත් දක්වා තිබුණි.

(ඇ) ව්‍යවහාරික විද්‍යාපීය ගොඩනැගිල්ල ඉදිකිරීම

2014 ජූලි 10 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත්කරු ඉදිරිපත්කල පිරිවැය ඇස්තමේන්තුව අනුව පිරිවැය රු.315,250,260 ක්වූ ව්‍යවහාරික විද්‍යාපීය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2014 අගෝස්තු 29 සිට 2016 මාර්තු 29 දක්වා වූ කාලරාමුව තුල සිදුකළ යුතු බවට දන්වා තිබුණද 2016 මාර්තු 29 දින වනවිට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 සැප්තැම්බර් 02 දිනැති අංක එම්ඊ/පීආර්/එම්ඕඑච්ඊ/ජීඊඑන් දරන ලිපිය ප්‍රකාරව ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාලය තුල ඉදිකිරීම් කටයුතු නිමකර නොමැති විට විශ්වවිද්‍යාලයේ උපකුලපතිට මාස 02 ක් දක්වා පමණක් කාල දිගු ලබාදිය හැකි වුවත්, අදාල කර්මාන්තයේ

තවදුරටත් නිමකළ යුතු වැඩ කොටස් හා ඒවා නිමකරන ආකාරය දැක්වෙන විස්තරයක්ද ලබා නොගෙන පළමු කාල දිගුව 2016 සැප්තැම්බර් 30 දක්වා මාස 06 ක් හා දෙවන කාල දිගුව 2016 සැප්තැම්බර් 31 දක්වා මාස 3 ක් වශයෙන් උපකුලපති විසින් දින දීර්ඝ කිරීම් අනුමත කර තිබුණි.

(iii) කොන්ත්‍රාත්කරු විසින් 2016 නොවැම්බර් 26 දින සිට 2016 දෙසැම්බර් 30 දක්වා කාලය තුල ඉටුකල වැඩ ඇතුලත් කර ඉදිකිරීම් නිමකල බවට 2017 මැයි 08 දින අවසන් බිල්පත් ඉදිරිපත් කර තිබුණද ඒ වනවිට වැඩ අයිතම 16 ක සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක ඉටු නොකල වැඩ පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු නිමකර භාරදිය යුතු මෙම ගොඩනැගිල්ලේ වැඩ අයිතම 16 ක ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබියදී 2018 මැයි 08 දිනය සැලකූ විට ප්‍රමාද ගාස්තුව ලෙස රු.31,525,026 ක් අයකල හැකිව තිබියදී එය නොසලකා මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.315,250,260 ක් ආවරණය වන පරිදි 16 වන අතුරු ගෙවීම ලෙස 2017 මැයි 08 ඉදිරිපත් කල බිල්පත සංශෝධනය කරමින් රු.13,913,000 ක් ගෙවීම්කර තිබුණි.

(v) ගොඩනැගිල්ලේ දුරකථන සහ ජාලගත පද්ධතිය (Network System) සඳහා වූ කටයුතු මහල් දෙකක පමණක් සිදුකර අදාල වැඩ විෂයය අත්හැර දමා තිබුණද, ඒ වෙනුවෙන් ඇස්තමේන්තුගත රු.1,775,000 ක්වූ මුළු මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(vi) ශ්‍රවනාගාරය ඇතුළත සම්පූර්ණ කළයුතු වැඩ කොටස් 3 ක් වෙනුවෙන් රු.3,800,000 ක් ගෙවා තිබුණද, එම කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

(vii) විෂයය අංක 32 අනුව රු.10,972,000 ක් ගෙවා තිබෙන ගොඩනැගිල්ලේ ඇතුළත වෙන්කිරීම් 3mm ඝණකම සහිත Compsite Board 02 කින් නිමකල යුතු වුවත්, ඊට අඩු ඝණකමින් යුත් Board ඒ සඳහා භාවිතා කර තිබුණි.

(viii) විෂයය අංක 38 අනුව Rain Water Disposal System වැඩ විෂයය සඳහා රු.1,977,437 ක්වූ මුළු මුදලම ගෙවා තිබුණද, අදාල කාර්යය සම්පූර්ණ කර නොතිබුණි.

## 6.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් සමාගමක් සමග 2014 අගෝස්තු 17 දිනට නිම කිරීමේ එකඟතාවය මත 2013 ජනවාරි 17 දින රු.14,485,175 ක බදු රහිත වටිනාකමට ගිවිසුමකට එළඹ තිබුණි. අවස්ථා කිහිපයකදී අත්හැර දමනලද මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණීම හෝ ගිවිසුම් අවලංගු කර වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු ලවා කඩිනමින් ඉදිකිරීම් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම්ගත වටිනාකම රු.86,552,870 කින් නිමකිරීම සඳහා 2014 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර තිබුණු පරිපාලන ගොඩනැගිල්ලේ කටයුතු 2017 වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබුණි.

## 6.5 අයවැය පාලනය

2016 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්කර නොතිබූ රු.52,282,156 ක්වූ ගෙවීම් පියවීම සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේද ප්‍රතිපාදන සළසාගෙන නොතිබුණි.

## 6.6 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශගත වී නියමිත කාලය තුල ආපසු නොපැමිණි කථිකාචාර්යවරු දෙදෙනෙකුගෙන් 2011 වසරේ සිට අයවිය යුතු රු.3,172,714 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2017 නොවැම්බර් 28 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවේ නියෝගයට අනුව පීඨ මගින් පවත්වාගෙන යන ස්වයං මූල්‍ය පාඨමාලාවලට අදාල ගිණුම්වල රු. 123,292,960 ක් වූ ශේෂයන් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ඉඩම්වල අයිතිය පවරා නොගැනීම හා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කරවා ගැනීමට කටයුතු නොකිරීම හා ඉදිකිරීම් වලට අදාළව නිම කරන ලද වැඩ වල වටිනාකම සඳහා බිල්පත් කඩිනමින් ලබාගෙන නිරවුල් කිරීමට හා වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | එක් එක් පීඨ සඳහා බඳවා ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව බඳවාගෙන නොතිබීම |
| (ඈ) | අයවැය පාලනය | ලැබී තිබෙන ප්‍රතිපාදන උපයෝජනය කරන ආකාරය දැක්වෙන පරිදි අයවැය ලේඛනය පිළියෙල කර නොතිබීම |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් බඳවා නොගැනීම ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට බාධාවක් වීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

(ආ) 2017 නොවැම්බර් 28 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවේ නියෝගයට අනුව පීඨ මගින් පවත්වාගෙන යන ස්වයං මූල්‍ය පාඨමාලාවලට අදාල ගිණුම්වල රු. 123,292,960 ක් වූ ශේෂයන් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ඉඩම්වල අයිතිය පවරා නොගැනීම හා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කරවා ගැනීමට කටයුතු නොකිරීම හා ඉදිකිරීම් වලට අදාළව නිම කරන ලද වැඩ වල වටිනාකම සඳහා බිල්පත් කඩිනමින් ලබාගෙන නිරවුල් කිරීමට හා වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | එක් එක් පීඨ සඳහා බඳවා ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව බඳවාගෙන නොතිබීම |
| (ඈ) | අයවැය පාලනය | ලැබී තිබෙන ප්‍රතිපාදන උපයෝජනය කරන ආකාරය දැක්වෙන පරිදි අයවැය ලේඛනය පිළියෙල කර නොතිබීම |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් බඳවා නොගැනීම ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට බාධාවක් වීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** 2018/08/10 දින C 24 ජ'නල් වවුචරය මගින් මෙය නිවැරදි කර ඇත.

**(ආ)** 2017/12/31 දිනට කුලියාපිටිය හා මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථාන දෙකෙහි තොග සමීක්ෂණයක් සිදු කර නැති අතර 2018/08/08 දිනට සිදු කරන ලද තොග සමීක්ෂණයට අදාළ වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. 2018/12/31 දිනට වෛද්‍ය මධ්‍යස්ථාන දෙකෙහි තොග සමීක්ෂණය සිදු කළ පසු අදාළ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** **මොබිටෙල් ආයතනයෙන් ලැබිය යුතු බදු කුලිය රු: 42,350.00**

2017 දෙසැම්බර් - රු. 42,350.00 - 2018.01.24 ලැබී ඇති අතර 2018 වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත.

**මොබිටෙල් ආයතනයෙන් ලැබිය යුතු විදුලි ගාස්තු රු: 169,510.00**

2017 ජූලි-දෙසැම්බර් - රු. 169,510.000 – 2018 මැයි මස ලැබී ඇති අතර 2018 වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත.

**පිරිසිදු කිරීමේ ආයතනයට ගෙවිය යුතු ගාස්තු - රු. 1,229,656.00**

2017 දෙසැම්බර් - රු. 1,229,656.00 - මාකඳුර පරිශ්‍රය පිරිසිදු කිරීමට අදාළ මෙම බිල්පත 2018 වර්ෂයේ වියදමක් (වවුචර් අංක 279) ලෙස ගිණුම්ගත කර ඇත.

**(ඈ)** මේ පිළිබඳ තොරතුරු සොයා බලා අදාළ නිවැරදි කිරීම් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඉ)** මෙම අගයන් ලබාගත් ආකාරය පිළිබඳව සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

මේ වන විට වයඹ විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරාගත් සියළුම ඉඩම්වලට අදාළ පැවරුම් නියෝග විගණන අංශයට ලබා දී ඇත. භුක්ති විදින එහෙත් නීත්‍යානුකූල අයිතිය ලබාගෙන නැති අනෙකුත් ඉඩම් පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

### 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

**(අ) ණයගැති ශේෂය රු: 31,330.00**

- බැංකු අණකරයක් වෙනුවෙන් බැංකුව දෙවරක් මුදල් අයකර ගැනීම හේතුවෙන් ලැබිය යුතු රු: 18,430.00 ක මුදලක් වේ. 2018 වර්ෂයේ දී බැංකුව විසින් මෙම මුදල විශ්වවිද්‍යාලයට ගෙවන ලදී.

- රු: 12,900.00 මෙම අගය කපාහැරීමට මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

**නේවාසිකාගාර ගාස්තු රු. 261,867.00**

නේවාසික සිසුන් විසින් අදාළ නේවාසිකාගාර දඩ මුදල් හෝ වෙනත් අයවීම් සෑම අධ්‍යයන වර්ෂයක් අවසානයේ දී ම ගෙවා නිම කළ යුතු බවට 178 වන පාලක සභාවේ දී තීරණය වූ අතර ඒ පිළිබඳව සිසුන් දැනුවත් කර ඇත.

කෙසේ වුව ද, සිසුන් විශ්වවිද්‍යාල උපාධි සහතිකය ලබා ගැනීමේ දී මෙම දඩ මුදල් අය කරගනු ලැබේ. විශ්වවිද්‍යාලය හැර ගිය හෝ උපාධිය අවසන් නොකළ, මේ දක්වා ශේෂව ඇති වටිනාකම් උපරිම වර්ෂ 08 ක් දක්වා ශේෂව ඇත්නම් එම වටිනාකම කපා හැරීමට 60 වන විගණන කමිටුවේ දී තීරණය විය.

ඒ අනුව, රු. 261,867/- ක් වූ වටිනාකමකින් රු. 197,633.66 ක් වූ වටිනාකම අය කර ගත නොහැකි සේ පොත් වලින් කපා හැරීමට 62 වන විගණන කමිටුවේ දී තීරණය වූ අතර ඒ සම්බන්ධයෙන් වූ සංදේශය 2018.08.23 දින පැවති 119 වන මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**(ආ) විශ්වවිද්‍යාල කාර්‍ය මණ්ඩල ණය ශේෂ**

| | |
|---|---|
| ටී.එම්.සී.පී. ගුණසේකර | - රු: 118,320.00 |
| ඩබ්.පී. ප්‍රියදර්ශනී | - රු: 41,500.00 |
| | රු; 159,820.00 |

ඉහත ආචාර්යවරුන් විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත් වී ඇති බැවින් මෙම ණය ශේෂයන් ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී අඩු කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ)

| | වර්ෂ 1-2 දක්වා | වර්ෂ 2 ට වැඩි |
|---|---|---|
| විවිධ ණයහිමියෝ | 84,285.00 | 3,100.00 |
| Refundable Tender Deposits | 263,400.00 | 26,950.00 |
| ආරක්ෂක තැන්පතු | 5,200.00 | 344,219.00 |
| එකතුව | 352,885.00 | 374,269.00 |

- ඉහත රු. 3,100.00 ක මුදල වෙනත් විශ්වවිද්‍යාලවල සිට මෙම විශ්වවිද්‍යාලයට පැමිණි ශිෂ්‍යයන්ගේ ලියාපදිංචි ගාස්තු වේ. අදාළ ගාස්තු ශිෂ්‍යයන් වෙත මේ වන විට ගෙවා ඇත

- රු. 84,285.00 ක මුදල බැංකුව වෙත ලැබී ඇති සෘජු ලැබීම් වන අතර මෙතෙක් හඳුනා ගැනීමට නොහැකි වී ඇත. එබැවින්, මේ පිළිබඳව මුදල් කමිටුවට ඉදිරිපත්කර අදායමට ගැනීමට කටයුතු කරන ලදී.

- ටෙන්ඩර්කරුවන් විසින් විශ්වවිද්‍යාලයට ගෙවා ඇති ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු හා ආරක්ෂක තැන්පතු වලට අදාළ මුදල් මේ යටතේ දක්වා ඇත. මෙම මුදල් 2018/12/20 දින පැවති 123 වන මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර ආදායමට ගැනීමට කටයුතු කරන ලදී.

## 2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

### (අ) 1978 අංක16 දරණ විශ්වවිද්‍යාල පනතේ 45 වගන්තිය හා 2005 ජූලි 15 දිනැති අංක 30 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

මෙම ආයෝජනයට පාලක සභාවේ අනුමැතිය ලැබී ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට අදාළ ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.

### (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

**(i) මු.රෙ. 770 හා 772**

මේ පිළිබඳව සිදුකල පරීක්ෂාවේ දී කුලියාපිටිය ප්‍රධාන ගබඩාවේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස රු: 173,144.02 ක් වටිනා අයිතම 09 ක් ඇති අතර ප්‍රයෝජනයට ගත හැකි නමුත් දීර්ඝකාලීනව නිකුත් නොවන භාණ්ඩ ලෙස රු: 1,826.00 ක් වටිනා අයිතම 06 ක් ඇති බව නිරීක්ෂණය විය. ඉතිරි වටිනාකම මාකඳුර සහ කුලියාපිටිය නඩත්තු ගබාඩාවල දීර්ඝ කාලයක් නිකුත් නොවී පවතින භාණ්ඩ වේ.

මෙම භාණ්ඩ ඒ පිළිබඳ දැනුමක් ඇති මණ්ඩලයක් විසින් පරීක්ෂාකර මුදල් රෙගුලාසි 770 හා 772 අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

**(ඇ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ - රු. 21,668,562/-**

ස්වයං මූල්‍ය පාඨමාලාවලින් ජනිත වන අතිරික්ත මුදල්, එම පාඨමාලා පවත්වාගෙන යනු ලබන අංශයේ/පීඨයේ සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කෙරේ.

**(ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය– රු.7,295,596/-**

පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන නොගිය ද, විශ්වවිද්‍යාලය සතු ස්ථාවර වත්කම් ලේඛණය තුළ පරිගණක හා පරිගණක උපාංග ද ඇතුළත් වේ.

ඉදිරියේ දී 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.

**2.5 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>**

2016 අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් රුපියල් මිලියන 50 ක් මූලධන ප්‍රතිපාදන ලෙස ලැබුණු අතර එයින් වැය කළ මුදල රු: 28,851,237.63 කි. එමෙන්ම 2016 වර්ෂයේ විශ්වවිද්‍යාලයීය අය වැය අනුව වෙන් කළ පුනරාවර්තන ප්‍රතිපාදන තුළින් වැය කළ මුදල රු: 23,676,564 කි. ඒ අනුව ඉතිරි මූලධන මුදල වූ රු: 21,148,762,.37 භාවිතා කර විශ්වවිද්‍යාලයට අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට 2017 අගෝස්තු මස පැවති 110 වන මුදල් කමිටු අනුමැතිය ලබාගෙන ඇත. (FC 110.19)

**3. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

නිරීක්ෂණයන් හා එකඟ වේ.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

### 4.1.1 සැලසුම් කිරීම

2017-2021 වර්ෂ 05 සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ 2017 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් කර ඇති අතර 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නැත. 2018 වර්ෂයේ සිට විධිමත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇත.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

**(අ) පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ විද්‍යාවේදී ආහාර විද්‍යාව හා පෝෂණය සහ ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය උපාධි පාඨමාලා දෙක සඳහා 2016/17 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 173 ක් ද, 2015/16 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 90 ක් ද, 2014/15 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 94 ක් ද වශයෙන් සිසුන් බඳවා ගෙන ඇත. ඒ අනුව, මෙම කරුණ යටතේ සඳහන් කොට ඇති දත්තයන් නිවැරදි නොමැති බව සඳහන් කරන අතර 2016/17 අධ්‍යයන වර්ෂය සඳහා අනුමත සිසුන් සංඛ්‍යාව 195 ක් (ආහාර විද්‍යාව හා පෝෂණ උපාධිය 110 ක් සහ ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය උපාධිය 85 ක් වශයෙන්) වුව ද එයින් අදාළ උපාධි දෙක සඳහා සිසුන් 173 ක් බඳවාගෙන ඇති නිසා එහි ප්‍රතිශතය 89% ක් පමණ වේ. ඒ අනුව, එම කරුණ යටතේ 2016/17 අධ්‍යයන වර්ෂය සඳහා සඳහන් ප්‍රතිශතය 55% ඉක්මවා ඇත.

තවද, සිසුන් බඳවා ගැනීම ආරම්භ වූ අවස්ථාවේ සිට වරින් වර ඒ බව දැනුම් දෙනු ලබන අතර උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන බැවින් පීඨයට පාලනය කර ගත නොහැකි බව නැවතත් සඳහන් කරනු කැමැත්තෙමි.

කෙසේ වෙතත්, 2018 වර්ෂයේ සිට එක් එක් පීඨවලට අනුමත ශිෂ්‍ය සඛ්‍යාවට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉල්ලීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරනු ලැබූ අතර එමගින් පීඨ සඳහා අනුමත මුලු ශිෂ්‍ය සංඛ්‍යාවම බඳවා ගැනීමට හැකි වී ඇත.

**(ආ) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයට අලුතින් ආචාර්යවරුන් බඳවා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලැබුණු විගස බඳවා ගැනීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

**(ඇ)**

**(i)** වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් යම් නිශ්චිත වෘත්තියක් සඳහා පමණක් නිර්මාණය කරනු නොලබන අතර පුළුල් පරාසයක රැකියාවන් අරමුණු කරගෙන අදාළ

පාඨමාලාවන් සකස්කර ඇති හෙයින් පාඨමාලාව රැකියාවට අදාළවන ප්‍රමාණය පමණක් ලබා ගැනීම ප්‍රායෝගික වේ. එම නිසා මෙම සමීක්ෂණයෙන් සියළු පීඨවල අධ්‍යයන පාඨමාලාවන්ට අදාළ රැකියා නියුක්තිය පිළිබඳ තොරතුරු ලබා ගත් අතර එහි ප්‍රතිඵල වාර්තා කර ඇත.

**(ii)** 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ ලෝක ශ්‍රේණිගත කිරීමේ ස්ථානය වයඹ විශ්වවිද්‍යාලයේ පහළ බැස තිබුණ ද ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ දී විශ්වවිද්‍යාලයේ අගය 2016 වර්ෂයට වඩා 2017 වර්ෂයේ වර්ධනය වී ඇත. ලෝක ශ්‍රේණිගත කිරීම්වල දී විශ්වවිද්‍යාලය විසින් සිදුකරන පර්යේෂණ, ප්‍රකාශන, පර්යේෂණ සමුළුවල තොරතුරු සලකා බලන බැවින් වයඹ විශ්වවිද්‍යාලයට හිමි ස්ථානය වර්ධනය කර ගැනීම සඳහා 2018 වර්ෂයේ දී පර්යේෂණ සමුළු කිහිපයක් පවත්වා ඇති අතර ඉදිරියේ දී ද එවන් සමුළු පැවැත්වීමට නියමිත ය.

**(iii)** <u>**පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**</u>

මෙම පීඨයේ උපාධිධාරීන් පෝෂණවේදීන් වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාශයට බඳවා ගැනීම පිළිබඳව ගිවිසුමක් හෝ වෙනත් එකඟතාවයක් ඇතිකරගෙන නොමැති බව සඳහන් කරන අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණවේදීන්ගේ ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම එම අමාත්‍යාශයේ අභිමතය පරිදි සිදුකරන බව දන්වනු කැමැත්තෙමි.

**4.2** <u>**කළමනාකරණ ක්‍රියාකාරකම්**</u>

**(අ)** විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙක සඳහාම ස්ථිර වෛද්‍යවරයෙකු බඳවා ගැනීමට දීර්ඝ කාලයක සිට පුවත්පත් මගින් අයදුම්පත් කැඳවන ලදී. නමුත් නිසි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් නොලැබෙන බැවින් ස්ථිර වෛද්‍යවරයකු බඳවා ගැනීමට නොහැකි වී ඇත.

ශිෂ්‍යයන්ගේ සහ සේවක ප්‍රජාවගේ සෞඛ්‍ය සුබසාධනය සඳහා පිහිටුවා ඇති වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවය සඳහා වෛද්‍යවරයකුගේ සේවය අත්‍යවශ්‍ය බැවින් ස්ථිර වෛද්‍යවරයකු බඳවා ගැනීමට නොහැකි වුවද, එය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා බාහිර වෛද්‍යවරයකුගේ සේවය ලබාගෙන ඇත.

මේ වන විට නැවතත් පුවත්පත් දැන්වීම් මගින් ස්ථිර වෛද්‍යවරයකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා බඳවා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

**(ආ)** කුලියාපිටිය පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන අංක 2874770 දරන බැංකු ගිණුමට අදාළව 2017/12/31 දිනට හඳුනා නොගත් සෘජු ලැබීම් රු: 727,500 ක් වූ අතර මෙම මුදලින් රු: 618,000.00 ක් පමණක් හඳුනාගෙන ඇත. ඉතිරි මුදල හඳුනා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

**(ඇ)** රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වටිනාකමක් ලබාගෙන කුඹුරු ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අයදුම්පතක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

මගින් ඉඩම් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා ගොවීන්ගේ කැමැත්ත ලබා ගන්නා ලදී. මෙම පවරා ගැනීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ එකඟත්වය ද ලබාගෙන ඇත. එමෙන්ම, කුඹුරු ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ මේ සඳහා 2013/04/18 දින අත්තිකාරම් මුදලක් ලෙස රු: 1,013,750.00 ක් වයඹ විශ්වවිද්‍යාලය විසින් පන්නල ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර ඇත. මෙම ඉඩම් කැබලි 08 පවරා ගැනීම සම්බන්ධව ආයතනිකව හා නෛතික වශයෙන් කටයුතු කිරීමට හැකියාව සහ බලතල ඇත්තේ පන්නල ප්‍රාදේශීය ලේකම්වරයාට ය. මේ වන විට ඔහු විසින් පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරමින් සිටී.

**(ඈ)** ඉඩම් අත්පත් කරගැනීමේ පනතට අනුව ප්‍රාදේශීය ලේකම් (කුලියාපිටිය-බටහිර) විසින් හිමිකම් පරීක්ෂණයක් සිදුකරන ලද අතර ඉඩම අත්පත්කර ගැනීම වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාවට අනුව ඉඩම් හිමිකරුවන් වෙත ගෙවිය යුතු වන්දි මුදල් ගෙවන ලෙස දන්වන ලදී. මේ සඳහා ප්‍රතිපාදන වෙන්කර දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2018/07/31 ලිපිය මගින් ඉල්ලීමක් කර ඇත. මෙම මුදල තැන්පත් කළ වහාම අදාළ ඉඩමේ හිමිකරු නශ්චය කරගැනීම සඳහා අදාළ ලේඛණ නීතිපති දෙපාර්තමේන්තුව හරහා කුලියාපිටිය දිසා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව ප්‍රාදේශීය ලේකම් (කුලියාපිටිය-බටහිර) වැඩිදුරටත් දන්වා ඇත.

**(ඉ)** පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ එකඟතාවය මත ලුණුවිල, බණ්ඩිරිප්පුව පොල් පර්යේෂණ ආයතනයට අයත් මාකඳුර වත්ත නැමැති ඉඩමෙන් අක්කර 05 ක භූමි භාගයක් එහි සංවර්ධන වියදම් ගෙවා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය නේවාසිකාගාර, කාර්යය මණ්ඩල නේවාසිකාගාර හා ආපනශාලා ඉදිකිරීම සඳහා ලබා ගන්නා ලදී. ඉන් පසුව මෙම ඉඩම නීත්‍යානුකූලව විශ්වවිද්‍යාලයට පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් අප විසින් දන්වා සිටින ලදී.

ඒ අනුව, මෙම ඉඩම දැනටමත් රජයට පවරාගෙන ඇති බැවින් නැවත පවරාගැනීමක් අවශ්‍ය නොවන බවත් අරමුණ වෙනස් කිරීම පමණක් කළ යුතු බවත් ඉඩම් අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ඉඩම් අත්පත්) විසින් 2017/02/21 දින දුරකථනයෙන් දන්වන ලදී. ඒ අනුව, අපගේ 2017/02/27 දිනැති ලිපියට අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාශය විසින් අදාළ ආකෘති පත්‍ර නැවත ඉඩම් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

මේ පිළිබඳව ඉඩම් අමාත්‍යාංශයෙන් විමසීමක් කරන ලද අතර, ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 04-3/9/02 හා 2017/02/02 දිනැති ලිපියට අනුව අත්කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා වැයවන පරිපාලන වියදම් ගෙවීම සඳහා ඉඩමේ දළ තක්සේරු වටිනාකමින් 25% ක් වූ මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කරන ලෙස සහකාර අධ්‍යක්ෂ (ඉඩම් අත්පත්) විසින් 2017/11/28 දින දුරකථනය මගින් දන්වන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් 2018/05/30 වන දින ඉඩම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉඩම් අත්පත්) සමඟ පැවති සාකච්ඡාවට අනුව මෙම ඉඩමේ සංවර්ධන කටයුතු වෙනුවෙන් පොල් පර්යේෂණ ආයතනය වෙත වයඹ විශ්වවිද්‍යාලය විසින් ගෙවන ලද රු: මිලියන 10 ක මුදල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාවට පදනම් වී ඇත්තේ ඉඩමේ වටිනාකම ද එවකට සිදුකර ඇති

සංවර්ධන කටයුතුවල වටිනාකම ද නැතහොත් ඒ දෙකම ද යන්න පරීක්ෂා කිරීමට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව, 2018/08/17 වන දින තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. එම සාකච්ඡාවට අනුව වයඹ විශ්වවිද්‍යාලය විසින් ගෙවන ලද රු: මිලියන 10 ක මුදල ඉඩමේ වටිනාකම සහ සංවර්ධන වටිනාකම ද ඇතුළත් වූ වාණිජ වටිනාකම බව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තහවුරු කරන ලදී.

**(ඊ)** **එම්.ආර්.එන්. කුමාරි මහත්මිය**

2014-2016 සඳහා වූ මැයගේ අවසන් පර්යේෂණ වාර්තාව 2018/10/09 දින පැවති 76 වන සනාථන සහා පර්යේෂණ හා උසස් උපාධි කමිටුව විසින් අනුමත කරන ලදී.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

**(අ), (ආ), (ඇ)**

**අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

අනධ්‍යයන සේවකයින් ස්ථාන මාරුවීම්, සේවය හැර යාම්, වෙනත් තනතුරු වලට පත්වීම් ලබාගැනීම් හා විශ්‍රාම යාම් ආදී කාරණා හේතුවෙන් ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 974 ප්‍රකාරව නැවත වරක් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුව ඇති අතර විශ්වවිද්‍යාලාන්තර ස්ථාන මාරුවීම් කැඳවීම, අභ්‍යන්තර අයදුම්පත් කැඳවීම හා බාහිර අයදුම්පත් කැඳවීම යන පිළිවෙලින් ගන්නා ක්‍රියාමාර්ග ඔස්සේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය. මේ සඳහා යම් කාල සීමාවක් ගතවන අතර චක්‍රලේඛ අංක 876 යටතේ ඇති තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නාම ලේඛණ සකස්කර එවීමේ දී ඇතිවන ප්‍රමාදය ද පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලියේ වේගවත්බව කෙරෙහි බලපෑමක් ඇති කරයි. 2017 වර්ෂයේ අවසාන මාස දෙක තුළ දී පළාත් පාලන මැතිවරණය නිසා බඳවා ගැනීමේ ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවා තිබීමෙන් පසු ඒ සමඟම උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරුන් වෙනස්වීමේ දී පැවති නාම ලේඛණ අවලංගු කිරීම හේතුවෙන් ද අවසානය දක්වා පැමිණ තිබූ බඳවා ගැනීමේ ක්‍රියාවලිය අත්හැර දමා නැවත මුල සිට පටන් ගැනීමට සිදුවීම හේතුවෙන් ද මෙම ප්‍රමාදය ඇති වී ඇත.

අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමේ දී ප්‍රථමයෙන් අභ්‍යන්තර අයදුම්පත් කැඳවීම සිදුකෙරෙන අතර ඒ සඳහා අයදුම්කරන්නේ විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයේම ඊට පහළ ශ්‍රේණිවල තනතුරු දරන්නන් වේ. ඔවුන් එම තනතුරු සඳහා පත්වීම් ලබාගතහොත් නැවත වතාවක් ඔවුන් කලින් දරූ තනතුරු පුරප්පාඩු බවට පත්වේ. නැවත එම තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා ඉහතින් සඳහන් කළ පුරප්පාඩු පිරවීමේ අනුමැතිය ලබාගැනීමෙන් පටන්ගෙන ක්‍රියා කළ යුතු වේ. එබැවින්, අනධ්‍යයන පරිපාලනමය නොවන තනතුරු සම්බන්ධයෙන් සෑම අවස්ථාවකදී ම යම් පුරප්පාඩු සංඛ්‍යාවක් පෙන්නුම් කරන අතර එකවර සියළු පුරප්පාඩු සම්පූර්ණ කර අවසන් කළ නොහැක. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය අළුතින්ම ආරම්භ කරන බැවින් හා ඒ සඳහා තාක්ෂණික ගණයේ හෝ විද්‍යාගාර කටයුතු පිළිබඳ දැනුමක් ඇති සේවකභවතුන් අප සතුව නොමැතිවීම නිසා එම පීඨයට අනුමතව ඇති අනධ්‍යයන පරිපාලනමය නොවන තනතුරු අතරින් තාක්ෂණ නිලධාරීන්, විද්‍යාගාර සහායක හා පශ්චාත් මරණ කම්කරු යන තනතුරු සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි

දැනුම ඇති පුද්ගලයන්ම බඳවා ගත යුතු බවට විශ්වවිද්‍යාල පාලක සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව පාලක සභාවේ නිර්දේශය පරිදි එම තනතුරු සඳහා සාමාන්‍ය ක්‍රමවේදයෙන් පරිබාහිරව විවෘත පුවත්පත් දැන්වීම් පළ කිරීම මගින් සුදුස්සන් බඳවා ගැනීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉල්ලීම් යොමුකරන ලදී. එහෙත් එම ඉල්ලීමට පිළිතුරු වශයෙන් අමාත්‍යාංශය විසින් දන්වා ඇත්තේ ඒ සඳහා අනුමැතිය ලබාදිය නොහැකි බවයි. ඒ අනුව, එම තනතුරු සඳහා බඳවා ගැනීමේ සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ආරම්භකර ඇති අතර මේ වන විට අභ්‍යන්තර බඳවා ගැනීම් අවසන් කර බාහිර බඳවා ගැනීම් සඳහා ලැබී ඇති අමාත්‍යාංශ නාම ලේඛණ අනුව බඳවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

2017/12/31 දිනට පැවති අනධ්‍යයන පරිපානමය නොවන තනතුරුවල 111 ක් වන පුරප්පාඩු සංඛ්‍යාවෙන් 28 ක් පමණ 2018 වර්ෂයේ පළමු මාස තුන ඇතුළත පුරවා ඇති අතර තවත් තනතුරු 40 ක් පමණ අභ්‍යන්තර බඳවාගැනීම් මගින් මේ වන විට පුරවා ඇත.

කෙසේ වෙතත් තාක්ෂණ පීඨය හා අනිකුත් අංශ සඳහා 2018 වර්ෂයේ දී අනුමත වූ නව තනතුරු ද ඇතුළත්ව අනධ්‍යයන පරිපානලමය නොවන පුරප්පාඩු සියල්ල පිරවීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින අතර 2018 වර්ෂය අවසානය වන විට පෙර මෙම පුරප්පාඩුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පුරවා ඇත.

<u>අධ්‍යයන කාර්යය මණ්ඩලය</u>

2018/06/30 වන විට මෙම විශ්වවිද්‍යාලය සඳහා අනුමත අධ්‍යයන කාර්යය මණ්ඩලය 229 ක් වන අතර එදිනට තත්‍ය කාර්යය මණ්ඩලය 174 කි. පුරප්පාඩු ගණන **55** ක් වේ. මේ වන විට මෙම පුරප්පාඩු පිරවීමට පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා ඇත. ඒ අනුව, ඉදිරියේ දී මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

වෛද්‍ය පීඨය සඳහා අවශ්‍ය අධ්‍යයන අංශ 03 ක් සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, පුවත්පත් දැන්වීම් පළ කර මේ වන විට තුන් දෙනෙකු සේවයට බඳවා ගැනීමට කටයුතු කර ඇත. සෙසු පුරප්පාඩු සඳහා නැවත පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවා ඇත. මෙම පීඨයට අවශ්‍ය තවත් අධ්‍යයන අංශ 13 ක් සඳහා අවශ්‍ය අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ලිපි ඉදිරිපත් කර ඇත.

**(ඈ)** මේ වන විට තාක්ෂණ පීඨයට අදාලව අධ්‍යයන වර්ෂ 02 ක් සඳහා සිසුන් බඳවාගෙන ඇත. 2017.06.28 දිනැති ලිපිය මගින් පීඨය සඳහා ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය (Senior Lecturer/ Lecturer) වශයෙන් 18 ක් සහ තාවකාලික අධ්‍යයන සහායක කාර්මණ්ඩලය (Temporary Instructur/Demonstrator) වශයෙන් 09 ක් පීඨය සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. තවද, පීඨය සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වර්ෂයක් පාසා ඉහළ යෑම හේතුවෙන් පීඨය සඳහා වෙන් කරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රමාණය වැඩි කරවා දෙන ලෙස 2018.07.24 දිනැති ලිපිය මගින් ඉල්ලීම් කර ඇත. එහිදී පීඨය සඳහා සම්පූර්ණ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය (Senior Lecturer/ Lecturer) වශයෙන් 32 ක් සහ තාවකාලික අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය (Temporary Instructor/ Demonstrator) වශයෙන් 18 ක්

ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර ඒ සඳහා පාලකසභා අනුමැතිය ද ලබා දී ඇත.

කෙසේවෙතත්, මේ වන විට තාක්‍ෂණ පීඨයට මුලින් අනුමත වී ඇති අධ්‍යයන කාර්යය මණ්ඩලය 10 දෙනෙකු බඳවාගෙන ඇති අතර සෙසු අධ්‍යයන අංශ සඳහා ද තනතුරු තීරණය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව මේ වන විට එම තනතුරු සඳහා ද පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවා ඇත.

## 4.4 නිශ්ක්‍රීය වත්කම්

**(අ)** අංක 54-1785 දරණ වෑන් රථය අළුත්වැඩියා කර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ ජංගම බහුමාධ්‍ය රථයක් ලෙස භාවිතයට ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

**(ආ)** මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානයේ II අදියරයේ ඉදිකිරීම් 2014 ජනවාරි 17 සිට 2014 අගෝස්තු 10 දක්වා වූ කොන්ත්‍රාත් කාලයකට ගිවිසුම්ගත වී තිබූ අතර එහි වැඩකටයුතු නිම නොකිරීම නිසා 2016 ජූලි දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. එසේ කොන්ත්‍රාත් කාළය දීර්ඝ කළත් 2015 නොවැම්බර් මස සිට අදාළ කොන්ත්‍රාත් සමාගම විසින් ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි.

වඩාත් කාර්යක්ෂම හා ඵලදායි වෛද්‍ය ප්‍රතිකාර සේවාවක් ලබා දීමේ අරමුණින් 2015 වර්ෂය සඳහා මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානයට වෙන් කළ මුදලින් එවකට මාකඳුර පරිශ්‍රයේ රාජකාරී කළ නියෝජ්‍ය ලේඛකාධිකාරීගේ උපදෙස් පරිදි වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවය කළ වෛද්‍ය නිලධාරිතුමිය විසින් කුලියාපිටිය සැපයුම් අංශය වෙතින් 2015.05.13 දින දී භාණ්ඩ හා උපකරණ ඉල්ලුම් කර ඇති අතර ඒ වන විට ද මෙම වෛද්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පැවතී ඇත.

එසේ ඉල්ලුම් කළ භාණ්ඩ හා උපකරණ මෙම වෛද්‍ය මධ්‍යස්ථානය වෙත ලැබීමේ දී ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් නොකිරීම නිසාත්, ගබඩා කිරීමට ගබඩා පහසුකම් නොමැති නිසාත් වර්ෂ 02 කට වැඩි කාළයක් තිස්සේ වෛද්‍ය නිලධාරි නිල කාමරයේ හා රෝගී වාට්ටුව තුළ තාවකාලිකව අදාළ භාණ්ඩ හා උපකරණ ගබඩා කර ඇත. මේ වන විට අදාළ භාණ්ඩ හා උපකරණ වලින් වැඩි කොටසක් භාවිතයට ගෙන ඇත.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

නිරීක්ෂණයන් හා එකඟ වේ.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

**(අ)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ වන විට වයඹ විශ්වවිද්‍යාලය සඳහා සහකාර අභ්‍යන්තර විගණක නිලධාරියකු පත් කර ඇති අතර විශ්වවිද්‍යාලය විසින් මේ වන විට විගණන සහකාරවරුන් තිදෙනෙකු ද බඳවාගෙන ඇත.

**(ආ)** 2018 වර්ෂයේ දී ශිෂ්‍ය ඉගැන්වීම් කටයුතු සඳහා කථිකාචාර්යවරුන් යෙදවීම පිළිබඳ පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ. 2018 වර්ෂයේ සිට කොන්ත්‍රාත් ගෙවීම්වලට අදාල සියළු වවුචර් විගණන අංශය විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගෙවීම් කරනු ලැබේ.

### 6.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

**(අ)** වටිනාකම රු. 68,661,154.00 ක් වූ කර්මාණ්ත 16 කින් ව්‍යාපෘති 15 ක වැඩ අවසන් කර විශ්වවිද්‍යාලයට බාර දී ඇතත් අවසාන බිල්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොමැති බැවින් මෙසේ මූල්‍ය ප්‍රගතියක් නොදක්වා තිබුණි.

මෙහි සඳහන් තවමත් වැඩ අවසන් කර නොමැති Health Center Stage II සඳහා ද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) මැදිහත්ව 2018 වර්ෂයේ දී වැඩ අවසන් කිරීමට කටයුතු කළ ද, අපේක්ෂිත අයුරින් එය සිදු නොවූ බැවින් කොන්ත්‍රාත්තුව අවලංගු කර නව කොන්ත්‍රාත්තුවක් ලෙස අවසන් කරනු ලැබේ.

**(ආ)** මේ පිළිබඳ සොයා බලා නිම කරන ලද වැඩ වටිනාකම් අදාල වත්කම් ගිණුම්වලට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** **ව්‍යවහාරිකවිද්‍යා පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම**

**(i)** පහත සඳහන් කරුණු මත නියමිත කාල වකවානුව තුල දී මුදල් කළමනාකරණය කර ගැනීමට නොහැකි විය.

- අවස්ථා 02 කදී මාස 09 ක කාලය දීර්ඝ කිරීම් ලබා දීමට සිදු වීම නිසා ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂය අවසානය දක්වා ප්‍රමාද වීම.
- වාර්ෂිකව ලැබූ ප්‍රතිපාදන එක් එක් ව්‍යාපෘති සඳහා වෙන් කිරීමේ දී මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා වූ කාර්ය පූර්ව අත්තිකරම් (Mobilization Advance) මුදල අවස්ථා කීපයකින් ගෙවීමට සිදු වීම.
- අන්තර් බිල්පත් ප්‍රමාදව ගෙවීම
- 2014-2016 කාලය තුල මූල්‍ය කළමණාකාරිත්වය තිබුණත් මෙම ඉදිකිරීමට අදාල මුදල් සඳහා ප්‍රතිපාදන ඉහත කරුණු මත ප්‍රමාණවත් නොවීම.
- මුදල් භාණ්ඩාගාරයෙන් නිදහස් කිරීම ප්‍රමාද වීම.

**(ii)** මෙම ලිපිය නිසියාකාරව සන්නිවේදනය නොවීම තුළින් ලිපියට අනුව කටයුතු කළ නොහැකිව තිබුණි.

එනමුත්, කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් ගිවිසුමේ කොන්දේසි 16.1, 8.4 (අ) හි සඳහන් ප්‍රතිපාදන අනුව කොන්ත්‍රාත්කරුට හිමිකම් කිව හැකි කරුණු මත පමණක් ගිවිසුමේ සඳහන් පරිදි සේවාදායකයා වන උපකුලපති විසින් දින දීර්ඝය ලබා දී තිබුණි.

කෙසේවෙතත්, වර්තමානයේ දී එම ලිපියේ උපදෙස් දැඩි ලෙස පිළිපදිමින් ව්‍යාපෘති කාල දිගුවන් ලබාදෙන බව කාරුණිකව දන්වමි.

**(iii)** මෙහිදී 100% මට්ටමේ තිබූ වැඩ 90% ක් පමණ ද 5% තරම් අඩු මට්ටමේ නොතිබුණ ද අඩු ප්‍රතිශතවලින් තිබූ වැඩ සුළු ප්‍රමාණයක් ද තිබීම නිසා සහ ඉතා ඉක්මනින් එම වැඩ සියල්ල 100% බවට පත්වන බව නිගමනය කළ හැකිව තිබූ බැවින් ව්‍යාපෘති ඉංජිනේරු බලතල අනුව බිල්පත් නිදහස් කොට ඇත.

**(iv)** මෙම ව්‍යාපෘතිය අවසන් කර බාර දීමට ප්‍රථම වෙනත් ආයතනයකට AC සහ Network කටයුතු කර අවසන් කිරීමට ඉඩ සලසා දිය යුතුව තිබුණි.

එබැවින් අවසාන නිම කිරීම සිදු කිරීමට හැකියාව ඇතත් ඉහත වෙනත් ආයතන මගින් කරන කාර්යයයන්හි දී නැවත ගොඩනැගිල්ලට හානි විය හැකි බැවින් වඩාත්ම සුදුසුම ක්‍රියාමාර්ගය වන්නේ ඉහත AC සහ Network කටයුතු කර අවසන් කිරීමෙන් පසුව කොන්ත්‍රාත්තුවේ අවසාන නිම කිරීම් සිදු කිරීම බව 2016 සැප්තැම්බර් මාසයේ දී පැවති රැස්වීමේ දී තීරණය වීමෙන් පසුව ඒ පිළිබඳව කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දී ඇත.

ගිවිසුමේ කොන්දේසි අංක 8.8 අනුව ඕනෑම අවස්ථාවක ඉංජිනේරු හට ඉදිකිරීමේ කොටසක් හෝ සම්පූර්ණ ඉදිකිරීම අත් හිටුවන ලෙස උපදෙස් ලබා දිය හැකිය.

කොන්දේසි අංක 8.8 අනුව ඉදිකිරීම් ප්‍රමාදය සිදුවුවහොත් සහ එම කරුණ නිසා වියදම් දැරීමට සිදු වුවහොත්,

a) කොන්ත්‍රාත්කරු එම ප්‍රමාදය සඳහා කාල දිගුවකට හිමිකම් ලබන අතර
b) යම් වියදමක් සඳහා ගෙවීම ද සිදු විය හැකිය.

එලෙසම අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමටත් පෙර රජයේ කඩිනම් තීරණයකට අනුව බඳවා ගන්නා ලද තාක්ෂණික විද්‍යාපීඨ සිසුන් හට පහසුකම් සැලසීමේ ගැටළුවකට ද විශ්වවිද්‍යාලයට මුහුණ පෑමට සිදු විය. එබැවින් ඊට විසඳුමක් වශයෙන් ඒ වන විට ප්‍රායෝගිකව භාවිතයට ගත හැකි වන සේ වැඩ අවසන්ව තිබූ ගොඩනැගිල්ල 2017 පෙබරවාරි මාසයේ විවෘත කර තාක්ෂණික පීඨ සිසුන්ගේ භාවිතය සඳහා යොදා ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කරන ලදී. ඊට පෙර 2016 සැප්තැම්බර් මස සිට විවිධ කොටස් බාරගෙන ඇත.

කොන්දේසි 10.2 අනුව සේවාදායකයා ඉදිකිරීමේ යම් කොටසක් බාර ගැනීමේ සහතිකය (Handing over certificate) නිකුත් කිරීමට ප්‍රථම භාවිතා කරයිනම්

a) භාවිතා කිරීමට බාර ගත් දිනයේ සිට එම ඉදිකරන කොටස බාරගත් ලෙස සැලකේ.

එම කරුණු අනුව ගිවිසුම් ප්‍රකාරව Suspention & partial handover සිදුව ඇත. ඉහත දී ඇති වූ Suspention & partial handover සේවාදායකයාගේ අවශ්‍යතාවය මත සිදු වූ බැවින් දඩ අය කිරීම පිළිබඳව ගැටළුවක් පැවතුන අතර මෙම කාලය තුළ ව්‍යාපෘති උපදේශක කණ්ඩායම සහ ව්‍යාපෘති ඉංජිනේරු විසින් ගිවිසුම් ප්‍රකාරව නිකුත් කළ බිල්පත සඳහා විශ්වවිද්‍යාලය විසින් කොටස් මුදලක් පමණක් ගෙවන ලදී. මෙසේ ව්‍යාපෘති ඉංජිනේරු විසින් ඉදිරිපත් කරන ලද බිල් සඳහා කොටස් මුදලක් ගෙවීම විශ්වවිද්‍යාලයේ අනුමත වූ ක්‍රියා පිළිවෙළක් ලෙස වර්තමානයේදී ද සිදු කරනු ලැබේ.

කෙසේ වුව ද, මෙම කරුණ සම්බන්ධව තීරණයක් ගැනීමට බේරුම්කරණයකට Arbitration යොමු කර ඇති අතර, විගණනය විසින් පෙන්වා දෙන පරිදි, යම් මුදලක් අය කර ගත යුතු වේනම් ඒ සඳහා රු. 31,501,056 ක මුදලක් මෙම කොන්ත්‍රාත්කරු වෙත පසුගිය වර්ෂවල ගෙවිය යුතු වන මුදලින් රඳවාගෙන ඇති අතර ඒ සඳහා කොන්ත්‍රාත්කරු විසින් එකඟතාවය ප්‍රකාශ කර ඇත.

**(v)** මෙහිදී වර්තමානයේ ජාල දත්ත සම්ප්‍රේෂණය සඳහා ප්‍රකාශ විද්‍යුත් රැහැන් භාවිතා කරන අතර ඒවා ඇදීමේ දී හා නැවීමේ දී හානි සිදුවන වීදුරු මාධ්‍ය රැහැන් නිසා කොන්ක්‍රීට් ස්ලැබ් ඇතුළත ඇදීම මඟින් ස්ථාපිත කළ නොහැක. එබැවින් ඒ සඳහා සකසන ලද බට පද්ධතිය ප්‍රයෝජනයට ගත නොහැකි නිසා එම කොටස පමණක් අත්හැරීමට සිදුවිය. එහෙත් මහල් 04 ටම සාදා තිබූ ප්‍රධාන රැහැන් ගෙනයන Duct හා පැනල් කුටිය ප්‍රයෝජනයට ගෙන ඇත. සාපේක්ෂව ගත්කල කොන්ක්‍රීට් ස්ලැබ් ඇතුළත දැමූ කොන්ඩියුට් බට යනු කුඩා කොටසක් බැවින් එහි වටිනාකම ඉතා අඩු වන අතර කොන්ත්‍රාත්කරු විසින් ඉටුකරන ලද ප්‍රයෝජනයට ගත් කොටස ඉතා වැඩි වටිනාකමකින් යුක්ත වේ. එබැවින් එය නිශ්කාර්ය වියදමක් ලෙස සැලකිය නොහැකි ය.

**(vi)** අදාළ පාඨමාලාවේ සිසුන් ඉතා ඉක්මනින් බඳවාගෙන ඉගැන්වීමේ කටයුතු කළ යුතු වූ බැවින් ඇතැම් කාර්යයන් විශ්වවිද්‍යාලය මඟින්ම ප්‍රමාද කිරීමට සිදු වුව ද එකී කාර්යයන්ට අදාළ ද්‍රව්‍ය ඒ වන විටත් කොන්ත්‍රාත්කරු විසින් වැඩබිමට ගෙන්වා තිබූ පසුබිමක ඉක්මනින් එම කාර්යය කෙරෙන බවට සෑහීමට පත්වීම තුළ ව්‍යාපෘති ඉංජිනේරුවරයාගේ බලතල අනුව ගෙවීම් කිරීම නිර්දේශ කර ඇත.

**(vii)** 3mm ඝණකම සහිත පාටිෂන් බෝඩ් යෙදිය යුතු බවට අදාළ කොන්ත්‍රාත්තුවේ කිසිදු තැනක සඳහනක් නැත.

**(viii)** මෙම කොන්ත්‍රාත්තුවේ විෂය අංක 38 හි සඳහන් Rain water Disposal System සම්පූර්ණ කර ඇත.

## 6.4 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>

**(අ)** මෙම කොන්ත්‍රාත්කරු සමග පැවති ගිවිසුම අවලංගු කිරීමට දැනුම් දුන් පූර්ව නිවේදනයට කොන්ත්‍රාත්කරු හේතු දක්වමින් විරෝධතාවය ප්‍රකාශ කළ බැවින් ඉදිරි කාලය සඳහා කොන්ත්‍රාත්කරුට එරෙහිව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට (CIDA) පැමිණිලි

කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරන ලදී. එහිදී CIDA ආයතනය මැදිහත්ව කොන්ත්‍රාත්කරු සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යය නිම කිරීමට කටයුතු කරන ලදී. එම අවබෝධතා ගිවිසුම අනුව මාස 03 ක් තුළ මෙම කාර්යය අවසන් කර විශ්වවිද්‍යාලයට බාර දී එහි ප්‍රගතිය පිළිබඳව CIDA ආයතනයට දැනුම් දෙන ලෙස එම ආයතනය දැන්වීය.

එනමුත්, එම කාර්යය නියමිත දින වූ 2018 නොවැම්බර් 06 දිනට අවසන් කිරීමට කටයුතු කිරීම හෝ විශ්වවිද්‍යාලය ගිවිසුමේ කොන්දේසි ඉටු කළ ද, කොන්ත්‍රාත්කරු ඉටු නොකිරීම පිළිබඳව CIDA ආයතනයට විශ්වවිද්‍යාලය විසින් දැනුම් දී ඇත. ඒ අනුව, CIDA ආයතනය කොන්ත්‍රාත්කරුට විරුද්ධව කටයුතු කරනු ලබන අතර මෙම තත්වය නිසා වර්ථමානයේ දී විශ්වවිද්‍යාලයට මෙම කොන්ත්‍රාත්තුව බාධාවකින් තොරව අවලංගු කිරීමට කටයුතු කළ හැකි ය. ඉන් අනතුරුව පවතින සුළු නිමකිරීම් විශ්වවිද්‍යාලය මගින් හෝ වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු මගින් ඉටු කර ගත හැකි ය.

**(ආ)** 2018 වර්ෂය තුල මෙම ඉදිකිරීම අවසන් කර ඇත.

## 6.5 අයවැය පාලනය

**අභ්‍යන්තර මාර්ග – මාකඳුර රු. 155,612.00**
**කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය – රු. 372,566.00**

2019 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කර මෙම බැරකම් පියවීමට කටයුතු කරනු ලැබේ.

**ක්‍රීඩාංගනය වැඩි දියුණු කිරීම – රු. 2,100,086.00**
මෙම ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේ සිදු වූ අනපේක්ෂිත වියදම් හේතුවෙන් 2016 සඳහා ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුණි. ඉදිරි වර්ෂයේ ප්‍රතිපාදන වලින් පියවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**කාය වර්ධන ගොඩනැගිල්ල – කුලියාපිටිය රු. 49,653,892.00**
මෙම ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලට වඩා රු. මිලියන 40 ක් ගෙවා තිබූ අතර එම මුදල 2017 වර්ෂයේ ප්‍රතිපාදන වලින් පියවාගෙන ඇත.

## 6.6 නොවිසඳී ඇති විගණන ඡේද

**(අ)** මෙහි සඳහන් කථිකාචාර්යවරුන් දෙදෙනාගෙන් අයවීමට ඇති හිඟ මුදල් අයකර ගැනීමට තවදුරටත් කටයුතු කරමින් සිටී. මින් එක් අයෙකු වන එච්.පී.වී. රූපසිංහ මහතාට විරුද්ධව නීතිපති දෙපාර්තමේන්තුව හරහා නඩුවක් පවරා ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

ආර්.එම්.ඩබ්.එස්. රත්නායක මහතාගෙන් අයවීමට ඇති මුදල ඔහුට හිමි අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට අදාළ අයදුම්පත හා ලිපි ඔහුගේ නිතීඥ මහතා හරහා නැවතත් ඔහු වෙත යවා ඇත.

**(ආ)** බාහිර පාඨමාලා අධ්‍යක්ෂවරුන් දැනුම් දුන් පසු නිශ්චිතවම අවසන් කරන ලද පාඨමාලාවල අතිරික්ත මුදල් Programme Development Fund ගිණුමට මාරු කිරීමටත් එම ගිණුම්වල එකතුව විශ්වවිද්‍යාල අරමුදල ලෙස පවත්වා ගැනීමටත් 2018.10.05 දින පැවති 64 වන විගණන කමිටුවේ දී තීරණය කරන ලදී.

## 06. <u>පද්ධති හා පාලනයන්</u>

### <u>පද්ධති හා පාලන ක්ෂේත්‍ර</u>

**(අ) ස්ථාවර වත්කම් පරිපාලනය**

ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යනු ලැබේ.

**(ආ) කොන්ත්‍රාත් පරිපාලනය**

මෙම කරුණ සම්බන්ධව අවධානය යොමු කර අවශ්‍ය සම්පත් යොදවා කඩිනම් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ) මෙහෙයුම් පාලනය**

**<u>කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය</u>**

කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සඳහා බඳවාගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවාගනු ලැබුව ද යම් යම් පෞද්ගලික හේතු මත පළමු සමාසිකය තුළදීම විශ්වවිද්‍යාලය හැරයාම සිදු වේ. (උදාහරණ ලෙස සෞඛ්‍ය සේවයේ පවතින හෙද නිලධාරී පාඨමාලාවට සම්බන්ධ වීම, විදේශගත වීම, නව රැකියා ආරම්භ කිරීම වැනි හේතු බලපානු ලැබේ.)

**<u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>**

ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා නව අධ්‍යයන වර්ෂයක් වෙනුවෙන් නවක සිසුන් බඳවා ගැනීමේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දන්වා එවනු ලබන සම්පූර්ණ සිසුන් සංඛ්‍යාවම පීඨය සඳහා බඳවා ගැනීමේ අරමුණින් පළමුවෙන්ම බඳවා ගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාවටත් වඩා වැඩිපුර සිසුන් සඛ්‍යාවකගේ නම් ලැයිස්තුන් පීඨය සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම් කරනු ලබයි.

එලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නම් ලැයිස්තුවල සඳහන් සියලුම සිසුන් ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ලියාපදිංචි කර ගැනීමට කටයුතු කරනු ලබයි. කෙසේවුවත්, එලෙස ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ලියාපදිංචි වන සිසුන් සමහරක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෙනත් විශ්වවිද්‍යාල සඳහා උසස් කර යැවීමේ දී ශිෂ්‍යයා විසින් එම මාරු වීම බාරගත යුතු බැවින්, සිසුන් වෙනත් විශ්වවිද්‍යාල කරා මාරු වී යෑම සිදු වේ.

එලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෙනත් විශ්වවිද්‍යාල සඳහා උසස් කර යවන ලද සිසුන් සමහරක් කිහිපවරක්ම ඉල්ලීම් කිරීමෙන් පසුව වයඹ විශ්වවිද්‍යාලය තුල රඳවා ගැනීමට සමත් වී ඇත.

මීට අමතරව නිරන්තරයෙන්ම පුරප්පාඩු පිරවීම යටතේ ශිෂ්‍ය නාම ලේඛණ ලබා දෙන ලෙසට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන අතර එලෙස ලැබෙන නාම ලේඛණ අතුරින් බහුතරයක් සිසුන් පීඨය වෙත බඳවා ගැනීමට ක්‍රියා කර ඇත.

කෙසේ වුව ද පීඨයේ අධ්‍යයන කටයුතු කාලසටහනකට අනුව සිදු කළ යුතු බැවින් සහ අධ්‍යයන කටයුතු ඇරඹීමෙන් පසු දිගින් දිගටම සිසුන් බඳවා ගැනීම අධ්‍යයන පාඨමාලාවේ ගුණාත්මකභාවයට මෙන්ම එම සිසුන් සඳහා ද අහිසි ආකාරයෙන් බලපෑම හේතුවෙන් පීඨය සඳහා සිසුන් බඳවා ගැනීම යම් නිශ්චිත කාලයක දී පමණක් සිදු කරයි. එමනිසා පුරප්පාඩු පිරවීම යටතේ කල් ගතවීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එවනු ලබන ශිෂ්‍ය නාම ලේඛණයන්ගේ සඳහන් සිසුන් සියල්ලම පීඨය වෙත ඇතුළත් කර ගැනීමට නොහැකි වේ.

කෙසේ වුව ද අදාළ අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාවම පීඨය වෙත බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවරයන් පීඨය විසින් අනුගමනය කර ඇත.

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

2017 වර්ෂය සඳහා බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 550 ක් වූ අතර ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 539 ක් වේ. බඳවා ගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දනුම් දී ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිසුන් තෝරා එවීම සිදුකරයි.

**පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

4.1.2 (අ) පිළිතුර අදාළ වේ.

**(ඈ) අයවැය පාලනය**

ඇස්තමේන්තු සකස් කරනුයේ පෙර වර්ෂවල සත්‍ය වියදම් හා ඉදිරි වර්ෂයේ සැලසුම් හා විවිධ උපකල්පන පදනම් කරගෙනය. සාර්ව ආර්ථික විචලතාවයන් මේ සඳහා හේතු වන අතර එබඳු විචලනයන් අවම කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.

**(ඉ) අභ්‍යන්තර විගණනය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ වන විට වයඹ විශ්වවිද්‍යාලය සඳහා සහකාර අභ්‍යන්තර විගණක නිලධාරිනියක පත් කර ඇති අතර විශ්වවිද්‍යාලය විසින් මේ වන විට විගණන සහකාරවරුන් තිදෙනෙකු ද බඳවාගෙන ඇත.

**මහාචාර්ය ඊ.එම්.පී. ඒකනායක**

**උපකුලපති**